ISSN 1391 - 1031
2017 අප්‍රේල්
23 වෙළුම 01 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"විවිධ රටවලදී එය (විප්ලවය) විවිධාකාරයෙන් වර්ධනය වෙයි. එය නිතරම දිගුකාලයක් තිස්සේ දුෂ්කරතාවන්ගෙන් යුතුව ගමන් කරයි. ධනපතීන් තමන්ගේ අයිතීන් එක් වරම අත්හරිතියි සිතන සමාජවාදියා නරකය. නැත. ලෝකය විසින් තවමත් එවැනි කරුණාබරිත ධනපතීන් බිහිකර නැත. සමාජවාදය වර්ධනය විය හැක්කේ ධනවාදය හා සමග කරන අරගලයෙන් පමණි. සටනින් තොරව යටත්වූ පාලක පංතියක් ලොව මෙතෙක් කවරදාකවත් පැවතී නොමැත."

**ලෙනින්**

## පර නොවන මල් නුඹය...

මහා ඝන වළාවක
හිරු සැඟව ගිය කලෙක
ඝන අඳුර පරදවා
මහ පොළොව එළිය කළ
මිනිසුන්ය ඔබ සැවොම...

වියළි නරුදක පොළොව
පැලි වළන් පැලෙන සඳ
වැස්සක්ව වැටෙන්නට
ජීවිතය මුදාහළ
මිනිසුන්ය ඔබ සැවොම...

කටු කොහොල් පිරි ගිය
කටු කම්බි අතුල බිම
දළු දමා පැන නැගුණු
පරනොවෙන මල් දරන
මිනිසුන්ය ඔබ සැවොම...

මහ රැජන රිසි පරිදි
'නිදහසක්' භුක්ති විඳි
ලෝකයට එරෙහි වී
ද්‍රෝහීන් වුණු නමුදු
විරුවන්ය ඔබ සැවොම
සදා සමරනු ලබන...



46වැනි
අප්‍රේල්
විරු සමරුව
වෙනුවෙනි...

# වරාය විකිණීම වහා නතර කළ යුතුයි

## ජ.වි.පෙ. ආණ්ඩුවට අවධාරණය කරයි

රනිල්-මෛත්‍රී ආණ්ඩුවේ ආර්ථික උපායමාර්ගය වී තිබෙන්නේද විකිණීම හා ණය ගැනීම බවත් හම්බන්තොට වරාය විකිණීම සඳහා ගිවිසුම් අත්සන් කරන්නට සූදානම් වන්නේ ඒ හේතුව නිසා බවත් පැවසූ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, පසුගිය මාර්තු 20වැනි දින ජනාධිපතිවරයා විසින් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ අනුව රජය මුහුණ පා ඇති විදෙස් මූල්‍ය ගැටලුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ නිර්දේශ අනුව ලංකාවේ සහ චීනයේ බලධාරීන් අතර එකඟතාවයන් මත හම්බන්තොට වරාය විකුණන බව සඳහන් කර ඇතැයි පෙන්වා දුන්නේය.

අනුර දිසානායක සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 29වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා, මෙම තත්වය තුළ ආණ්ඩුව ප්‍රකාශ කරන අක්කර 15,000 කර්මාන්ත ව්‍යාපෘති, ආර්ථික උපායමාර්ග කතා ව්‍යාජ කරුණු බවත් අයි.එම්.එෆ්. නිර්දේශ, විදේශ මුදල් අර්බුද හා දෙරටේ බලධාරින්ගේ එකඟතා අනුව විකිණීම සිදුවන බව පැහැදිලි බවත් කියා සිටියේය.

"හම්බන්තොට වරාය හදන්න ඩොලර් මිලියන 1350ක ණයක් ගත්තා. දැන් විකුණන්න ඇස්තමේන්තු කර තිබෙන්නේ ඩොලර් මිලියන 1100කටයි. ණය මුදලට ඇස්තමේන්තුව සරිලන්නේ නැහැ. කාලය අවුරුදු 99ක්. ඒ වගේම **02 වැනි පිටුවට**

## ජන බලයට තරුණ ජවය එක් කරමින්...









මහරගම - 2017.03.19

**05** පාලක පංතියේ...



ධනපති ක්‍රමය තුළ ධනපති පාලනය පවත්වාගෙන යාමේදී ප්‍රධාන ප්‍රතිවිරෝධය පවතින්නේ...

**09** කර්මාන්තවලට මළගම...



ගිනිකන්දක් නම් මේ අර්බුදය දැන් එය පුපුරා යාමට ආසන්න මට්ටමේ...

**11** දැනුම විකිණිය හැකිද?...



ධනවාදය බිහි වීමෙන් පසු ලෝකයේ එක් එක් නිර්මාණ බිහි කළ හෝ සොයාගත්...


| | |
|---|---|
| සංවාදය.......................... | 03 |
| තරුණ............................ | 04 |
| ආවර්ජනා........................ | 06 |
| විශේෂ............................ | 07 |
| ජාත්‍යන්තර...................... | 08 |
| කාන්තා.......................... | 10 |
| වේදිකාව......................... | 13 |
| විශේෂාංග....................... | 14 |


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# 'උන්ට නොදියයුතු අපේ මැයි දිනය' නමින් සම්මන්ත්‍රණයක්



"උන්ට නොදියයුතු අපේ මැයි දිනය" නමින් වෘත්තීය සමිති නියෝජිතයින් සම්බන්ධ වූ සම්මන්ත්‍රණයක් මාර්තු 17 වන දින ප.ව 1.00ට, කොළඹ කොටුව ලංකා බැංකු ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

මැයි දිනය එහි සැබෑ උරුමකරුවන් වන වැඩකරන ජනතාවගේ උදුරාගැනීමට කටයුතු කරමින් සිටින පාලකයින් අවසානයේ වැඩකරන ජනතාව රැවටීම සඳහාම මැයි දිනය යොදා ගනිමින් සිටින බවත් මැයි දිනයේ අයිතිය එහි සැබෑ අයිතිකරුවන් වන වැඩකරන ජනතාව වෙත සහ ඔවුන් නියෝජනය කරන සැබෑ වෘත්තීය සමිති ව්‍යාපාරය වෙත පවරාගත යුතු බවත් එහිදී ප්‍රධාන දේශනයට සහභාගි වූ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා පැවසීය.

එම අවස්ථාවට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක වසන්ත සමරසිංහ, ලංකා ගුරු සේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති ව්‍යාපාරයේ නායකයෝ රැසක් සහ සාමාජිකයෝ විශාල පිරිසක් සහභාගි වූහ.

# මුද්‍රණ සේවකයින්ගේ සංගමයේ 13වැනි සම්මේලනය මුළු දෙයි



"දූෂණයට හා නාස්තියට එරෙහිව වැඩ කරන ජනතා බලයක් ගොඩනගමු" තේමාව යටතේ රජයේ මුද්‍රණ සේවකයින්ගේ සංගමයේ 13වැනි සම්මේලනය ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් මාර්තු 21 පෙරවරුවේ රජයේ මුද්‍රණාලයීය ක්‍රීඩා ශාලාවේදී පවත්වන ලදී.

රජයේ මුද්‍රණ සේවකයින්ගේ සංගමයේ ලේකම් කේ. සරත්ලාල් සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නායකයෝද සාමාජිකයෝ විශාල පිරිසක්ද එම අවස්ථාවට සහභාගි වී සිටියහ.

# හෙද සේවාවේ ගැටලු නොවිසඳීමට එරෙහිව උද්ඝෝෂණයක්



හෙද සේවාවේ පවතින ගැටලු ගණනාවක් සම්බන්ධයෙන් පසුගිය කාලය තුළ සමස්ත ලංකා හෙද සංගමය අමාත්‍යාංශය සමග සාකච්ඡා පැවැත්වූ අතර එහිදී ඇතිවූ එකඟතාවයන් හා හෙද ගැටලු විසඳීමට ඇති කරගත් එකඟතාවයන් ක්‍රියාත්මක නොකිරීමට එරෙහිව සංගමය විසින් විරෝධතා උද්ඝෝෂණයක් මාර්තු 01 වන දින පවත්වනු ලැබීය.

ප්‍රධාන ඉල්ලීම් 06 ක් මුල් කරගනිමින් මෙම උද්ඝෝෂණය පවත්වන ලද්දේ සෞඛ්‍ය අමාත්‍යාංශය ඉදිරිපිටදීය. මේ සඳහා රට පුරා රෝහල් නියෝජනය කරමින් හෙද හෙදියෝ විශාල ප්‍රමාණයක් සහභාගි වී සිටියහ.

# වරාය විකිණීමට එරෙහිව සේවක උද්ඝෝෂණයක්



රජයේ විදේශ විනිමය අවශ්‍යතාවය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු හම්බන්තොට වරාය කඩිමුඩියේ විකුණා දැමීමට ආණ්ඩුව විසින් මේ වන විට සූදානම් වෙමින් සිටී. වරාය අධිකාරියේ වරායන්, ජැටි පෞද්ගලික අංශයට පැවරීම එරෙහිව වරායේ වෘත්තීය සමිති විසින් පසුගිය කාලය තුළ විවිධ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගණනාවක් ගන්නා ලදී.

එසේ තිබියදී හම්න්තොට වරාය චීනයේ සීඑම් පොර්ට් සමාගමට විකිණීමේ ගිවිසුම හා අදාළ කැබිනට් පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලයට යොමු කිරීමට රජය ගත් තීරණයට විරෝධය පළකරමින් වරායේ පවත්නා වෘත්තීය සමිති වන සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතිය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, ඉංජිනේරු සංගමය, විධායක නිලධාරීන්ගේ සංගමය, කාර්මික නිලධාරීන්ගේ සංගමය හා කාර්මික පරිපාලක සංගමය වරාය රැක ගැනීමේ වෘත්තීය සමිති පෙරමුණ සමග ඒකාබද්ධව මාර්තු 13වැනි දින දහවල් කොටුව බාන් ඔරලෝසු කණුව අසලදී උද්ඝෝෂණයක් පවත්වන ලදී.

## වරාය විකිණීම වහා...

01 පිටුවෙන්




වරප්‍රසාද ලෙස අවුරුදු 15ක සියලු බදු සහන, විදෙස් සේවකයින් උපයන විට ගෙවන බද්ද නිදහස් කිරීම, වරාය පරිශ්‍රය සමඟ ඉඩම් අක්කර 1950කට ආසන්න ප්‍රමාණයක් ලබාදීම, ඇතුළත් වෙනවා. දකුණු කොළඹ ව්‍යාපෘතිය සහ රැජින ජැටිය සමාගම්වලට ලබාදීමේදී ඔවුන්ට අයිති වුණේ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ සේවා පමණයි. නමුත් හම්බන්තොට වරාය ලබාදීමේදී සියලුම සේවා සියලුම නාවික කටයුතු සමාගමට අයිති වෙනවා. විකිණීමෙන් පස්සේ වරාය තුළ ක්‍රියාත්මක වන්නේ ජාත්‍යන්තර නීතිය බවට තොරතුරු වාර්තා වෙනවා. අපේ රටේ නීතිය බලපාන්නේ නැහැ. රටේ ස්වෛරීභාවය, වරාය ව්‍යාපාරික කටයුතු, ඉඩම් මේ සියල්ලම තමයි ඩොලර් මිලියන 1100ට ඇස්තමේන්තු කරලා තිබෙන්නේ. අපේ රටේ පාලකයෝ ඉදිකිරීම්වලිනුත් හොරකම් කළා. රටේ සම්පත් විකිණීමේදීත් හොරකම් කරනවා.

වරාය ඇමති අර්ජුන රණතුංග රටට හෙළිකළ යුතුයි වරාය විකිණීමේ ක්‍රියාවලියට ඔහුගේ දායකත්වය කොපමණද කියලා. වරාය අධිකාරිය අයිති ඔහුටයි. වරාය විකිණීම පිළිබඳව කැබිනට් මණ්ඩලයට යෝජනාවක් එනවා කියලා අපිට තොරතුරු ලැබුණා. වරාය ඇමතිවරයා හෝ වරාය අධිකාරියේ සභාපතිවරයා නෙවෙයි මේ යෝජනා ගේන්නේ. රනිල්, මලික්, චරිත රත්වත්තේ, පාස්කරලිංගම් ගජ මිතුරන්ගේ ආර්ථික කමිටුව තමයි මේවා තීරණය කරන්නේ. අපේ රටේ ආර්ථික කමිටුව බ්‍රෝකර් සමාගමක්ද? එයාර් ලංකා සමාගම ගිවිසුමක් අත්සන් කරලා ගුවන්යානා මිලදී ගැනීමක් සිදුකරන්න ගියා. ඒ වෙනුවෙන් මැදිහත් වුණේ විෂය භාර ඇමතිවරයා විදිහට කබීර් හෂීම් ඇමතිවරයා නෙවෙයි. චරිත රත්වත්තේගේ ආර්ථික කමිටුවයි. විෂය භාර ඇමතිවරුන්ට තිබෙන වගකීම්, බලතල ඉක්මවා ආර්ථික කමිටුව තීන්දු තීරණ ගන්නවා.

අගමැතිවරයාගෙන් මලික් සමරවික්‍රමගෙන් අපි පාර්ලිමේන්තුවේදී ගිවිසුම් ගැන ප්‍රශ්න කළා. හැම වෙලාවේදීම ඔවුන් ප්‍රකාශ කළේ සියලු ගිවිසුම් පාර්ලිම්න්තුවට ඉදිරිපත් කරනවා කියලා. විකිණීමේදී පවා අවම සදාචාරයක් තිබිය යුතුයි. විෂය භාර ඇමතිවරයාගේ යෝජනා, කැබිනට් මණ්ඩලයේ සාමූහික එකඟතා පසෙකලා ආර්ථික කමිටුව තීරණ ගන්නවා. මේ ආර්ථික කමිටුව අලෙවි කරන්නේ අපේ රටේ උපන් නූපන් දරුවන්ට අයිති සම්පත්. ඔවුන්ට එහෙම කරන්න තියෙන බලය මොකක්ද? පාර්ලිමේන්තුවේ කමිටුවල, අධීක්ෂණ කාරක සභාවල ගිවිසුම් සාකච්ඡාවට ගන්නේ නැත්නම් අගමැතිවරයා කරන පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමේ දෙඩවිල්ල මොකක්ද? ඒ නිසා පාර්ලිමේන්තුවේ සාකච්ඡාවකින් තොරව කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්න ඉඩ දෙන්නේ නැහැ.

මෙම විකිණීමේ ක්‍රියාවලිය සිදුවන්නේ අද පමණක් නොවේ. අසූවේ මැද භාගයේ සිට රාජ්‍ය හා ස්වභාවික සම්පත් විකිණීම ආරම්භ කළා. එදා ඉඳලම මේ ආණ්ඩු තෝරා ගත්තේ විකිණීම සහ ණය ගැනීමයි. ප්‍රේමදාස යුගයේ රාජ්‍ය සම්පත් විකුණනකොට 'ජනතාකරණය' වචනය පාවිච්චි කළා. මොකද, විකුණනවා කියන වචනයට ජනතා විරෝධයක් එන නිසා. ඒ කාලයේ ආණ්ඩුවට අයිති වතු ජනතාකරණය කළා. චන්ද්‍රිකා යුගයේදී විකිණීමට 'ප්‍රතිව්‍යුහගතකරණය' කියන ලේබල් එක ගැහුවා. ෂෙල් ගෑස් සමාගම, තෙල් සංස්ථාව, ඔරුවල වානේ සංස්ථාව විකුණලා දැම්මා. අද රනිල් මෛත්‍රී ආණ්ඩුව 'රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාර' කියන ලේබලය අලවලා සම්පත් විකුණනවා. මේ අවුරුදු 30 ඇතුළත හැම ආණ්ඩුවක්ම අනුගමනය කළේ එකම උපාය මාර්යක්.

අනෙක් මාවත තමයි ණය ගැනීම. අපේ රටේ පාලකයෝ අයි.එම්.එෆ්. එකට, ලෝක බැංකුවට ආධාර සමුළුවලට ගිහින් ගුවන්තොටුපොළට එනකොට කිව්වේ 'අපිට ණය ලබාදෙන්න ආයතන එකඟ වුණා; ඒක අපි ලබපු ලොකු ජයග්‍රහණයක්; ඒ ණයවලින් අපි රට ගොඩනගනවා' කියලා. ජනතාව රවටන්න මිත්‍යා මත හදපු ඒ පාලකයෝම අද කියනවා රට අර්බුදයක හිරවෙලා කියලා. ලබාගත්තු ණයවලින් අපේ රටේ පාලකයෝ ඇත්ත වත්කම් හැදුවේ නැහැ. උතුරු මාර්ග ව්‍යාපෘතියේ කිලෝ මීටර් 265 හදන්න කියලා ණයක් ගත්තා. ඒ ණය මුදලින් කිලෝ මීටර් 1400ක් හදන්න පුළුවන්කම තිබුණා. ඒ වගේම ණයවලින් අපිට ඕන වත්කම් හැදුවෙත් නැහැ.

ඒ නිසාම ණය ගැනීම්වලට ජනතාව වගකිව යුතු නැහැ. ආර්ථිකයේ කඩාවැටීමට වගඋත්තරකරුවන් විය යුත්තේ තීන්දු තීරණ ගත්තු පාලකයනුයි. නමුත් මේ පාලකයින් අද ජනතාවට පටි තද කරගන්නැයි කීම විහිළුවක්. අපේ රටේ පාලකයින් රාජ්‍ය සම්පත්, ස්වභාවික සම්පත් අලෙවි කිරීම මගින් අර්බුදයට කෙටි කාලීන විසඳුමක් හෙවුවත් එය දිගු කාලීනව ආර්ථික අර්බුදය තීව්‍ර කරනවා. එම නිසා මෙම ක්‍රියාවලිය පරාජය කළ යුතුයි." අනුර දිසානායක සහෝදරයා වැඩිදුරටත් අවධාරණය කළේය.

මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික, පළාත් සභා මන්ත්‍රී නීතිඥ සුනිල් වටගල සහෝදරයාද සහභාගි විය.

## පාලක පංතියේ...

05 පිටුවෙන්

දේශපාලන වේදිකාවෙන් බැස යාමට මෛත්‍රී කැමතිවේද? දයාන් ජයතිලක සති අන්ත ඉංග්‍රීසි පුවත්පතකට ලියා තිබූ පරිදි ගෝඨාභය ජනාධිපති කොට ඒ යටතේ අගමැති වීමට මහින්ද කැමතිවේද? ඒ සඳහා ඉඩදී මෛත්‍රී නිහඬව බලා සිටිනු ඇද්ද? ගෝඨාභය යටතේ සන්නද්ධ හමුදා පැවති කාලයේ ඔහු ඒවා යොදාගෙන කරන ලද මිනිස් ඝාතන හා අපරාධ හෙළිවෙමින් තිබෙන තත්වයක් තුළ ගෝඨාභයට සමාජයෙන් හැදීමට ඉඩ ඇති විරෝධය කෙබඳුද? මේ සියල්ල අතර එක්සත් ජාතික පක්ෂය කුමක් කරයිද? මෙම ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම සරල නැත; ඉතාම දුෂ්කරය. ඉන් පැවසෙන්නේ, පාලක පංතිය බලය පිළිබඳ ප්‍රශ්නයේදී උභතෝකෝටිකයට මුහුණ දී සිටින බව නොවේද? එය එසේය.

මේ සියලු තත්වයන් යටතේ දේශපාලන පිටිය විකල්ප බලවේගයක සම්ප්‍රාප්තිය වෙනුවෙන් සකස් වන අතර, එවැනි තත්වයක් සකස් කිරීම පහසුකරද තිබේ. පාලක පංතියේ මෙම අර්බුදය, වමේ ව්‍යාපාරයට; ජනතාවාදී පාලනයක් වෙනුවෙන් යොදාගත හැකිව තිබේ. සියලු ප්‍රගතිශීලී හා ජනතාවාදී බලවේග එක්කර දැවැන්ත ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගීම අවශ්‍යතාවයක් වන්නේ මේ නිසාය. පාලක පංතියේ දුබල බව හමුවේ ජනතාවට ඉදිරිපත් කළ හැකි හා ජනතාව ඒකරාශී කළ හැකි එකම විකල්පය වනු ඇත්තේ එයයි.

මේ තත්වය යටතේ ජනතාවාදී බලවේගයක ජයග්‍රහණයට බාධාකරන විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සියලු දෙනා සටන් වැදිය යුතු අතර, විකල්ප බලයක් වෙනුවෙන් ජනතා බලවේග පෙළ ගස්වන ජනතා මධ්‍යස්ථානය ගොඩ නැගීමටද ක්‍රියාශීලී විය යුතුය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## යුක්තියට සරදම් කරන ආණ්ඩුවේ අපරාධ පරීක්ෂණ

රාජපක්ෂ පාලන සමයේ සිදුකළ රතුපස්වල වෙඩි තැබීමට සම්බන්ධ යුද හමුදා සොල්දාදුවන් තිදෙනෙක් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලැබ තිබේ. මෙලෙසම ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධවත් මාධ්‍යවේදී කීත් නොයාර්ට පහරදීම සම්බන්ධවත් හමුදා බුද්ධි අංශ සාමාජිකයන්ට චෝදනා එල්ල වී ඇත. පසුගිය කාලය පුරාම විවිධ ඝාතන හා පහරදීම් පිළිබඳ ආරක්ෂක අංශවල නියුතු අයට චෝදනා එල්ල විය.

මින් කරුණු කීපයක්ම පැහැදිලි වේ. එකක් නම් රාජපක්ෂ පාලනය යුද්ධය නිසා නිර්මාණය කර ගත් හමුදාමය බලය හා එහි සමහර ආයතන තම විරුද්ධවාදීන් ඝාතනය කිරීමට හා මර්දනය කිරීමට යොදාගත් බවය. ලංකාවේ අතීතයේ, විශේෂයෙන් ජයවර්ධන පාලන කාලය තුළ විරුද්ධවාදීන් ඝාතනයට හා මර්දනයට යොදා ගත්තේ රජයේ ආරක්ෂාව ලැබූ නිල නොවන මැර කණ්ඩායම්ය. එහෙත් මහින්ද රාජපක්ෂ පාලනය ඒ සඳහා කෙළින්ම නිල හමුදාවන්ම යොදා ගත්තේය. ඒ ගෝඨාභය රාජපක්ෂගේ ආරක්ෂක ලේකම්කමද උපයෝගී කරගෙනය.

දැන් සිදුවෙමින් තිබෙන්නේ කුමක්ද? පසුගිය කාලයේ සිදුවූ මෙම සමහර ඝාතනවලට, පහරදීම්වලට සම්බන්ධ හමුදා සොල්දාදුවන් හෝ පොලිස් නිලධාරීන් අත්අඩංගුවට ගනු ලැබ ඔවුන් රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලැබීම සහ එක් එක් පාර්ශ්ව විසින් තම තමන්ට ගැලපෙන ලෙස එය නිර්වචනය කරනු ලැබීමය.

වත්මන් රනිල්- මෛත්‍රී පාලනයට අනුව මෙම අත්අඩංගුවට ගැනීම් යුක්තිය ඉටුවීමක්, නීතිය හරිහැටි ක්‍රියාවට නැඟීමක් හා 'යහපාලනය' පිළිබඳ නිදසුනකි. ඔවුන් මෙය අර්ථ දක්වන්නේ එසේය. ඒ අතර මහින්දගේ ඒකාබද්ධ විපක්ෂයේ නඩයට අනුව මෙය අධිරාජ්‍යවාදීන් හා දෙමළ ඩයස්පෝරාව සතුටු කිරීමට "රණවිරුවන්ගෙන්" පළිගැනීමකි. යුද්ධයට ගිය 'රණවිරුවා' රාජපක්ෂවරුන්ගේ විරුද්ධවාදීන්ට ගිනි බිඳින, අත පය කඩන මැරයෙකු කළේ, රාජපක්ෂවරුන් විසින් මිස වෙන කිසිවෙකු විසින් නොවේ. ඒ අනුව මෙම අපරාධ කළ අය රණවිරු ලේබලය යටතේ නීතියට උඩින් තැබිය යුතු නොවේ.

එහෙත් මෙහි බරපතළ කාරණය එය නොවේ. රතුපස්වල නිරායුධ ජනතාවට ගිනි බිඳින ලද සොල්දාදුවන් තිදෙනා ගිනි අවිත් සමග අත්අඩංගුවට ගන්නා වත්මන් පාලනය, ඒ සඳහා එකී සොල්දාදුවන් එම ස්ථානයට යැවූ හා වෙඩිතැබීමට ඔවුන්ට අණ කළ අය තවමත් අත්අඩංගුවට ගෙන නොතිබීමයි. එසේම රතුපස්වල ඝාතන, අත්අඩංගුවට ගත් හමුදා සොල්දාදුවන් රතුපස්වලදී මිය ගිය තිදෙනා සමඟ තිබූ පෞද්ගලික තරහක් මත සිදු කරන ලද්දක් නොවන බවත් ඉතාම පැහැදිලිය. ලසන්ත වික්‍රමතුංග ඝාතනයද එසේය. එය කළා යැයි කියන බුද්ධි අංශ සාමාජිකයන්ට ලසන්ත සමග තරහක් තිබෙන්නට හේතුවක් නැත. ලසන්ත සමග කෝපයෙන් සිටියේ රාජපක්ෂවරුය. ගෝඨාභය රාජපක්ෂය; කිත් නොයාර්ට පහරදීමද එසේය. ඒ අනුව ඒවා සියල්ල 'ඉහළින්' දුන් නියෝගවලට අනුව සිදුවූ දේවල්ය. එහෙත් ගැටලුව වන්නේ වත්මන් ආණ්ඩුව මෙම අපරාධවලට අණ දුන් 'ඉහළ' පුද්ගලයන් මඟහැර 'අණ' කියාත්මක කළ, පහළ සොල්දාදුවා දඩයම් කිරීමය.

තාජුඩීන් ඝාතනයේ තත්වයද එසේය. තාජුඩීන් ඝාතනයේ තොරතුරු වසන් කිරීමේ වරදට පොලිස් ලොක්කෙක් වූ අනුර සේනානායක අත්අඩංගුවට ගනු ලැබ සිටී. එහෙත් තාජුඩීන් මරා දැමූ ඝාතකයන් නිදැල්ලේය. ආණ්ඩුව කැකිල්ලේ රජුගේ භූමිකාවට පණ පොවා ඇත්තේ එසේය. අනුර සේනානායකගේ දෑත්වලට මාංචු දැමූ ආණ්ඩුව ඝාතනය සැලසුම් කළ හා එය සිදුකළ ප්‍රබලයන්ගේ දෑත්වලට මාංචු දැමීමට කැමති නැත. ඊට බියක්ද ඇත. රතුපස්වලදී තුවක්කුවල කොකා ගැස්සූ සෙබළුන්ගේ අත්වලට මාංචු දැමීම පහසුවෙන් කරන ආණ්ඩුව එම සෙබළුන්ට අණ දුන් 'ඉහළ' අත්වලට මාංචු දැමීමට සූදානම් නැත. ඒ ඔවුන් "එකම පංතියේ" අය නිසාය. ඔවුන් මිතුරන් නිසාය. පංතිය ආරක්ෂා කර ගත යුතු නිසාය. සත්‍යය එයයි.

මේ අනුව රතුපස්වල වෙඩි තැබීම කළ සොල්දාදුවන්ගේ පිටින් සියලු පව් සෝදා හැරීමට හෝ ලසන්ත ඝාතනයේ පව්, බුද්ධි අංශ සාමාජිකයන් පිටින් සෝදා හැරීමට හෝ ආණ්ඩුව කටයුතු කරන්නේ නම් යුක්තියේ නාමයෙන් ඊට ඉඩ දිය යුතු නැත. වෙඩිතැබූ සොල්දාදුවන් අත්අඩංගුවට ගත යුතුය. එහෙත් ඒ අතරම මෙම අපරාධවලට සම්බන්ධ ප්‍රබලයන්ට හා ඒවායේ 'මහ මොළකරුවන්ට' එරෙහිවද නීතිය ක්‍රියාත්මක විය යුතුය. එසේ නැතිව 'පහත් තැනින් යයි ගලා ජලේ' යන යෙදුමට අනුව කටයුතු සිදුවීමට ඉඩ නොදිය යුතුය.

මේ අතර ඝාතකයන් එළියේ සිටියදී ඝාතකයන්ගේ වහලුන් ලෙස සිට තොරතුරු වසං කිරීමට ගොස් හිරබත් කන අනුර සේනානායකලාගෙන්, රතුපස්වල සැබෑ ඝාතකයන් නිදැල්ලේ සිටියෙදී දුරදිග නොබලා අණ ක්‍රියාත්මක කිරීමට ගොස් හිරබත් කන සොල්දාදුවන්ගෙන් අනෙක් අයද, පාඩමක් ඉගෙන ගත යුතුය. බලය තිබෙන විට එම බලය තිබෙන ලොක්කන්ගේ සෙවණේ හිඳිමින්, ඔවුන්ගෙන් ලැබෙන වරප්‍රසාද වෙනුවෙන් ඔවුනට බැලමෙහෙ කරන, ඔවුන්ගේ අපරාධවලට දෙවරක් නොසිතා පෙරමුණ ගෙන හවුල්වන, සියලු දෙනාට සිදුවන්නේ දැන් මේ අයට සිදුවන දේමය. දැන් මිනිස් ඝාතනවලට චෝදනා ලබන සොල්දාදුවාගේ පිහිටට අණ දුන් අය එන්නේ නැත. නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක වැනි අය බේරා ගැනීමට ඔහුගෙන් වැඩගත් රාජපක්ෂවරු එන්නේ නැත. මෙය ඕනෑම පාලනයකදී පොදුය. එබැවින් බලය ඇති වුන් අත හැමදාම බලය නොතිබෙන බවත්, බලය තිබියෙදී ඔවුන් කරන අපරාධවලට වන්දි ගෙවීමට සිදුවන්නේ, ඒවා අවසානයේ ක්‍රියාත්මක කරන අයට පමණක් බවත් වටහා ගත යුතුය.

අනෙක් අතට ප්‍රජාතන්ත්‍රවාදය හා යුක්තිය පිළිබඳව සිතන දේශපාලන අපරාධ අවම කිරීමට අදහස් කරන සියලු දෙනා අපරාධවල අගට සිටින, අණ පිළිපදිනවුන් මත අපරාධයේ වගකීම් පවරා ඒවාට නායකත්වය දුන් හා අණ දුන් සැබෑ අපරාධකරුවා රකින වත්මන් ක්‍රමය පැරදවීමටද පෙළ ගැසිය යුතුය. රටක යුක්තිය නීතිය බවට පත් කළ හැක්කේ එවිටය.

# ලෝකය වැඩකරන ජනතාවගේ කරගැනීමට එකතුවී සටන් වදිමු!



## සමාජවාදී කම්කරු සංගමයේ ජාතික සංවිධායක ලාල්කාන්ත සහෝදරයා

***නියමුවා:-*** *සයිටම් ආයතනය පදනම් කරගනිමින් ගොඩනැගුණු පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී සටන මේ වන විට යම් සන්ධිස්ථානයකට පැමිණ තිබෙනවා නේද?*

***ලාල්කාන්ත සහෝදරයා:-*** ඉස්සෙල්ලම කියන්නම් සයිටම් ආයතනය ගැන අපේ ස්ථාවරය මොකක්ද කියලා. මේ ආයතනය වසාදමන්න ඕනෑ. මේ ආයතනයේ ඉගෙන ගත් දරුවන්ටත් ඉගෙන ගන්න දරුවන්ටත් සාධාරණ විසඳුමක් ලබාදෙන්න ඕනෑ. එම විසඳුමේදී නිදහස් අධ්‍යාපනයේ ඉතිරිවී තිබෙන නිදහස ආරක්ෂා වෙන්න ඕනෑ. කාරණයට අදාල සියලු දෙනා නියෝජනය වන කමිටුවක් මගින් එය කළ යුතුයි. මේ සටන ඉදිරියට අරගෙන ඒමේදී විවිධ අය විවිධාකාරයෙන් දායකවෙලා තිබෙනවා. එක වෙලාවක ශිෂ්‍ය ව්‍යාපාරය මූලිකත්වය ගත්තා. තවත් වෙලාවක රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මූලිකත්වය ගත්තා. වෙලාවක වෛද්‍ය සභාව මොකද කරන්නේ කියල බලන් හිටියා. අධිකරණය දෙන තීන්දු දිහා බලන් හිටියා. කවුරුත් නිහඬ අවස්ථාවක සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිය සමිති ගණනාවක් එකතුවෙලා සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මූලික කරගෙන පෞද්ගලික වෛද්‍ය විදුහල විරෝධී මධ්‍යස්ථානය ගොඩනගාගෙන සටනට පණ දුන්නා. අපේ පක්ෂයත් සයිටම් විරෝධී සටනේ ප්‍රබල කොටස්කාරයෙක්. අපි ගොඩක් දේවල් කළා. මහ පාර වගේම පාර්ලිමේන්තුවත් සටනට පාවිච්චි කළා. මේ ආයතනය ජාතක කරපු මහින්ද රාජපක්ෂත් ඔහුගේ ඇම්බැට්ටයොත් මේ සටනට ඔළුව දානකොට සමහරු ලැජ්ජා නැතිව ඔවුන්ව වේදිකාවට නග්ග ගත්තා. කොහොම වුණත් අද මේ රටේ ජනතාවගෙන් බහුතරයක් සයිටම් විරෝධීන් බවට පත්වෙලා තියෙනවා. ඒක තමයි සටනේ පළමු ජයග්‍රහණය. නමුත් දැන් මේ සටන එකතැන පල් වෙනවා. දැන් සටන අලුත් මඟකට ගන්න ඕනෑ. ආණ්ඩුව දණගස්සන්නේ නැතිව මේ සටන දිනන්න බැහැ.

***නියමුවා:-*** *විරෝධයේ දිශානතිය වෙනස් කළ යුතුනම් ඔබේ යෝජනාව කුමක්ද?*

***ලාල්කාන්ත සහෝදරයා:-*** දැන් මේ සටන කම්කරු ව්‍යාපාරය අතට ගන්න ඕනෑ. පවතින දේශපාලන වටපිටාව ඇතුළෙ ශිෂ්‍ය ව්‍යාපාරය තමන්ට පුළුවන් දුරෙන් වැඩි කොටස ගෙනවිත් තිබෙනවා. ආණ්ඩුව දැන් අපිට කියන්නෙ තවත් සටන් පෙරමුණු සටනට කැඳවන්න කියලා. අපි ඒක කළ යුතු වෙලාව දැන් ඇවිත්. පංති වර්ජනය කරල ඉන්න වෛද්‍ය පීඨවල ළමයි ඉගෙන ගන්න යන්න ඕනෑ. සියලු විශ්වවිද්‍යාලවල සියලුම පීඨයන් විවෘතව තබා ගැනීම සටනට වාසියි. ළමයි ඉගෙන ගන්න ගමන් සටන් කරන්න ඕනෑ. වෘත්තීය සමිති ව්‍යාපාරය මූලික වෙලා සයිටම් විරෝධී සියලු බලවේග එකතු කර එකඟතාවයන් ගොඩනගාගෙන සටන් මධ්‍යස්ථානයක් පිහිටුවා එහි නායකත්වය රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දරමින් සටන දිනන තුරු ඉදිරියට ගෙනයා යුතුයි. ඒ සඳහා උපරිම කැපකිරීම් කරන්න අපි සූදානම්. ආණ්ඩුව ඉල්ලන්නේ වැඩවර්ජන නම් ඒවා ලබාදිය යුතුයි. ආණ්ඩුවේ දණ බිම අනින්නේ නැතිව මේක ඉවරයක් කරන්න බැහැ.

> "මේ හැම ප්‍රකාශයකින්ම හැම දේකින්ම ඉතාම පැහැදිලියි රට බංකොලොත් කරගෙන ඉවරවෙලා දැන් විදෙස් කොම්පැනිවලට රට බාරදෙමින් තිබෙන බව. මේ බංකොලොත්කම කෙළවර වෙන්නේ එක එක රටවල කොම්පැනි අපේ රටේ ජනතාවගෙ ශ්‍රමය සූරාකෑමෙනුත් රටේ සම්පත් කොල්ලකෑමෙනුත්. එදා සුද්දා තුවක්කුවෙන් රට යටත්කරගෙන සුද්දන්ගේ කොම්පැනි මගින් කරගත්ත දේ අද කළු සුද්දන් මගින් කරගන්නවා. අවසානයේ දේශපාලන වශයෙනුත් ආර්ථික වශයෙනුත් සංස්කෘතික හා සමාජමය වශයෙනුත් අපි යටත් ජාතියක් බවට පත්වෙනවා."

***නියමුවා:-*** *රට තුළ දැවැන්ත ආර්ථික අර්බුදයක් මතුවෙමින් තිබෙන බවට බොහෝ විද්වතුන් කරුණු දක්වමින් තිබෙනවා. මේ පිළිබඳව ඔබේ විග්‍රහය කුමක්ද?*

***ලාල්කාන්ත සහෝදරයා:-*** අගමැති රනිල් වික්‍රමසිංහ කිවුවා රටේ බැංකු ඔක්කොම කඩල සල්ලි ගත්තත් රට කරන්න සල්ලි නැහැ කියලා. තවත් වෙලාවක කිවුවා ජනතාවට තිත්ත බෙහෙත් බොන්න ලෑස්ති වෙන්න කියලා. බලයට ආව ගමන් කිවුවා ණය වාරික ගෙවන්නත් සල්ලි නැහැ කියලා. දුවගෙන ගිහිල්ල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය වාරික ගෙවන්න නැවත ණය ගත්තා. දැන් ඉටුකරමින් තිබෙන්නේ, ජනතාවට දීපු පොරොන්දු නෙමෙයි. මූල්‍ය අරමුදලට දීපු පොරොන්දු. හම්බන්තොට වරාය ඇතුළු ජනතාවගේ ආයතනත් ජනතාවගේ සම්පතුත් විකුණමින් තිබෙනවා. ඒවා විකුණන්නේ ණය බේරන්නලු. වැට් බද්ද දාන වෙලාවෙ කිවුවා, ඩොලර් නැති නිසා තමයි බදු පනවන්නෙ කියලා. ඩොලර් එකක් වෙනුවෙන් ගෙවන රුපියල් ප්‍රමාණය දිගටම වැඩිකරගෙන යනවා. රුපියල බාල්දු වෙනවා. ඩොලර් මිලියන කීපයක් අරන් එනව නම් ඕන හොරෙක් ලංකාවට එන්නලු. **15 වැනි පිටුවට**



YES WE CAN

# අපරාධ නැති රටක්

දිනෙන් දින රට තුළ මහා පරිමාණ අපරාධ ඉහළ යන තත්වයක් දකින්නට ලැබේ. කප්පම් ගැනීම්, මංකොල්ලකෑම්, පැහැරගෙන යෑම්, සහ මහ දවල් සිදුකරන මනුෂ්‍ය ඝාතන දක්වා මේ අපරාධකාරීත්වය දිගහැරී ඇත. පසුගිය කාලයේ මාධ්‍ය මගින් මෙවැනි සිදුවීම් බොහෝ ගණනක් වාර්තා වූ අතර මෑතකදීම කළුතර බන්ධනාගාර බස්රථය තුළදී පිරිසක් වෙඩි තබා ඝාතනය කළ බවද වාර්තා විය. තවද වාර්තා වූ සිදුවීම් තුළින් දැකගත හැකිවූයේ දකුණේ මෙන්ම උතුරේද මෙවැනි සිදුවීම් වෙනසක් නොමැතිව සිදුවන බවය. මාධ්‍ය මගින් වාර්තා වුණු ප්‍රමාණය එසේ වුවද සැබෑ ලෙසම සිදුවන ප්‍රමාණය මෙයට වඩා වැඩි බව අවිවාදිතය.

පසුගිය කාලය පුරාවට වාර්තා වුණු එවැනි සිදුවීම්වලට සම්බන්ධව සිටියේ අවු. 16 -35 අතර වයසේ වූ තරුණ කොටස් බව පැහැදිලි කරුණක් විය. එවැනි සිදුවීම්වලට සම්බන්ධ තරුණ කොටස් පිළිබඳව සොයාබලන කළ දැකගත හැකි සත්‍ය නම් එවැනි පිරිස් ආර්ථික අතින් දුප්පත් පවුල්වල තරුණයන් වන බවත් ඔවුන් බොහෝ දෙනෙකුට තම ළමා කාළයේදී පවුලේ ආර්ථික පසුබිම නිසාම නිසි අධ්‍යාපනයක් ලැබීමේ අවස්ථා අහිමිවූවන් වන බවත්ය. රැකියා නොමැතිකම නිසාවෙන් කුමක් හෝ ජීවනෝපායක් සොයා ගෙදරින් පිටව කොළඹට හෝ තදාසන්න නගරවලට පැමිණ බොහෝවිට මෙවන් ක්‍රියාවලට සම්බන්ධව ඇති බවය. සමාජය විසින් ‘පාතාලය, මැරකල්ලි, අපරාධකරුවන්’ යනාදී කුමන නමකින් හැඳින්වුවද සැබෑවටම මොවුන් අප අතර ජීවත්වන සාමාන්‍ය මිනිසුන්ය. වෙනසකට ඇත්තේ ඔවුන් සතුව පුද්ගල ඝාතන අවි පැවතීමත් එවා යොදා ගනිමින් මුදල් හා භාණ්ඩ කොල්ලකෑමත්ය.

වත්මන් සමාජයේ අප මුහුණදෙන යථාර්ථය නම් ඇති-නැති පරතරය දිනෙන් දින ඉහළ යාමය. සමාජයේ සුළු කොටසක් අසීමිතව සම්පත් භුක්ති විඳින විට බහුතරයක් තම ජීවිතය ගැටගසා ගන්නේ බොහෝ දුෂ්කරතා මධ්‍යයේය. කුසගින්න, ලෙඩරෝග, නූගත්කම, අපේක්ෂාභංගත්වය ඇතිවිට එහි වෛරය, ක්‍රෝධය, අවිශ්වාසය හා අසහනය උපත ලබයි. එවිට එහි හොරකම්, අපරාධ, මත්ද්‍රව්‍ය එකට කැටිවූ පාතාලය දලුලා වැඩේ.

එනිසා සමාජය තුළ අපරාධකාරී සිදුවීම් සිදුවන විට ඒවා සිදුකරන පුද්ගලයින් දෙසට ඇඟිල්ල දිගුකිරීමට එහා ගොස් පවතින සමාජ ආර්ථික රටාව විසින් අපරාධකාරීත්වය නිර්මාණය කරන බව ප්‍රත්‍යක්ෂ කොට ගත යුතුය. එනිසාවෙන්ම මෙම අපරාධකාරීත්වය සමාජයෙන් තුරන් කිරීමට නම් මෙම අපරාධකාරීත්වයට හේතුවන සමාජ විෂමතාවය නිර්මාණය කර ඇති සමාජ ආර්ථික රටාව වෙනස් කළ යුතුය. එනම් සමානාත්මතාවය සහිත සමාජ ආර්ථික රටාවක් ගොඩනැගිය යුතුව ඇත. එතකින් පමණක් මෙම අපරාධකාරීත්වය දුරලිය හැකිවනු ඇත.

# ජාත්‍යන්තර සබඳතා පුළුල් කළ චීන සංචාරය



පසුගිය මාර්තු 06 සිට 12 දක්වා පැවති චීන සංචාරයක් සඳහා සමාජවාදී තරුණ සංගමයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් අංජන සම්පත් අමරසිංහ සහෝදරයා සහභාගි විය. ඒ මේ වසරේ දී රුසියාවේ සෝචි නුවර පැවැත්වීමට නියමිත 19වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහාය.

මෙම සංචාර සිදුවූයේ සමස්ත චීන තරුණ සම්මේලනයේ (All Chaina Youth Federation) ආරාධනයක් අනුවය. ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය WFDY හි ආසියාපැසිෆික් කලාපයේ උප සභාපති ධූරය නියෝජනය කරමින් සහභාගි වීම සඳහා මෙසේ සමාජවාදී තරුණ සංගමයට අවස්ථාව හිමිවිය. ඊට අමතරව WFDY හි සභාපති නිකොලායි පපාදිමිත්‍රියෝ එහි ප්‍රධාන ලේකම් තේසේ මවුරි, අප්‍රිකානු කලාපයේ උප සභාපති නෆ්මාල් කම්බුන්ගු, රුසියානු ජාතික සූදානම් කිරීමේ කමිටු සභාපති හා ලෙනින්වාදී කොමියුනිස්ට් රුසියානු තරුණ ලීගයේ ලේකම්වරයාද මෙම සාකච්ඡා සඳහා එක්වී සිටියහ.

19වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල සඳහා චීන නියෝජිතයන් විශාල පිරිසක් සහභාගි කරවා ගැනීමත්, එම උළෙලේ කටයුතු හා WFDY හි ක්‍රියාකාරිත්වය පිළිබඳ චීන රජය දැනුවත් කිරීමත් සංචාරයේ අරමුණ විය.

මේ අතර සමස්ත චීන සම්මේලනය හා එහි ප්‍රධාන සංවිධානය වන චීන කොමියුනිස්ට් තරුණ සංගමයත් සමාජවාදී තරුණ සංගමයත් අතර සබඳතා ශක්තිමත් කරගැනීමට මෙය මහඟු අවස්ථාවක් විය. එසේම රුසියානු තරුණ සංගම් සමගත් සබඳතා ගොඩනගා ගනිමින් තරුණ සංගමය සතු ජාත්‍යන්තර සබඳතා තවදුරටත් ශක්තිමත් කරගැනීමට මෙම සංචාරය ඉවහල් විය.




තරුණ

JUST A MOVEMENT

## වකුගඩු රැකගැනීම වෙනුවෙන්...



අනුරාධපුර, මැදවච්චිය රෝහලේ කෝටි පහක වියදමින් ඉදිකළ වකුගඩු ඒකකය විවෘත කරන ලෙසත් එහි ඇති අඩුපාඩු සම්පූර්ණ කරන ලෙසත් ඉල්ලමින් පෙබරවාරි 24 මැදවච්චිය නගරයේ විරෝධතාවයක් පැවැත්විණි.

අද වන විට මෙම වකුගඩු රෝගය අතිශය බරපතළ සමාජ ඛේදවාචකයක් බවට පත්ව තිබේ. දිනකට වකුගඩු රෝගය නිසා රටපුරා මිනිස් ජීවිත 07ක් අහිමි වෙමින් පවතී. මෙම අර්බුදය කෙතරම් ප්‍රබල වුවත් මෙයට ස්ථිර විසඳුමක් සොයාගැනීමට පවතින සහ පැවති පාලකයන් සමත් වී නොමැති අතර තවමත් සිදුවනුයේ වකුගඩු රෝගය බහුල ප්‍රදේශවල රෝහල්වල වකුගඩු වාට්ටු, රෝගී සායන ආරම්භ කිරීමය. එම රෝගින්ගේ සුභ සාධනය සඳහා විවිධ අරමුදල් පිහිටුවීම මාසිකව රුපියල් 3000ක දීමනාවක් ලබාදෙයි. එම රෝගය අවසාන විසඳුම වන වකුගඩු බද්ධ කිරීම හෝ රුධිර කාන්දුකරණය සඳහා යොමුකර ඇති රෝගි දහස් ගණනක් එම රෝහල්වල දැකගත හැකිය. නමුත් එහි අධික වියදම් සහගතභාවය සහ එයින් වැඩි ප්‍රමාණයක් එම රෝගීන්ට දරා ගැනිමට සිදුව තිබෙන නිසාත් එයට ආර්ථික හැකියාවක් නොමැති නිසාත් එයට බොහෝ දෙනා තම ජිවිතය පිළිබද බලාපොරොත්තු අත්හරිමින් සිටිති. මෙයට සැබැ විසඳුමක් සෙවීමටනම් වකුගඩු රෝගය සෑදිමට බලපාන සෑබැ රෝග කාරක විද්‍යාත්මකව හඳුනාගෙන ඒ පිළිබඳව ජනතාව දැනුවත් කර එයින් වකුගඩු රෝගය ව්‍යාප්ත විම වැළැක්වීමට කටයුතු කළ යුතුය. නමුත් අපට මෙය බලාපොරොත්තු විය හැක්කේ සෑබෑවටම ජනතාවගේ යහපත වෙනුවෙන් කැපවෙන පාලනයක් තුළින්ම පමණි.

## ෆේස් බුක් තහනම් කරමුද?...




පසුගියදා පැවති උත්සවයකදී ජනමාධ්‍ය අමාත්‍යංශයෙ' ලේකම්වරයා විසින් ෆෙස්බුක් ඇතුළු සමාජ ජාල වෙබ් අඩවි නියාමනය කළ යුතු බව ප්‍රකාශයක් සිදුකර තිබිණි. වර්තමානයේ බහුතර මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යන්ගේ අයිතිය පවතිනුයේ ධනපතින්ගේ අතේය. එමගින් සමාජය වෙත පොම්ප කරනුයේ පවතින ධනපති සමාජ ආර්ථික පදනම ආරක්ෂා කරනා මතවාදයන්ය. ජාල වෙබ් අඩවි ධනවාදයේ අර්බුදයේ ප්‍රකාශනයක් ලෙස බිහිවුවද එය කාලය විසින් සමාජයට අරමුණු සහගත මතවාදීමය මැදිහත් විමක් කළ හැකි මාධ්‍යයක් බවට පත්ව තිබේ. දැනට ධනපතියාට තමන්ට අවශ්‍ය තොරතුරු පමණක් සමාජ ගත කිරීමට බාධා පැමිණෙමින් තිබේ. ඔවුන්ට දැන් තොරතුරු සමාජයෙන් වසන්කළ නොහැකි වී තිබේ. එම නිසා ධනපති පංතියට එය නියාමනය කිරීම අනිවාර්යය වී තිබේ. ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රකාශ කරනුයේ එකී අවශ්‍යතාවයය.

# පාලක පංතියේ උභතෝකෝටිකය හා ජනතාවගේ විකල්පය



මේ වන විට ලාංකේය ධනපති ක්‍රමය කොතරම් අර්බුදයකට පත්ව තිබේදැයි කිවහොත් ධනවාදී පාලනය පවත්වාගෙන යාමේදී පාලක කණ්ඩායම් උභතෝකෝටිකයකට මුහුණ දී තිබේ. මෙය ධනවාදයේ ඉරණම තීරණය කළ හැකි තරමේ අර්බුදයක් බව හොඳින් බැලූවිට පෙනේ.

වත්මන් රනිල්-මෛත්‍රී හවුල් පාලනය මේ වන විට විශාලතම මූල්‍ය අර්බුදයකට මුහුණ දී සිටියි. ලංකාවේ විදේශ වත්කම් වේගයෙන් කඩා වැටෙමින් පවතින අතර, ඊට සමගාමීව රුපියලේ කඩා වැටීමද සිදුවන නිසා කෙසේ හෝ විදෙස් වත්කම් ඉපැයීමට ආණ්ඩුවට බලකෙරී තිබේ. ලංකාව කලක සිට විදේශ වෙළඳාමේදී විශාල පාඩුවක් ලබමින් සිටී. සාමාන්‍යයෙන් දළ වශයෙන් ලංකාවේ ආනයන වියදම් ඩොලර් මිලියන 20,000ක් වන විට අපනයන ආදායම ඩොලර් මිලියන 10,000ක සීමාවේ තිබේ. දිගින් දිගටම විදේශ වෙළඳාමේ සිදුවන මෙම පාඩුවත්, අතීතයෙන් ගත් විදේශ ණය සඳහා වාරික හා පොලී ගෙවීමට සිදුවීමත් අලුතින් ණය ගැනීම දුෂ්කර හා අනතුරුදායක වීමත් නිසා විදේශ සංචිත සිඳී කිසිවක් කර ගත නොහැකි තත්වයට ආණ්ඩුව පත්ව තිබේ.

විදේශ වත්කම් උපයා ගැනීම සඳහා නිෂ්පාදන ක්ෂේත්‍රය පණ ගන්වනවා වෙනුවට වත්මන් ආණ්ඩුව විශ්වාස කළේ විදේශ ආයෝජන පිළිබඳවය. එම විදේශ ආයෝජන යනු අලුත් ව්‍යාපාර හෝ කර්මාන්ත වෙනුවෙන් කරන ආයෝජන නොව, දැනට රටේ පවතින රාජ්‍ය ආයතන (වරාය, ඉඩම්, වැනි) විදේශ සමාගම්වලට විකුණා ඉන් මුදලක් ලබා ගැනීමය. එහෙත් ජනතා විරෝධයන්ගේ ප්‍රබලකම නිසා රාජ්‍ය ආයතන හෝ ඉඩම් විකුණා ගැනීමට ආණ්ඩුවට තවම බැරි විය. ඒ නිසා බලාපොරොත්තු වූ විදේශ වත්කම් ලැබුණේ නැත. අර්බුදය උග්‍රවී ඇත්තේ ඒ නිසාය.

මෙම විදේශ සංචිත සිඳී යාමේ අර්බුදයෙන් මිදීමට දැන් ආණ්ඩුව යෝජනා කර ඇත්තේ මොනවාද? ඩොලර් ලක්ෂ 03ක් රැගෙන ලංකාවට එන ඕනෑම විදේශිකයෙකුට ලංකාවේ වසර 05ක ස්ථිර පදිංචිය සඳහා වීසා දීමට ආණ්ඩුව තීරණය කර තිබේ. එහෙත් තවම කවුරුත් පැමිණ නැත. අනෙක් අතට ආණ්ඩුව තවත් එවැනි තීරණයක් ගැනීමට යන බව පැවසේ. ඒ, විදේශ රටවල වත්කම් පවත්වාගෙන යන ශ්‍රී ලාංකිකයන් එම මුදල් ලංකාවේ ආයෝජනය කරන්නේ නම්, එම වත්කම් උපයාගත් ආකාරය ප්‍රශ්න නොකර, එම මුදල් නීත්‍යානුකූල මුදල් ලෙස පිළිගැනීමය. මින් ආණ්ඩුව සූදානම් වන්නේ විවිධ අයථා ක්‍රමවලින්, මූල්‍ය වංචාවලින් මුදල් උපයා, විදෙස් රටවල තැන්පත් කර තිබෙන එම කළු සල්ලි ලංකාවට ගෙන එන්නේ නම්, ඒවා සුදුකර දීමටය. එහෙත් මේවා අර්බුදයට පිළියම් නම් නොවන්නේය. මේ නිසා ආර්ථික ක්ෂේත්‍රයේ විශාල ජනතා විරෝධයකට මුහුණ දීමට ආණ්ඩුවට සිදුවන අතර, එය ආණ්ඩුවේ බලයේ පැවැත්මට අභියෝගයක්ද වන්නේය. මෙම දැවැන්ත ආර්ථික අර්බුද අතරේම නිතිපතා ඇමතිවරුන්ට වාහන ගෙන්වීමටත් අමාත්‍යාංශවලට ගොඩනැගිලි ගැනීම සඳහාත් විශාල මුදලක් වෙන්කිරීම නිසා ජනතා විරෝධය තව තවත් වැඩිවීමට එය හේතු වන්නේය.

අනෙක් අතට ආණ්ඩුව බලය පිළිබඳ ප්‍රශ්නයකට මුහුණදී සිටී. හවුල් ආණ්ඩුව කැඳහැලියක් වැනි පාලනයක් බවට පත්ව තිබේ. පාලනයට වගකියන කවුරුත් නැත. හැම දෙනාම ප්‍රශ්නවලින් කර හැර යති. ඒ අනුව හවුලේ අවුල වැඩිවෙන්නට පටන් ගෙන තිබේ. ආණ්ඩුව පළාත් පාලන හා පළාත් සභා ඡන්ද පැවැත්වීමට බියවී සිටින්නේද මේ නිසාය. එහි ප්‍රතිඵලය වී ඇත්තේ, විවිධ හේතු පෙන්වමින් ඡන්ද කල් දැමීමට ආණ්ඩුව කටයුතු කිරීමය. ආණ්ඩුවක් තම කේන්ද්‍රයේ බලයට අදාළ නොවන පුංචි මැතිවරණ පැවැත්වීමට සාමාන්‍යයෙන් බිය නැත. ඊට කැමතිය. ඒ, එමගින් තම බලය නැවත නැවත තහවුරු කර ගත හැකි නිසාය. එහෙත් ආණ්ඩුවක් එවැනි කුඩා මැතිවරණවලට පවා බියවීම යනු එම ආණ්ඩුවේ දුබලකමේ විශාලත්වයට නිදසුනකි.

මේ අතර මීළඟ නායකත්වය පිළිබඳ ප්‍රශ්නයේදීද ධනපති පක්ෂ සිටින්නේ විශාල අර්බුදයකය. එය පඹ ගාලේ පැටලුණා වැනි තත්වයකි.

ධනපති ක්‍රමය තුළ ධනපති පාලනය පවත්වාගෙන යාමේදී ප්‍රධාන ප්‍රතිවිරෝධය පවතින්නේ, ධනපති පංතිය හා පීඩිත පංතිය අතරය. පීඩිත පංතිය අතට බලය යාම වැළැක්වීම සඳහා සියලු ධනපති කණ්ඩායම් එක පෙරමුණක සිටී. එහෙත් ඒ අතරම ධනවාදය තුළ තම තමන් බලයට පත්වීම සඳහා වන කැමැත්තත් බලයට ඇති කෑදරකමත් නිසා තම තමන්ට බලය ගැනීම සඳහා වන ප්‍රතිවිරෝධයක්ද ධනපති කණ්ඩායම් අතර පවතී.

ධනපති ක්‍රමය තුළ ධනපති පාලනය පවත්වාගෙන යාමේදී ප්‍රධාන ප්‍රතිවිරෝධය පවතින්නේ, ධනපති පංතිය හා පීඩිත පංතිය අතරය. පීඩිත පංතිය අතට බලය යාම වැළැක්වීම සඳහා සියලු ධනපති කණ්ඩායම් එක පෙරමුණක සිටී. එහෙත් ඒ අතරම ධනවාදය තුළ තම තමන් බලයට පත්වීම සඳහා වන කැමැත්තත් බලයට ඇති කෑදරකමත් නිසා තම තමන්ට බලය ගැනීම සඳහා වන ප්‍රතිවිරෝධයක්ද ධනපති කණ්ඩායම් අතර පවතී. බලය සඳහා ඇති කෑදරකම හා වරප්‍රසාදවලට ඇති ගිජුකමේ ප්‍රමාණය වැඩිවන විට ධනපති පංතියේ පංති විඥානය යටකරමින් බලය සඳහා වන තෘෂ්ණාව ඉහළට එයි. එවිට ක්‍රමයේ පැවැත්ම පවා නොසලකමින් බලය සඳහා එකිනෙකා හා තරග වදී. දැන් අපි දකිමින් සිටින්නේ එවැන්නකි.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම තම විශාලතම පොරොන්දුව ලෙස ප්‍රකාශ කොට පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වී ජනාධිපති ධුරයට පත් මෛත්‍රීපාල සිරිසේන මහතා දැන් කටයුතු කරමින් සිටින්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි නොකර නැවත වරක් ජනාධිපති වීම අරමුණු කරගෙනය. ඒ බලයේ රස ඔහුට දැනී තිබෙන නිසාය. එසේම නැවත ජනාධිපතිවරණයක් නොමැති බව හෝ මෛත්‍රීපාල මහතා ජනාධිපති පදවියට තරග නොකරන බව හෝ ප්‍රකාශ කළ හොත්, ඒ මොහොතේ සිටම දැන් බලය වෙනුවෙන් ඔහු වටා සිටිනා පිරිස ඔහු අතහැර යන බව ඔහු දනී. එබැවින් ඔහුට දැන් බලය අත්හැරිය නොහැකිය. එය කොටි වලිගයක් වී තිබේ.

මෛත්‍රීපාල ජනාධිපතිවරයා මුහුණ දෙන එම ගැටලුව විසඳාගැනීමට ඔහු සතුව ඇති විසඳුම වන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි නොකර, තව වරක් ජනාධිපති වීමට උත්සාහ දැරීමය. එවිට නව ව්‍යවස්ථාවක් ගෙන ඒමට නොහැක. එය අනවශ්‍ය ගැටලු ඇතිකර ගැනීමකි. ඒ නිසා මෛත්‍රීපාල මහතා සමග සිටින පිරිස දැන් ප්‍රකාශ කරමින් සිටින්නේ, ජනමත විචාරණයකට නොගොස් පවතින ව්‍යවස්ථාවේ සුළු සුළු වෙනස්කම් කර ගැනීම කළ යුතු බවය. එවිට ඒ ජනාධිපති ක්‍රමය රැක ගත හැකි නිසාය.

මේ අතර රාජපක්ෂ කල්ලියද අර්බුදයට යමින් තිබේ. රාජපක්ෂ කල්ලිය පවතින්නේ මහින්ද රාජපක්ෂ කේන්ද්‍ර කරගෙනය. එහෙත් ජනාධිපති ක්‍රමය අහෝසි නොවී යළි ජනාධිපති ඡන්දයක් ආවොත් එයට තරග වැදීමට මහින්දට නොහැක. ඒ නිසා දැන් සිටම ඒ සඳහා ගෝඨාභය සූදානම් කිරීමට රාජපක්ෂ කල්ලිය සූදානම් වේ. එහෙත් ඊට මහින්ද රාජපක්ෂ එතරම් කැමති බවක් නොපෙනේ. වාසුදේවලා හා ඩිව්ලාද ගෝඨාභයට එතරම් කැමැත්තක් නැත. එහෙත් යථාර්ථය එය නම් අකමැත්තෙන් හෝ ඔවුන්ද ඊට එකතුවෙනු ඇත. ඒ රාජපක්ෂ කල්ලියේ එල්ලී සිටීම හැර අන් විකල්පයක් ඔවුනටද නැති නිසාය.

මේ අතර, එක්සත් ජාතික පක්ෂයද සිටින්නේ අර්බුදයකය. ජනාධිපතිවරණයක් එන්නේ නම් ඉන් රනිල් වික්‍රමසිංහ මහතාට ජය ගැනීම පහසු නැත. 2015දීද 'පොදු අපේක්ෂකයෙක්' පසුපස සැඟවීමට රනිල් වික්‍රමසිංහට සිදුවුණේ ඔහුට තනිව ජයගත නොහැකි බව දැනසිටි නිසාය. 2015 නොහැකි වූදේ දැන් ජනතා විරෝධයකට ලක්ව සිටින තත්වයක් තුළ ඔහුට කෙසේවත් ජයගත නොහැක. ඒ වෙනුවට වෙනත් විකල්පයක්ද එක්සත් ජාතික පක්ෂයට නැත. බලය පිළිබඳ උභතෝකෝටිකය නිර්මාණය වී ඇත්තේ එසේය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම් දෙක එකතුකර ගැනීමකින් තොරව මෛත්‍රීට හෝ මහින්ද පිලේ කිසිවෙකුට බලය ගැනීමක් ගැන සිතීමට පවා නොහැක. එහෙත් දිනපතා සිදුවීම් සිදුවන්නේ මෙම පිල් දෙක එකතුවන පැත්තට නොව දුරස්වන පැත්තටය. මෛත්‍රී ජනාධිපති කොට ඒ යටතේ අගමැති වීමට මහින්ද කැමති වේද? මහින්දට ඉඩදී **02 වැනි පිටුවට**



"සුළු පිරිසක් විසින් බලය අල්ලා ගැනීමක් වෙනුවෙන් අපි පෙනී නොසිටිමු. අපි මාක්ස්වාදීන් වෙමු. අප පෙනී සිටින්නේ, සුළු ධනපති මත් ගතියට විරුද්ධවද ජාත්‍යෝන්මාදවාදයට - ආරක්ෂාවාදයට, වදන් හරඹයට හා ධනපති පංතිය කෙරෙන් යැපීමට විරුද්ධවද, නිර්ධන පංතියේ පංති අරගලයට පක්ෂවද වේ."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**5වැනි වෙළුම,**
**32 පිටුව**

# අභියෝග ජය ගැනුමට - කාන්තාවන් රොද බැඳ

නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය තුළ පළාත් පාලන ආයතන සඳහා වැඩි කාන්තා නියෝජනයක් ලබාදීමට කටයුතු කරමින් සිටින බවද වාර්තා වේ. මේ කටයුත්ත ඇතැම් කාන්තා සංවිධාන විසින්ද තම ප්‍රධාන කාර්යය බවට පත් කර ගෙන තිබේ. සැබැවින්ම මෙය කාන්තාවන් සඳහා සැබෑ අයිතිවාසිකම් ලබා දීමේ ආරම්භයක්ද නැතහොත් ඉතිහාසය පුරාවටම කාන්තාවන් පෙළන සැබෑ සමාජ ආර්ථික ගැටලුවල මූලයන් අමතකොට වෙනත් මනෝරාජික සිහින තුළ ගිල්වා තැබීමට පාලකයන් විසින් සිදුකරන්නක්ද යන්න විමසා බැලිය යුතු කාරණයකි. ලෝකයේ ප්‍රථම අගමැතිනියද, ප්‍රථම විධායක ජනාධිපතිවරියද බිහිවූයේ මෙරටිනි. එහෙත් කාන්තාවන්ගේ අයිතිවාසිකම් හෝ රටට නම් සිදු නොවූ බවට වාදයක් නැත. වසර 70 ක් පමණ වන එ.ජා.ප. ශ්‍රීල.නි.ප. තට්ටු මාරු පාලනය තුළ අද කාන්තාව පත් වී ඇත්තේ බේදනීය තැනකටය. පවතින පසුගාමී ධනවාදී ආර්ථික රටාව තුළ දිනෙන් දින වඩා වඩාත් ඔවුන් පීඩනයට පත්වනවා හැර සිදුවූ දෙයක් නොමැත.

එමෙන්ම මේ තත්වය දඩමීමා කර ගත් ඇතැම් කාන්තා සංවිධාන කාන්තාවන්ගේ කඳුළු විකුණමින් මේ පීඩාවන්ගේ උල්පත වන ධනවාදී ආර්ථික ක්‍රමයට එරෙහිව කාන්තාවන් පෙළ නොගස්වා පුරුෂයන්ට හෝ වෙනයම් හෝ කාරණාවලට එරෙහිව ඔවුන්ව පෙළගස්සමින් සැබෑ හේතුව මඟහරවනු ලබයි.

එවන් වටපිටාවක් තුළ කාන්තාවන්ගේ සැබෑ අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් කාන්තාවන් පෙළගැස්වීමේ කාර්යභාරයක 'අයිතීන් උදෙසා කාන්තාවෝ' සංවිධානය නිරතව සිටී. ජාත්‍යන්තර කාන්තා දිනය යෙදුණු පසුගිය මාර්තු 08 වෙනිදා "අභියෝග දිනන කාන්තා බලයක්!" යන තේමාව යටතේ කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී එම සංවිධානය විසින් සාර්ථක කාන්තා දින සැමරුම් උත්සවයක් පවත් වන ලදී.

මේ සැමරුමේ ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති ඇලීසා ජුවානෝ රුදගු සහෝදරියද , ප්‍රධාන දේශනය ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින්ද පවත් වන ලදී. අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ සභාපති ආචාර්ය සාවිත්‍රී පෝල්රාජ්, ලේකම් සමන්මලී ගුණසිංහ යන සහෝදරියෝද සභාව ඇමතූහ. මේ අවස්ථාව සඳහා 'අයිතීන් උදෙසා කාන්තාවෝ' සංවිධානය නියෝජනය කරමින් කාන්තාවෝ විශාල පිරිසක් සහභාගි වී සිටියහ.



# සයිටමයට එරෙහිව සිසු - ගොවි හමුවක්



කවුරුන් කැමති වුවද අකමැති වුවද සයිටම් ආයතනය පිළිබඳ කතිකාව දේශපාලන ලෝකයෙහි ප්‍රධාන මාතෘකාව වී හමාරය. සැබැවින්ම කේන්ද්‍රයේ පවතින්නේ වෙනයම්ම ගැටලුවක් වුවත් මතුපිට පෙනුම සයිටම් වී ඇත. සයිටම් ආයතනයේ ක්‍රියාවලියට පක්ෂ සහ විපක්ෂ වශයෙන් කඳවුරු දෙකක් ගොඩනැගී ඇති තත්වයක් තුළ සමස්ත ලංකා ගොවිජන සම්මේලනයද සයිටම් ආයතනයට එරෙහි කඳවුර නියෝජනය කරමින් තම දායකත්වය දක්වා සිටී.

ගොවි ගැටලුවලට මැදිහත්වීමට පමණක් සීමා නොවුණු සමස්ත ලංකා ගොවිජන සම්මේලනය ගොවි රැස්වීම්, කමත් සභා, ගොවි ජනතාව හා එක්ව කරන පොදු කටයුතු මෙන්ම සයිටම් ආයතනය විසින් මුදලට වෛද්‍ය උපාධිය විකිණීම වැනි සමාජීය කරුණු සම්බන්ධයෙන්ද ගොවි ජනතාව දැනුවත් කිරීම ආරම්භ කර තිබේ.

සයිටම් ආයතනයට එරෙහි ක්‍රියාමාර්ග වඩා සාර්ථකව පවත්වාගැනීම සඳහා පසුගිය මාර්තු 08වැනිදා බත්තරමුල්ල, පැලවත්ත පිහිටි ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ නියෝජිතයින් සහ සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ නියෝජිතයින් අතර සාකච්ඡාවක් පැවැත්වුණි. මෙහිදී ඉදිරියේදී ගොවිජන සම්මේලනයෙන් පවත්වනු ලබන ගොවි ජනයාගේ හමුවීම්වලදී සයිටම් අර්බුදය සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම සඳහා වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවටද අවස්ථාවක් ලබාදීමට ගොවිජන සම්මේලනය තීරණය කරන ලදී.

වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ නියෝජිතයින් සමග සාකච්ඡාව සඳහා සමස්ත ලංකා ගොවිජන සම්මේලනය නියෝජනය කරමින් එහි ජාතික සංවිධායක නාමල් කරුණාරත්න, ලේකම් ටී.බී. සරත්, සභාපති සුසන්ත කුමාර සහ එහි ජාතික කමිටු සාමාජික වසන්ත පියතිස්ස යන සහෝදරවරු සහභාගි වූහ.

# ධීවර ජනතාව පෙළගස්වන දිසා සමුළු ඇරඹේ




ධීවරයෙක් වූ ඇන්ටනි ප්‍රනාන්දු ජීවිතක්ෂයට පත්වූයේ ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව පැවති උද්ඝෝෂණයකදී රාජපක්ෂ ආණ්ඩුව එල්ල කළ වෙඩි පහරකට ලක් වීමෙනි. රාජපක්ෂවරුන්ගේ මර්දනකාරී පාලනයත්, ජනතා හඬට කන් නොදීමත් ආදී කරුණු රාශියක් මුල් කර ගනිමින්ද ඒවා කළවුන්ට දඬුවම් ලබාදීමටද පොරොන්දු වෙමින් 2015 ජනවාරි 08 වනදා බලයට පැමිණියේ මෛත්‍රීපාල සිරිසේනයි. පසුව කිසිවෙකුටත් තනිව ආණ්ඩු හැදීමට නොහැකි තත්වයක් තුළ එකිනෙකාට මුක්කු ගසමින් 'යහපාලන' ආණ්ඩුව ගොඩනැගීමට රනිල්ට හා මෛත්‍රීට සිදුවිය.

එසේ බිහිවුණු හවුල් ආණ්ඩුවටත් රාජපක්ෂවරුන්ට සිදුවූවාසේ ජනතා උද්ඝෝෂණ රාශියකට මුහුණ දීමට වත්මනේ සිදුව තිබේ. එම උද්ඝෝෂණයන්ට හේතුවූ කාරණා සොයා ඒවාට විසඳුම් දෙනවා වෙනුවට එම උද්ඝෝෂණ සීමා කිරීමට අණ පනත් ගෙන ඒමටත් නැතහොත් උද්ඝෝෂණ පැවැත්වීමට ස්ථාන යෝජනා කිරීම වැනි විහිළුකාරී දේ කිරීමටත් ආණ්ඩුව පෙළඹී සිටී.

ආණ්ඩුවේ ප්‍රධාන ආදායම් මාර්ග ලෙස බදු, දඩ හා ණය ඉලක්ක කර ගත් ආර්ථිකයක් තුළ රටේ සෑම ක්ෂේත්‍රයක්ම බිඳ වැටීමකට ලක් වෙමින් තිබේ. මේ තත්වය තුළ ධීවර කර්මාන්තයද පත්ව ඇත්තේ ඉතා බේදනීය ඉරණමකටය. ධීවර ආම්පන්න මිල ඉහළ දැමීම, වරාය, රක්ෂණ ගාස්තු ඉහළ දැමීම, විශාල දඩ මුදල් අය කිරීම ආදිය මෙන්ම ධීවර වරායන්හි ඇති ගැටලු, තොටුපොලවල්වල ගැටලුද ප්‍රමුඛ කාරණා බවට පත්ව තිබේ. රාජපක්ෂ ආණ්ඩුව මෙන්ම වර්තමාන ආණ්ඩුවද මේවා මඟ හැර යනවා මිස විසඳුම් ලැබෙන තත්වයක් නොමැත. මෙවන් වට පිටාවක් තුළ ජ.වි.පෙ.ට අනුබද්ධ සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය තම අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් ධීවර ජනතාව සංවිධානය කරමින් සිටී. එහි එක් පියවරක් ලෙස පසුගිය මාර්තු මාසයේ සිට සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ දිසා සමුළු කැඳවීම ආරම්භ කළ අතර මාර්තු මාසයේ හම්බන්තොට සහ ගාල්ල දිස්ත්‍රික්කයන්හි දිසා සමුළු පැවැත්වුණි. මාතර සහ ගම්පහ දිසා සමුළු එළඹෙන මැයි මාසයේදී පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

"අයිතීන් දිනා ගැනීමට ධීවර ජනතාව පෙළගස්වන හම්බන්තොට දිසා සමුළුව" යන තේමාව යටතේ පසුගිය මාර්තු 12වැනිදා තංගල්ල නාකුළුගමුවේදී පැවැත්වුණු අතර එහි ප්‍රධාන දේශනය ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් පැවැත්වූ අතර මේ අවස්ථාව සඳහා සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති සහෝදරයාද, සම්මේලනයේ ජාතික සංවිධායක රත්න ගමගේ සහෝදරයාද ඇතුළුව විශාල ධීවර පිරිසක් සහභාගී වී සිටියහ.

# ජන බලය ගොඩනගන විදුලි සේවක බල මුළු




මේ වන විට වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ තීරණාත්මක කාර්යභාරයක් සිදුකරනු ලබන්නේ, ජ.වි.පෙ.ට අනුබද්ධ වෘත්තීය සමිති විසිනි. හුදෙක් වෘත්තීය අයිතීන්වලට පමණක් සීමා නොවී රටේ ජාතික ප්‍රශ්න හමුවේත් කිසිදු පැකිලීමකින් තොරව මැදිහත් වන්නේත් ජ.වි.පෙ. වෘත්තීය සමිති පමණි.

එ.ජා.ප. ශ්‍රීල.නි.ප. හවුල් පාලනයක් තුළ ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු වෙමින් යද්දී රට බාර ගැනීමට විකල්පය බලවේගයකට ඇති ඉඩකඩ ඉතිහාසයේ කවරදාකටවත් වඩා විවර වෙමින් පවතින මොහොතක වෘත්තීය සමිති ව්‍යාපාරයද ඒ වෙනුවෙන් සංවිධානය කිරීමේ පුළුල් කාර්යභාරයක ජ.වි.පෙ. නිරතව සිටී.

මෙවන් වට පිටාවක් තුළ ජ.වි.පෙ.ට අනුබද්ධ ලංකා විදුලි සේවක සංගමය තම අභිමානවත් 14 වන වාර්ෂික සමුළුව "විදුලි සේවක අයිතීන් දිනා ගැනීමට, 2020 ජන බලය ගොඩනගමු" යන තේමාව යටතේ පසුගිය මාර්තු මස 28වැනිදා මහරගම තරුණ සේවා සභා ශාලාවේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයා, ලංකා විදුලි සේවක සංගමයේ ලේකම් රංජන් ජයලාල් සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නායකයෝ රැසක් මෙයට සහභාගි වී සිටියහ. එසේම උතුරු, නැගෙනහිරද ඇතුළුව විදුලි බලාගාර, කාර්යාල සහ වැඩබිම් නියෝජනය කරමින් සංගමයේ සාමාජික සාමාජිකාවෝ රැසක්ද මේ සමුළුවට සහභාගි වී සිටියහ.

මෙම අප්‍රේල් 30වැනි දිනට ශ්‍රේෂ්ඨ වියට්නාම් විප්ලවයේ 42වැනි සංවත්සරය යෙදී තිබේ. දකුණු වියට්නාමයේ පැවති ඇමරිකානු ගැති පාලනයත් ඇමරිකානු එක්සත් ජනපද ආක්‍රමණික හමුදාවත් පරාජය කරමින් වියට්නාමයට පූර්ණ නිදහස දිනා ගනු ලැබුවේද වියට්නාම් විප්ලවයේ ජයග්‍රහණය සම්පූර්ණ කරන ලැබුවේද 1975 අප්‍රේල් 30දාය.

කලක් ප්‍රංශ යටත්විජිතයක්ව පැවති වියට්නාමය ප්‍රංශ පාලනයෙන් නිදහස දිනාගෙන, ජපන් හා පසුව ආ එක්සත් ජනපද ආක්‍රමණික හමුදා පරදවා වියට්නාම් විප්ලවය ජයග්‍රහණය කිරීමට ශ්‍රේෂ්ඨ වියට්නාම් ජනතාවට නායකත්වය දෙනු ලැබුවේ එරට කොමියුනිස්ට් නායක හෝ චි මින් සහෝදරයාය. වියට්නාම් විප්ලවය ජයග්‍රහණයෙන් කෙළවර කළ හැකි වූයේ වියට්නාමයේ දේශප්‍රේමී ජනතාවගේ කැපවීමත් ඔවුනට ලැබුණු වියට්නාම් කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයත් හෝ චි මින්ගේ නායකත්ව මඟපෙන්වීමත් නිසාය.

මේ නිසා වියට්නාම් විප්ලවයට වසර 42ක් පිරෙන මේ මොහොතේ විප්ලවයේ නායක හෝ චි මින් සහෝදරයා පිළිබඳව සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් පරිවර්තනය කොට පළ කරන ලද 'අප මාවත එකලු කළ මිනිසා - හෝ චි මින්' කෘතියේ ඔහු ගැන කියැවෙන කොටසක් මෙසේ උපුටා පළකරමු.

# ජනපති හෝ චි මින්:
## අපේ පක්ෂයේත් ජාතියේත් ශ්‍රේෂ්ඨ නායකයා



වියට්නාම් ජනතාව වික්‍රමාන්විත ජන කොටසකි. ජාතිය ගොඩනැගීමේ හා ආරක්ෂණයේ දීර්ඝකාලීන ක්‍රියාවලිය තුළදී ඉතා ඉක්මනින් අප ජනතාව ජාතිකත්ව මනෝභාවය ඇති ගනිමින් ගැඹුරු ස්වදේශානුරාගයක් උපදවා ගත්හ. ප්‍රංශ අධිපත්‍යයට යටත්ව සිය වසකට ආසන්න කාල පරිච්ඡේදයකදී ද අපේ ජනතාව කිසි විටකත් වහල්භාවයට පත් නොවී ආක්‍රමණිකයන් හා ද්‍රෝහීන්ට එරෙහිව අවි ඔසවමින් අභීතව සටන් කළහ. නමුත් අතීත සියලු දේශප්‍රේමී ව්‍යාපාර ප්‍රංශ අධිරාජ්‍යවාදීන් අභිමුඛව පරාජය උරුමකර ගත්තේය.

1920 රාජකීය කැරලි නිමාවට පත්වන කාලය වනවිට අප ජනතාවගේ උද්යෝගීමත් විමුක්ති ව්‍යාපාරවල ප්‍රතිපත්ති හා උපාය මාර්ගයන් බරපතළ අර්බුදයකට මුහුණ දුන්නේය. මෙහිදී ප්‍රංශ අධිරාජ්‍යවාදීහු එක් පැත්තකින් කෲර ලෙස දේශප්‍රේමීන් භීතියට හා මර්දනයට ලක්කළ අතර අනෙක් පැත්තෙන් යටත්වීමේ මතවාදයන් මෙන්ම, සංශෝධන හා අතරමැද සාමදානයන් සඳහාත් ධෛර්යමත් කළහ.

අප සමාජයේ තරුණ නිර්ධන පංතික ස්ථරය හා ජාතික ධනපතියන් යන දේශප්‍රේමී බලවේග දෙක අතට ජාතික විමුක්ති අරගය ගත යුතු මාර්ගය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්වයක් උදාවිය. මෙම බලවේග ජනතා සහයෝගය දිනාගනු වස් තම තමන්ගේ දේශපාලන ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නට විය.

මෙම අවස්ථාවේදී ජනපති හෝචිමින් ස්වකීය විචක්ෂණභාවයද විප්ලවවාදය සඳහා ඇති අත්දැකීම්ද භාවිතා කරමින් වියට්නාම් ඉතිහාසයේ ඓතිහාසික වගකීම භාරගත්තේය.

ස්වදේශීයානුරාගය සම්බන්ධව එකල ජීවත් වූ සමහර උගතුන් හා ධනේශ්වර මානසිකත්වය සහිත සමහර විප්ලවවාදීන්ගේ සීමාකිරීම් අතික්‍රමණය කළ ජනපති හෝ චි මින්, නිර්ධන පංතික විප්ලවය සඳහා ගත යුතු ගමන්මග මාක්ස්-ලෙනින්වාදය අනුව සකස්කර ගත්තේය. "දේශය බේරාගැනීමටත් ජනතාවට විමුක්තිය උදාකිරීමටත් ඇති ඒකායන මඟ නිර්ධන පංතික විප්ලවය පමණක් බව" ඔහු අවධාරණය කළේය.

දේශානුරාගයේ සිට මාක්ස්-ලෙනින්වාදය දක්වා ගමන්මග අනුගමනය කරමින්, වියට්නාම් ජනතාවටද එම මාර්ගයේම ගමන් කිරීමට නායකත්වය දුන් ජනපති හෝ චි මින්ගේ ප්‍රථම ශ්‍රේෂ්ඨ කාර්යභාරය වූයේ වියට්නාම් විප්ලවවාදී ව්‍යාපාරයේ හා අන්තර්ජාතික කම්කරු ව්‍යාපාරය අතර සහ සම්බන්ධය ගොඩනැගීමය. ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයෙන් ආරම්භ වී ලෝකය පුරා සිටින වැඩ කරන පංතියටත් පීඩිත ජනතාවටත් විමුක්තිය සඳහා ඇති ඒකායන මාර්ගය එය පමණක් වන බව ඔහු දැඩිව විශ්වාස කළේය.

මාක්ස්-ලෙනින්වාදය වියට්නාම් ජනතාවට සේවය කරන්නේ "දගු ගමනක් යන සංචාරකයෙකුගේ පිපාසයට ජලයත්, කුසගින්නට ආහාරත් අවශ්‍ය වන ආකාරයටමය." එමගින් නිර්ධන පංතික විප්ලවවාදී මාවතකට වියට්නාම් දේශප්‍රේමීන් ආකර්ෂණය කර ගැනීමත් වැඩ කරන පංතිය ස්වාධීන දේශපාලන බලවේගයක් බවට පත්වෙමින් රට පුරා විහිදුනු ශක්තිමත් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක් බවට පත්වීමත් සිදුවිය. එකල පැවති දියුණුතම විප්ලවවාදී මතවාදය වූ මාක්ස්-ලෙනින්වාදය ආභාෂයට ගනිමින් ක්‍රියාකාරී විප්ලවවාදී ජනතාවගෙන් සැදුම්ලත් දේශප්‍රේමී ව්‍යාපාරයේත් සටන්කාමී වැඩ කරන පංතික ජනතාවගෙන් සැදුම්ලත් දේශප්‍රේමී ව්‍යාපාරයෙත් සන්ධානගත වීමේ ප්‍රතිඵලයක් ලෙස 1930 පෙබරවාරි 03වැනිදා අප පක්ෂය පිහිටුවන ලදී.

මෙම අවස්ථාව වියට්නාම් විප්ලවීය ඉතිහාසයේ අතිශයින් තීරණාත්මක හැරවුම් ලක්ෂයකි. මේ අවස්ථාව යනු මාක්ස්-ලෙනින්වාදය යටත්විජිතවාදී අර්ධ වැඩවසම් රාජ්‍යයක් තුළ ප්‍රචාරණය වූ අවධිය ලෙසත් ජනතා කැරලිවල අනර්ඝම යුගය සඳහා පළමු සූදානම් අවධිය වීමත්, වියට්නාම් ජනතාවේග ප්‍රගමනයේ ශ්‍රේෂ්ඨතම ඉදිරිපිම්ම සටහන් කළ අවධිය ලෙසත්, 1945 අගෝස්තු විප්ලවයේ අරම්භය ලෙසත් වියට්නාම් ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ හැඩග ැසෙමින් පවතින අවධිය ලෙසත් සඳහන් කළ හැකිය.

අපේ පක්ෂයේ අවුරුදු 40ක කාලපරිච්ඡේදය යනු අභිමානවත් විප්ලවවාදී අරගලයේ අවුරුදු 40ක කාල පරිච්ඡේදයම විය. එම ඉතිහාසය යනු අඛණ්ඩ විප්ලවවාදී හැඟීම් හා වික්‍රමාන්විත කැරලි ගණනාවක ඉතිහාසයයි. 1930-1931 හා 1936-1939 කාල පරිච්ඡේද විප්ලවවාදී හැඟීම්ද 1940-1945 අගෝස්තු විප්ලවයේ ජයග්‍රහණයද සනිටුහන් කළේය.

ප්‍රංශ අධිරාජ්‍යවාදීන්ට හා ඇමරිකන් ආක්‍රමණිකයන්ට එරෙහිව ප්‍රතිරෝධනය යුද්ධ දෙකක් මෙයහවූ වීර මිනිසුන්ගේ ඉතිහාසයක් වන එම යුගයේදී ජාතික විමුක්තිය හා ආරක්ෂාව සම්බන්ධයෙන් මහා ජයග්‍රහණ දිනා ගනිමින් ලෝක ජනතාවගේ සාමය, ස්වාධීනත්වය, ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජවාදය දිනාගැනීමේ දැවැන්ත සටන්කාමී ව්‍යාපාරයක ආගමනය සිදුවිය.

එම ඉතිහාසය යනු අපේ යුගයේ දැවැන්ත විප්ලවවාදී අරගල දෙකක එනම්, ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ හා සමාජවාදී විප්ලවයේ යුගයයි. ගතවූ වසර දහයක කාල පරිච්ඡේදය තුළදී දකුණු වියට්නාම් ජාතික විමුක්ති පෙරමුණ අපේ පක්ෂයේ නායකත්වය යටතේ මෙම ද්විත්ව විප්ලවීය කාර්තව්‍යයන් එකට සම්බන්ධ කරනු ලැබූයේ එක් පොදු අරමුණක් වෙනුවෙනි. එනම් උතුර ආරක්ෂා කිරීමත් දකුණට විමුක්තිය උදා කිරීමටත් අවසානයේ ඉතා සාමකාමී ලෙස එම කොටස් දෙක තනි රටක් ලෙස එක්සත් කිරීමත් සඳහාය.

ජනපති හෝ චි මින්ගේ මූලිකත්වයෙන් සැදුනු අප පක්ෂයේ නායකත්වය යටතේ අප සමස්ත ජනතාවම ඉතිහාසයේ අනර්ඝතම පිටු තුළ ලියා තබමින් අපේ රට ස්වාධීනත්වයේත් නිදහසේත් සමාජවාදයේත් යුගයකට ගෙන එනු ලැබූහ. වියට්නාම් විප්ලවය පුරා අවුරුදු හතළිහක් නායකත්වය දුන් ජනපති හෝ චි මින් අපේ ජනතාව ජාත්‍යන්තර තලයට ගෙනයමින් හා ඉතා සාර්ථකව ජාතික විමුක්ති අරගලය මෙහෙයවමින් මුළු රටේම බලය අත්පත් කර ගත්තේය. එනම් පැරණි යටත්විජිතවාදය පරාජයට පත්කළ පළමු පෙළ ජාතියක් බවට පත්වෙමින් මුළු මහත් යටත්විජිතවාදී අධිරාජ්‍යවාදයේ පරිහානිය සනිටුහන් කළේය.

මේ අනුව අධිරාජ්‍යවාදයේ හා ජාත්‍යන්තර ආරක්ෂණයේ ස්වාමියා බවට පත් වූ එක්සත් ජනපදයේ නව යටත්විජිතවාදය පරාජයට පත්කළ ඉදිරිපෙළ සටන්කාමීන් බවට පත්වීමට එයින් අපට හැකිවිය.

උතුරු වියට්නාමයේ සමාජවාදී ජයග්‍රහණයන්ද අධිරාජ්‍යවිරෝධී වැඩවසම් විරෝධී ජයග්‍රහණයන්ද අත්පත් කරගනිමින් අප පක්ෂය වැඩකරන පංතියේ ජනතාවත් සහෝදර සමාජවාදී රාජ්‍යයන්හි ජනතාවත් සම්බන්ධ කරගනිමින් වර්තමානයේ ලෝක පරිමාණ ඓතිහාසික වෙනස්වීම් ක්‍රියාවලියට නායකත්වය දෙනු ලැබීය.

ගතවූ අවුරුදු හතළිහක වියට්නාම් ජනතාවගේ විශිෂ්ට ජයග්‍රහණය යනු අප වැඩකරන පංතියේත් අප ජාතියේත් උසස්තම රුචිකත්වයන් කෙරෙහිත් විශ්වාසය තබමින් අප පක්ෂය ලබාදුන් ශ්‍රේෂ්ඨ නායකත්වයේ ප්‍රතිඵලයකි. වියට්නාම් විප්ලවයේ හා අප ජනතාවගේ සෑම ඉදිරි පියවරක්ම යනු අපරාජිත විප්ලවවාදී චින්තනය වූත්, වත්මන් යුගයේ දීප්තිමත් සත්‍ය වන්නාවූත්, මාක්ස්-ලෙනින්වාදයේ ජයග්‍රහණයයි.

එය නම් පොදු සතුරාට එරෙහිව ස්වාධීනවයත් නිදහසත් සමාජවාදයත් වෙනුවෙන් ලාඕසයේ හා කාම්බෝජයේ සහෝදර ජනතාවද සමඟ උරෙන් උර ගැටී සටන් කරන වැඩ කරන ජනතාවගේත් සමස්ත වියට්නාම් ජනතාවගේත් යුදකාමී සහයෝගීත්වයේ ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයකි.

ගතවූ අවුරුදු හතළිහක කාල පරිච්ඡේදය වියට්නාම් විප්ලවය තුළින් ලද ජයග්‍රහණ සෘජු ලෙසම නව යුගයකට අදාළව ලෝක විප්ලවයේ විකාශනය සමඟ බැඳී පවතින්නකි. එම නව යුගය යනු ධනවාදයේ සිට සමාජවාදය තෙක් සංක්‍රමණික යුගය වන අතරම ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයෙන් ඇරඹී ජර්මන්, ඉතාලි, ජපාන ෆැසිස්ට්වාදීන්ට එරෙහිව සෝවියට් දේශය දිනාගත් ශ්‍රේෂ්ඨ ජයග්‍රහණ දක්වාම විහිදෙන්නකි.

අප මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුත්තේ, සමාජවාදී රාජ්‍ය පද්ධතියේ ශ්‍රේෂ්ඨතම බලයත් සහිතව චීන විප්ලවයේ විජයග්‍රහණය විසින් මිනිස් ඉතිහාසයේ සංවර්ධනයටත්, ධනවාදී රාජ්‍යවල වැඩ කරන පංතියේ හා කම්කරු පංතියේ ජනතාවගේ ශක්තිමත් ජාතික විමුක්ති ව්‍යාපාර හා සටන්කාමී ව්‍යාපාර ඇතිවීමටත් ලෝකය පුරා පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී හා සාමය සඳහා වූ ව්‍යාපාර බිහිවීමටත් තීරණාත්මක සාධකයක් වූ බවයි.

වර්තමාන ජයග්‍රහණ අත්පත් කර ගැනීමට අප පක්ෂයත් ජනතාවත් අපරිමිත දුෂ්කරතාවයන්ට හා බරපතළ අමාරුකම්වලට මුහුණ දුන්හ. පක්ෂයේ ධජය යටතේ අපරිමිත ප්‍රමාණයක් කාඩර්වරු, පක්ෂ සාමාජිකයන්, දේශප්‍රේමීන්, සටන්කාමීන් බොහෝ පරිත්‍යාගයන් සිදු කළේ පෙරටුගාමී පන්තියේත් අප ජාතියේත් වීරත්වය ඔසවා තැබීමටත් අප පීතෘ භූමියටත් ජාතික විමුක්තිය සඳහා වූ අරමුණටත් අපරාජිත මාක්ස්-ලෙනින්වාදයටත් ඔවුන්ගේ අසීමිත විශ්වාසනීයත්වය ප්‍රකාශ කිරීම සඳහාය. මෙම වීරත්වයේ මහා ආදර්ශයන් අප ජනතාව අතරත් අප පක්ෂය තුළත් වර්තමාන පරම්පරාව හා අනාගත පරම්පරාව තුළත් සදාකාලිකව පවතිනු ඇත.

**ජනපති හෝ චි මින් යනු වියට්නාම් පොළොවේ මාක්ස්-ලෙනින්වාදය නැමති බීජ සිටුවන්නාගේ කාර්ය සිදුකරමින් වියට්නාම්වරුන්ගේ විප්ලවයේ එල දැරීමට අවස්ථාව සලසාදුන් පුද්ගලයාය. ඔහු විසින් විශාල සංඛ්‍යාවක් පක්ෂ කාඩර්වරුන් පුහුණුකරමින් අපේ පක්ෂයේ ඒක මානසිකත්වයකින් යුත් තනි ඒකකයක් බවට පත්කළේය. වියට්නාම් විප්ලවයේ ගුරුවරයා වූත් ශ්‍රේෂ්ඨ ජාතික වීරයාණන් වූත් අද්විතීය අන්තර්ජාතික සටන්කාමියා වූත්, ජනපති හෝ චි මින් පක්ෂයට නායකත්වය හා පුහුණුව ලබා දෙමින්, උසස් අත්දැකීම් හා අභිමානවත් සටන්කාමී ඉතිහාසයක්ද සහිතව නව පන්නයේ පක්ෂයක් බවට පත්කළේය.**

ගතවූ වසර දහයක කාල පරිච්ඡේදයේ අප පක්ෂයේත් ජනතාවගේත් සෑම ප්‍රගතියක්ම ජනපති හෝ චි මින්ගේ ජීවිතයේ සුවිශේෂ වූත් ආකර්ෂණීය වූත් අත්දැකීම් සමඟ බැඳී ඇත. ඔහුගේ ජීවන ක්‍රියාකාරිත්වයනුත් අපේ පක්ෂයේ හා ජනතාවගේ අරමුණුත් වියට්නාම් විප්ලවයේ සදාතනික වීර කාව්‍යයන් බවට පත්ව ඇත.

**ලී දුවාන්**



"සෑම විප්ලවයකින්ම අති විශාල ජන සංඛ්‍යාවක ජීවිත තුළ තියුණු වෙනස්කම් ඇති කෙරෙන්නේය. එවැනි වෙනසක් ඇති වීමට කල් යල් මෝරා තිබේ නම් මිස, නියම විප්ලවයක් සිදු විය නොහැකිය. එසේම, පුද්ගලයෙකුගේ ජීවිතයේ සිදුවන ඕනෑම වෙනසක් ඔහුට බොහෝ දේ උගන්වන, සාරවත් අත්දැකීම් ලබා දෙන සහ බලවත් චිත්ත වේගාත්මක කුහුල්කම් ගෙන එන ලෙසටම, විප්ලවද, කෙටි කාලයක් තුළ මුළු ජනතාවටම සාරවත් හා අගනා පාඩම් උගන්වයි."

**ලෙනින්,**
**තෝරාගත් කෘති,**
**5වැනි වෙළුම,**
**189 පිටුව**

# CIA රහසිගත අවි ගබඩාව පුපුරයි




වත්මන් ලෝකය තුළ ඔබගේ දුරකථනය පමණක් නොව ඔබ භාවිතා කරන රූපවාහිනිය පවා ඔත්තු බැලීම සඳහා යොදා ගත හැකිය. ලෝක ජනතාව අමෙරිකා එක්සත් ජනපදයේ ඔත්තු බැලීමේ ප්‍රමාණය සහ ක්‍රම පිළිබඳව දිනපතා අලුත්වන තොරතුරු දැනගනිමින් සිටී. එක්සත් ජනපදයේ මධ්‍යම රහස් ඔත්තු සේවාවේ හිටපු නිලධාරියෙකු වන එඩ්වර්ඩ් ස්නෝඩන් එරට ජාතික ආරක්ෂණ ආයතනය (NSA) සිදුකරනු ලැබූ මහාපරිමාණ ඔත්තු බැලීමේ වැඩසටහන පිළිබඳ 2013 වසරේදී හෙළදරව් කරනු ලැබීය. රාජ්‍යයක් තුළ රාජ්‍යයක් සේ කටයුතු කරන, මධ්‍යම රහස් ඔත්තු සේවයේ නවතම ක්‍රියාකාරකම් සහ එරට තුළ එයට ඇති අපකීර්තිමත් නිදහස පිළිබඳ නැවත වතාවක් හෙළිදරව් වෙමින් පවතී.

ඕස්ට්‍රේලියන් ජාතික ජුලියන් අසන්ජේ මූලිකත්වය දරන විකිලීක්ස් වෙබ් අඩවිය විසින් මෑතකදී අනාවරණය කෙරුණු නවතම ලිපි ලේඛනවලට අනුව වැදගත් තොරතුරු රැසක් හෙළිදරව් වී තිබේ. ඒ අනුව මධ්‍යම රහස් ඔත්තු සේවය, ලෝකයේ වැඩියෙන්ම භාවිතා වන ඩිජිටල් උපකරණවල ආරක්ෂණ ක්‍රමවේදයන්ගේ ඇති දුර්වලතා පාවිච්චි කරමින් තොරතුරු ලබා ගැනීමේ සහ රහසිගත මෙහෙයුම් දියත් කිරීමේ ඒකකයක් පවත්වාගෙන යයි.

2013-2016 කාලවකවානුවට අයත් සහ වර්ජිනියාවල (CIA) ඉහළම ආරක්ෂණ ජාලයකින් සොරාගත් ලිපි ලේඛන හා තෝරාගත් ලේඛන 8761ක් 'ශූන්‍ය වර්ෂය' (ZERO YEAR) නමැති තේමාව යටතේ විකිලීක්ස් වෙඩ් අඩවිය විසින් ප්‍රසිද්ධියට පත්කර තිබුණි.

විකිලීක්ස් වෙබ් අඩවියට අනුව 2016 වසර අවසානය වන විට (CIA) සංවිධානය සතුව සයිබර් අවකාශයේ ඔත්තු බලන විශේෂඥ ඔත්තුකරුවන් 5000ක් පමණ සිට ඇත. පරිගණක, Smart Phone සහ Samsung රූපවාහිනී යන්ත්‍ර තුළට පවා ඇතුළු විය හැකි වෛරසයන්, අන්තර්ජාල රහස් තොරතුරු වැඩසටහන් දහසකට වැඩි ප්‍රමාණයක් ඔවුන් සතුව ඇත. ඔවුන් සතුව තිබූ මෙම සයිබර් අවි, ඔවුන්ගේ පාලනයෙන් මිදී හිටපු සයිබර් රහස් ඔත්තුකරුවන් අතට සහ වෙනත් පුද්ගලික ආයතන අතට පත්වී ඇත. විකිලීක්ස් වෙබ් අඩවියට මෙම තොරතුරු ලැබී ඇත්තේද එවන් එක් පුද්ගලයෙකු හරහාය. විකිලීක්ස් වෙබ් අඩවියට අනුව 'වෝල්ට් 7' යන නමින් හඳුන්වන මෙය ඉතිහාසයේ විශාලතම රහස් තොරතුරු හෙළිදරව්ව වේ. මෙය තීරණාත්මක හෙළිදරව් කිරීම් මාලාවක පළමු කොටස වේ.

2012 වසරේ සිට ලන්ඩන්හි ඉක්වදෝර් තානාපති කාර්යාලය තුළ වෙසෙන ජුලියන් අසන්ජේ 'ශූන්‍ය වර්ෂය' හෙළිදරව්වෙන් පසු මෙසේ ප්‍රකාශ කළේය.

"සයිබර් ආයුධ සාර්ථක ලෙස පාලනයකට ලක් කිරීම ඉතා අපහසුය. ඔබ එවැන්නක් නිෂ්පාදනය කළේ නම් අවසානයේදී එය ඔබට අහිමි වෙනු ඇත." ඒ අතරම ඔහු මේ ප්‍රශ්නය දේශපාලන, නීතිමය, අධිකරණ වෛද්‍ය විද්‍යානුකූලව ආදී පැතිද සම්බන්ධ කරගත් සංවාදයක් ආරම්භ කළ යුතු යැයි බලකර සිටී.

### රූපවාහිනියට වඩා වැඩි යමක්

හෙළිදරව්වූ කරුණු අතරින් වඩාත් භයානකම හෙළදරව්ව වූයේ, දැනට නිෂ්පාදනය කිරීම නවතා දමා ඇති Samsung Smart රූපවාහිනී යන්ත්‍රය මගින් පවා තොරතුරු රැස්කිරීම පිළිබඳවයි.

'එක' ලෙස නම්කර තිබූ ව්‍යාපෘතිය රූපවාහිනිය අක්‍රියව පවතින විටදී පවා එතුළ සවිකර ඇති මයික්‍රෝෆෝනය මගින් කතාකරන දේ සවන් දීමට හැකියාව අත්කරගෙන තිබුණි. එමගින් රැස්කර ගනු ලබන තොරතුරු රූපවාහිනිය තුළ ගබඩා කෙරෙන අතර, රූපවාහිනිය අන්තර්ජාලය හා සම්බන්ධ වූ වහාම එම තොරතුරු CIA තොරතුරු මධ්‍යස්ථානය වෙත යවනු ලැබේ. විකිලීකිස් වෙබ් අඩවියට අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරුණේ බ්‍රිතාන්‍ය රහස් ඔත්තු සේවාවේද සහයෝගයෙනි.

### ඔබේ සාක්කුව තුළ ඇති ආයුධ

හෙළිදරව් වූ තොරතුරු අනුව රහස් තොරතුරු ඒකකයේ ප්‍රමුඛ ඉලක්කය වූයේ ජංගම දුරකථනයයි. මෙම උපකරණය මිලියන ගණනක ජනතාවක් භාවිතා කරන අතර, ඔවුන්ගේ සෑම ආකාරයකම සංවේදී තොරතුරු ඒවායේ අන්තර්ගතය.

මධ්‍යම රහස් ඔත්තු සේවයේ මෙම වැඩසටහන ඉලක්ක කර ඇත්තේ මෙම දුරකථනවල OPERATING SYSTEM කුමක් වුවද ඒවායේ ඇති දුර්වලතා පාවිච්චි කිරීමයි. එවැනි OPERATING SYSTEM එකක් තුළට රිංගූ පසු එයට ඕනෑම දෙයක් පාලනය කිරීමට හැකියාව ලැබේ. දුරකථන නිෂ්පාදන සමාගම් තමන්ගේ දුරකථනය OPERATING SYSTEM එක වැඩිය ආරක්ෂිත එක යැයි පැවසුවද මෙම ප්‍රවෘත්තියත් සමග ඔවුන් බරපතල අර්බුදයකට පත්විය.

වර්තමාන සංනිවේදනයේ පුළුල් ලෙස භාවිතා වෙන Whats APP, Signal සහ Telegram වැනි සේවාවන්ද තොරතුරු ලබාගත හැකි ස්ථාන ලෙස භාවිතා කරනු ලබයි. හෙළිදරව් කරනු ලැබූ ලිපි ලේඛනවලට අනුව මෙම සේවාවන් මගින් කතා කරනු ලබන සහ ලියා යවනු ලබන තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය උපකරණ මධ්‍යම රහස් ඔත්තු සේවාව සතුව ඇත.

මේ පිළිබඳ විශේෂඥයන් පවසන්නේ, මධ්‍යම රහස් ඔත්තු සේවය මෙම තොරතුරු ලබා ගන්නේ ඒවායේ රහස් සංකේතාංක අක්‍රිය කිරීමෙන් නොවන බවයි. මෙම දුරකථනවලට රහස් සංකේතාංක යෙදීමට පෙරම ඒවායේ ඇති දුර්වලතා පාවිච්චියට ගනිමින් ඔවුහු මෙම තොරතුරු ලබාගනිති. ඒ වෙනුවෙන් වන වයිරස දුරකථන තුළට ඇතුළු කිරීමට ඔවුන්ට හැකියාව ඇත.

### OPERATING SYSTEM ඉලක්කය

නවතම හෙළිදරව් කිරීම් අනුව ජාලගත පරිගණක, දත්ත ගබඩා සහ වෙනත් උපාංග මධ්‍යම රහස් ඔත්තු සේවයේ අවධානයෙන් ගැලවී නැත. 2013 දී ස්නෝඩන් විසින් ජාතික ආරක්ෂක ආයතනය ඇපල්, මයික්‍රොසොෆ්ට් සහ ගූගල් ආයතනවල දත්ත ගබඩා තුළට ඇතුළු වූ බව හෙළිදරව් කිරීමෙන් පසු මෙම ආයතන අර්බුදයට ගියේය.

WINDOWS OPERATING SYSTEM එක ඇති පරිගණක තුළට වෛරස් ඇතුළු කර ඒවා හැසිරවීමට මධ්‍යම රහස් ඔත්තු සේවයට හැකි බව දැන් කවුරුත් දන්නා කරුණකි. එවැනි එක් වෛරසයක් හැඳින්වූයේ 'හැමර් ඩ්‍රිල්' යන සංකේත නාමයෙනි.

විකිලීක්ස් වෙබ් අඩවියේ මෙම හෙළිදරව්ව අලුත් යුගයක් ආරම්භ කර ඇති බව බොහෝ දෙනා විශ්වාස කරති. මේ පිළිබඳව අදහස් දක්වන නව නිපැයුම්කරුවෙකු සහ පරීක්ෂණාගාර ප්‍රධානියෙකු වන සර්ජියෝ ඩි ලොස් සැන්ටෝස් පවසන්නේ, "අප විද්‍යා ප්‍රබන්ධ ලෙස සිතා සිටි දේවල් දැන් සැබෑ ලෙසම සිදුවෙමින් පවත්නා බවය. ඔහුට අනුව දැන් මෙම මෙවලම් අපරාධ සඳහාද පහසුවෙන් යොදා ගත හැකිය.

මේ පිළිබඳව අදහස් දක්වන ස්නෝඩන් මෙසේ පවසයි. "ඔබගේ රූපවාහිනිය මගින් ඔබ පිළිබඳ ඔත්තු බැලීමට මධ්‍යම රහස් ඔත්තු සේවය කාලය වැය කරන්නේ යැයි ඔබ සිතින් මවා ගන්න, ඇත්තටම එය අද සිදුවෙමින් තිබේ."

## චීනය:
### නව බැංකුව පුළුල් කරමින්




චීනයේ බීජිං නුවර මූලස්ථානය කර ගත් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ප්‍රථම වරට රටවල් 13කට නව සාමාජිකත්වය ලබා දුන්නාය. මෙම බැංකුව පිහිටුවනු ලැබුවේ 2015 වසරේදීය. ඒ සමගම බැංකුවේ නව සාමාජිකත්වය 70 දක්වා වර්ධනය වේ.

මෙලෙස සාමාජිකත්වය ලැබූ රටවල් වන්නේ ඇෆ්ගනිස්ථානය, ආර්මේනියාව, ෆීජි, හොංකොං, ටිමෝරය, බෙල්ජියම, කැනඩාව, ඉතියෝපියාව, හංගේරියාව, අයර්ලන්තය, පේරු, සුඩාන ජනරජය සහ වෙනිසියුලාවයි.

යුරෝපය හා එක්සත් ජනපදය ආර්ථික අර්බුදයට ලක්වීමෙන් පසු ලෝක බැංකුවට හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට විකල්පයක් ලෙස චීනය මුල්වී මෙම බැංකුව පිහිටුවනු ලැබීය. එහි ප්‍රධාන අරමුණ වන්නේ ආර්ථික අර්බුදය නිසා දුර්වල වූ ගෝලීයකරණය හා රටවල් අතර ඒකාබද්ධතාව වර්ධනය කිරීමයි.

## රුසියාව:
### මිසයිල තර්ජනයට එරෙහිවී



යුරෝපය තුළ සහ රුසියාවට ආසන්න මුහුදු හා සාගර තුළ රඳවා ඇති එක්සත් ජනපද මිසයිල මගින් රුසියාවට එරෙහිව රහසිගත හා හදිසි ප්‍රහාරයන් එල්ල කිරීමේ හැකියාව එක්සත් ජනපදයට ඇතැයි රුසියාව පවසයි. රුසියානු හමුදා ප්‍රධානියෙකු වන වික්ටර් පොෂ්නිකීර් මේ බව පැවසුවේ පසුගිය 28 වැනිදා ස්විස්ටර්ලන්තයේදී පැවති ලෝක ආරක්ෂාව සහ සමූහ ඝාතන අවි පැතිරවීම වැළැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සමුළුවකදීය. ඊට රටවල් 65ක් සහභාගි විය.

රුසියාවට අනුව එක්සත් ජනපදය, ඇලස්කාව, රුමේනියාව, පෝලන්තයද ඇතුළුවද යුරෝපයේ රටවල් ගණනාවක සිය මිසයිල ස්ථාන ගත කර තිබේ. එක්සත් ජනපදය ඉරානය හා උතුරු කොරියාව පෙන්වමින් චීනයට හා රුසියාවට එරෙහිව යුදමය තර්ජනයක් එල්ල කරමින් සිටී.

## එක්සත් ජනපදය:
### වැඩිම මිනිසුන් සිරගත කළ රට



චීනය පසුගිය මාර්තු 09 වනදා අමරිකා එක්සත් ජනපදයේ මානව හිමිකම් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළාය. එය නම් කර තිබුණේ '2016 වසරේ එක්සත් ජනපදයේ මානව හිමිකම් වාර්තාව' ලෙසින්ය. චීනය මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබුවේ එක්සත් ජනපදය විසින් මාර්තු 09 වනදා ඉදිරිපත් කළ චීනය පිළිබඳ මානව හිමිකම් වාර්තාවට ප්‍රතිචාර වශයෙනි.

එහිදී චීනය එක්සත් ජනපදය විවේචනය කර ඇත්තේ, එක්සත් ජනපදය තුළ මානව හිමිකම් තදින් උල්ලංඝනය වෙද්දී එය නිවැරදි කිරීම පසෙකලා අනෙකුත් රටවල මානව හිමිකම් උල්ලංඝනය වීම් පෙන්වා දෙන විනිශ්චයකාරවරයෙකු බවට පත් වී ඇතැයි පවසමිනි.

චීනය ඉදිරිපත් කළ වාර්තාවට අනුව එක්සත් ජනපදය ලෝකයේ දෙවැනි වැඩිම සිරකරු අනුපාතය දරන රටයි. එනම් එරට ජනගහනයෙන් ලක්ෂයකට සිරකරුවන් 693ක් සිටී.

2014 වසරේදී පමණක් දළ වශයෙන් එක්සත් ජනපද පුරවැසියන් මිලියන 2.2ක් සිරගත කරනු ලැබ ඇත.

එක්සත් ජනපදය තුළ ගිනි අවි සම්බන්ධ අපරාධ ඉතා ඉහළ මට්ටමක පවතී. 2016 වසරේදී ගිනි අවි සම්බන්ධ ප්‍රචණ්ඩ ක්‍රියා 58,125ක් සිදු වී ඇති අතර ඉන් 385ක් බරපතළ ගණයේ ගිනි අවි භාවිතා කිරීම් වේ. එම සිදුවීම්වලින් පුද්ගලයන් 15,039ක් මියගිය අතර 30,589ක් තුවාල ලබා තිබුණි.

2016 වසරේදී එක්සත් ජනපදය තුළ පූර්ණ කාලීන රැකියා කරන වැඩිහිටියන්ගේ ගණන 1983න් පසුව වාර්තා වූ අඩුම අගයට පත් විය. රට තුළ ආදායම් විෂමතාව ඉහළ ගියේය. මධ්‍යම පංතිය හැකිළුණි. පහළ පංතීන්ගේ ජීවන තත්වය කඩා වැටුණේය.

මේ වන විට එක්සත් ජනපද පුරවැසියන් 07 දෙනෙකුගෙන් එක් අයෙක් දුගීභාවයෙන් පෙළෙයි. එනම් අඩුම වශයෙන් පුද්ගලයන් මිලියන 45ක් දුගීභාවයේ ගැලී ජීවත් වෙති.

# කර්මාන්තවලට මළගම කැඳවන චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම



"සමාජයේ වෙනස්වීම සිදුවන්නේ, එහි පවතින ප්‍රතිවිරෝධයන්ගේ වර්ධනය හේතුවෙනි. නිෂ්පාදන බලවේග සහ නිෂ්පාදන සම්බන්ධතා අතර ප්‍රතිවිරෝධයේත්, පංති අතර ප්‍රතිවිරෝධයේත්, අභාවයට යන පරණ දේ හා නැගී එන අලුත් දේ අතර ප්‍රතිවිරෝධයේත් වර්ධනය හේතුවෙනි. පැරණි සමාජය යට කරගෙන අලුත් සමාජයට ඉදිරියට වර්ධනය වීමට ඉඩ දෙන්නේත් මේ ප්‍රතිවිරෝධය නිසාය."

**මාඕ සේතුං**
**තෝරා ගත් කෘති, 1කාණ්ඩය, 314 පිටුව**

ශ්‍රී ලංකා ආර්ථිකය දායකත්වය සපයන ප්‍රතිශතය මූල්‍ය අගයෙන් අඩු වුවත්, දායකවන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 90%ක් පමණ කර්මාන්ත ආර්ථිකයට දායක වී ඇත්තේ, කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත විසිනි. දශක 03ක් පැවැති යුද්ධය මධ්‍යයේත් විදේශීය වෙළඳපොළෙන් එල්ල වූ නොයෙක් තර්ජන - කොන්දේසි යටතේත් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය අඛණ්ඩව පවත්වා ගැනීමට එම කර්මාන්තකරුවන්ට හැකියාව තිබුණි. නමුත්, වර්තමාන ඊනියා 'යහපාලන පාලනය' විසින් යෝජනා කරනු ලැබ ඇති චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මගින් දේශීය කර්මාන්තකරුවන්ට හා ඔවුන්ගේ කර්මාන්ත ව්‍යාපාර මුළුමනින්ම බිඳවැටෙන තත්වයක් උද්ගතව ඇත. දැනට ක්‍රියාත්මක වන චීන-ශ්‍රීලංකා වෙළඳ හුවමාරු - (භාණ්ඩ හුවමාරු) ගිවිසුමේ කොන්දේසි සියල්ල වෙනස් කරමින් එම යෝජිත ගිවිසුම මගින් මුළුමනින්ම ලංකාවේ කර්මාන්ත චීන වෙළඳපොළට යට කිරීමක් සිදුවන තත්වයක් උද්ගතව ඇත.

දැනට යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම මගින් ඉතා බරපතළ ලෙස ලංකාවට එවීමට නොහැකි භාණ්ඩ ලෙස (ඍණ ලේඛනය -Negative List) මෙතෙක් පැවැති භාණ්ඩ ලැයිස්තුවේ ප්‍රතිශතය 40% සිට 10% ක් දක්වා ඉවත් කිරීම මෙහි පළමු පියවරයි.

එසේම, අදාළ ගිවිසුම ක්‍රියාත්මක කිරීමෙන් පසු පස්වන වසරේ සිට චීන භාණ්ඩ ආනයනය සඳහා පනවා ඇති සෙස් (Cess) බද්ද වසර 05ක් තුළ ක්‍රමයෙන් ඉවත් කිරීම යන ප්‍රධාන කොන්දේසි දෙක කර්මාන්ත ක්ෂේත්‍රය මුළුමනින්ම තර්ජනයට ලක් වීමට ප්‍රධාන හේතු ලෙස කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් සහ කර්මාන්ත වාණිජ සංගම්වල මතය බවට පත්ව ඇත.



ලෝක ආර්ථිකයේ ධනේශ්වර ආර්ථික ප්‍රබලයින් පවා තමන්ගේ රටවල ජාතික ආර්ථිකයන් කඩා වැටීමට ඉඩ නොතබන ආරක්ෂණවාදී ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කරන මොහොතක ලංකාවේ පවතින ආරක්ෂණ නීති රීතින්ද ලිහිල් කිරීම පුදුම සහගතය.

### සෙස් ඉවත් කිරීමේ ප්‍රතිවිපාක

10%ක ඍණ ලේඛනයන් (Negative List) ක්‍රියාත්මක කිරීම නිසා ලංකාවට ඇතිවිය හැකි ආර්ථික ප්‍රතිවිපාක බොහොමයකි. මෙමගින් ඉවක් බවක් නොමැතිව ලංකාව තුළට දැනට ගලා එන ප්‍රමාණයටත් වඩා චීන භාණ්ඩ ආනයනය කිරීමට ඉඩ පාදා දීමෙන් ආනයන - අපනයන පරතරය තවත් වැඩිවිය හැකිය.

එසේම තවදුරටත් ලංකාවේ ආර්ථිකයට දැරිය නොහැකි මට්ටමක චීන ලාභ භාණ්ඩ ලංකාවේ ආර්ථිකයට ගොඩගැසීමෙන් තවත් අර්බුදයක් අනාගතයටද බලපෑ හැකිය. ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැතිකමින් විනාශකාරී මට්ටමකට පත් විය හැකිය.

අධික බැංකු පොලී අනුපාත, රුපියල අවප්‍රමාණය වීමේ අවාසි කොන්දේසිය, ආයෝජන ප්‍රතිපත්තිය අඛණ්ඩ නොවීමේ ගැටලු වැනි සමස්ත ආර්ථිකයේ දුබලකම නිසාම කර්මාන්තකරුවන් මුහුණ දී ඇති දහසක් ප්‍රශ්න මේ නව අර්බුදයද එකතු වීමෙන් මෙම වෙළඳ ගිවිසුම යටතට ගැනෙන භාණ්ඩ දේශීයව නිපදවන කර්මාන්තකරුවන් අනාථ වීම නොවැලැක්විය හැකිය.

"ලංකාව අද පවතින්නේ, තීරණාත්මක ආර්ථික අර්බුදයක් ආසන්නයේ නොව අර්බුදයක් මුදුනේය. ගිනිකන්දක් නම් මේ අර්බුදය දැන් එය පුපුරා යාමට ආසන්න මට්ටමේ පිහිටා ඇති බව නිසැකය. අද වන විට රුපියල කඩාවැටෙන වේගයේ තරමට හෙට දවසේ කවුරුන් මේ ආර්ථිකයේ පවතීද යන්න සැක සහිතය. විශේෂයෙන් දේශීය කර්මාන්තකරුවන්ගේ පැවැත්ම වූ කලී මේ අනතුරේ ඉදිරියෙන්ම සිටින පිරිසක් බවට පත්ව අවසන්ය."

2017 ජනවාරි 16 වැනි දිනැතිව, ආර්ථික උපාය මාර්ග සහ ජාත්‍යන්තර සබඳතා අමාත්‍යවරයාගේ ලේකම් වෙත අග්‍රාමාත්‍යවරයාගේ ලිපි ශීර්ශය යටතේ යවන ලද ලිපියක සඳහන් කර ඇත්තේ, අගමැතිවරයාගේ ආර්ථික කලමනාකාර කමිටුව විසින්, දෙරටේ ආර්ථික කටයුතු (චීන/ශ්‍රී ලංකා) ඉදිරි වසර 20ක් තුළ 90%ක් ලිබරල්කරණය කිරීම යටතේ ඍණාත්මක ලැයිස්තුව 10%ක් දක්වා අඩු කිරීමටත් චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSCFTA) ආරම්භ කර වසර 5කින් සියලුම සෙස් බදු බිංදුව දක්වා ඉවත් කිරීමටත් තීරණය කර ඇති බවය.

ඒ අනුව ඉතා පැහැදිලි කාරණය වන්නේ, මුළු මහත් රටේ කර්මාන්තකරුවන්ගේ අනාගතය තීරණය කර ඇත්තේ පාර්ලිමේන්තුවත්, කැබිනට් මණ්ඩලයවත් නොව අගමැති - මලික් සමරවික්‍රම කුස්සි කැබිනට්ටුව විසින් බවය.

ලංකාව අද පවතින්නේ, තීරණාත්මක ආර්ථික අර්බුදයක් ආසන්නයේ නොව අර්බුදයක් මුදුනේය. ගිනිකන්දක් නම් මේ අර්බුදය දැන් එය පුපුරා යාමට ආසන්න මට්ටමේ පිහිටා ඇති බව නිසැකය. අද වන විට රුපියල කඩාවැටෙන වේගයේ තරමට හෙට දවසේ කවුරුන් මේ ආර්ථිකයේ පවතීද යන්න සැක සහිතය. විශේෂයෙන් දේශීය කර්මාන්තකරුවන්ගේ පැවැත්ම වූ කලී මේ අනතුරේ ඉදිරියෙන්ම සිටින පිරිසක් බවට පත්ව අවසන්ය.

ආණ්ඩුවට අර්බුදය හමුවේ ඇති පිළිතුරද දැන් පැහැදිලිය. එක්කෝ පවතින ජාතික සම්පත් විකුණා දැමීමය. එහිදීද ඉදිරියේම නියෝජනය කරනුයේ චීනය සහ ඉන්දියාවය. ඔවුන් ලංකාවට ලංසු තබන්නන් බවට පත්වී හමාරය. හම්බන්තොට වරාය, ත්‍රිමලේ වරාය මේ දෙමස්සිනාලා විසින් කුණු කොල්ලයට මිලදී ගනු නියතය. ඒ අතරම චීන-ශ්‍රීලංකා නිදහස් වෙළඳ ගිවිසුමකින් සිදුවිය හැක්කේ, ආර්ථිකයට හුස්ම පොදක් වැටීමක් නොව තව තවත් අගාධයටම ආර්ථිකය ඇදගෙන යාමකි.

ආර්ථික අර්බුදයේ තීරණාත්මක කොටසක බලපෑමකට ලක්ව ඇති සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් මුහුණ දෙන මෙම සංකීර්ණතා ගැටලුවට විසඳුමක් ලබාදීම රජයේ වගකීම බව අපි අවධාරණය කරමු. නමුත් එය හුදෙක් වාක්‍ය ඛණ්ඩයක් බවට පත්විය හැකිය. එබැවින් ජනතාව සතු වගකීම වනුයේ, ඉහත තත්වය වළක්වාලීමට පෙරමුණ ගෙන ක්‍රියා කිරීමය.

# සිතුට වෙනුවට සිතට බරක් වූ අවුරුද්ද?



එළැඹ ඇත්තේ අවුරුදු සමයයි. ලංකාවේ බහුතරයක් කාන්තාවෝ අවුරුද්ද සැමරීමට කල් ඇතිව සිටම සූදානම් වෙමින් සිටිති. අද දවසේ ධනේශ්වර සමාජය විසින් උරුම කර දී ඇත්තේ ඉස්පාසුවක් නොමැති ජීවිතය. එවැනි ජීවිත ගත කරන බොහෝ දෙනෙක් අවුරුදු නිවාඩුව තම නෑ හිත මිතුරන් හමුවීමට, ඔවුන් සමග සුහදත්වය බෙදා හදා ගැනීමට ඇති අවස්ථාවක් බවට පත් කරගෙන සිටිති. එනිසා පවුලේ අයට, නෑ හිතමිතුරන්ට ලබා දෙන තෑගි බෝග, සංග්‍රහවලට යන වියදම් ගෙවී ගිය මාර්තු මාසයේ සිටම කාන්තාවන්ගේ ඔළුවට අමතර පීඩාවක් ගෙන දී ඇති බවට සැක නැත.

අලුත් අවුරුදු සමය තුළ සතුට, විනෝදය, සුහදත්වය වර්ධනය විය යුතු වුවත් වැඩි වන ජීවන වියදම හමුවේ බහුතරයකට එය මහා බරක් වී හමාරය. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව 2017 වසරේ ජනවාරි මාසයේ 5.5%ක් වූ උද්ධමනය පෙබරවාරි මාසය වනවිට 6.8% ක් දක්වා ඉහළ ගොස් ඇත. ජනවාරි මාසයේ 4.5% ක් වූ ආහාරමය ද්‍රව්‍යවල උද්ධමනය පෙබරවාරි මාසයේ 7.7%ක් දක්වා ඉහළ ගොස් ඇත. ආණ්ඩුවේ නිල සංඛ්‍යාලේඛනවලට අනුව පෙනී යන්නේ, මාර්තු මාසයේ උද්ධමනය තවත් වර්ධනය වනු ඇති බවත් අවුරුදු සමය වනවිට එය තවත් ඉහළ යනු ඇති බවත්ය. අවුරුදු සිරිත් විරිත්වලට අනුව යමින් පවුල තුළ වැඩ කටයුතු කිරීමට මැදිහත් වන්නේ බොහෝ විට කාන්තාවන්ය. දරා ගැනීමට නොහැකි භාණ්ඩ මිල හමුවේ තම පවුලේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට නොහැකි තත්වයක් තුළ වඩාත් අපහසුතාවයන්ට මුහුණපාන්නේත් කාන්තාවන්ය.

එසේම මේ දිනවල වේගයෙන් පැතිර යන ඩෙංගු රෝගයෙන් මේ වනවිටත් ළමුන් හා මව්වරුන්ගේ ජීවිත අවදානමකට පත්ව ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛනවලට අනුව 2017 වසරේ ගෙවී ගිය මාස තුන තුළ වාර්තා වී ඇති ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 24 562කි. එයින් මේ වනවිට 40 දෙනෙකු මරණයට පත්ව ඇත. මෙම රෝගය වැඩිම කර්මාන්ත සංඛ්‍යාවක් පවතින බස්නාහිර පළාතේ හා ධීවර පවුල් වෙසෙන නැගෙනහිර වෙරළ තීරයේ වඩාත් ශීඝ්‍රයෙන් පැතිර යන බව ඔවුහු පවසති. ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇනින්නා සේ ආර්ථික ප්‍රශ්න හමුවේ පීඩාවට පත්ව ඇති කාන්තාවන්ට කාලීනව මුහුණ පෑමට සිදුව ඇති මෙවැනි ප්‍රශ්නවලින්ද අඩුවක් නැත.

පසුගිය කාලයේ විටින් විට මුහුණපෑමට සිදු වූ ස්වාභාවික විපත් හමුවේ පොදුවේ සියලුදෙනා පීඩාවට පත්වුවත් පවුල තුළ වැඩි කාර්යභාරයක් කරනු ලබන කාන්තාවෝ එවැනි දෑ හමුවේ දැඩි පීඩනයකට ලක් වී සිටිති. ලංකාවේ කාන්තාවන් ගෙන් සැලකිය යුතු පිරිසක් නියැලෙන්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළය. පසුගිය කාලයේ පැවැති නියං තත්වය තුළ තම වගාවන්ට සිදුවූ හානිය තුළ ඔවුන් වඩාත් වැඩි ආර්ථික පීඩනයකට ලක්ව ඇත. ආණ්ඩුවේ බලධාරීන් පැවසූ පරිදි හානි සිදු වූ වගාවන්ට ලබාදෙනවා යැයි කියූ සොච්චම් වන්දි මුදල පවා මේ වනතෙක් ලබා දී නොමැත. පසුගිය ගංවතුර හා නාය යෑම්වලින් විපතට පත් ජනතාවගෙන් වැඩි පිරිසකට තවමත් සාධාරණයක් ඉටු වී නොමැත. ඔවුන් තවමත් සිටින්නේ ජීවත්වීමට පවා නුසුදුසු පහසුකම් නොමැති ස්ථාන තුළය.

මෙවන් තත්වයක් සහිත වටපිටාවක් තුළ අවුරුදු සමය කාන්තාවන් බහුතරයකගේ ජීවිතවලට යහපත් වනු ඇතැයි සිතිය නොහැකිය. කාන්තාවන් හා ළමුන් වෙනුවෙන් වෙනමම අමාත්‍යාංශ තිබුණද එමගින් කාන්තාවන් සවිබල ගන්වන හෝ විශේෂිත ගැටලුවලට මුහුණ පා ඇති කාන්තාවන් වෙනුවෙන් විශේෂිත වැඩසටහන් හෝ ක්‍රියාත්මක වන්නේ නැත. පසුගිය ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් කාන්තා අමාත්‍යාංශය සංවිධානය කර තිබූ වැඩසටහන දෙස බැලූ විටද එය මනාව පැහැදිලි වේ. ඉවුම් පිහුම්, රූපලාවන්‍ය, කේක්, මල් හා මෝස්තර ප්‍රදර්ශන පිළිබඳ වැඩසටහන්වලින් කාන්තාවන් සවිබල ගැන්විය හැකියැයි සිතන්නේ නම් එය මුලාවකි. ලාංකේය බහුතරයක් කාන්තාවන්ගේ ගැටලු සම්බන්ධයෙන් කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන් සම්පාදනය කළ නීති රීති හෝ සාධනීය කටයුතු මේ යැයි කියා සඳහන් කිරීමට පවා නොහැකිය. එසේ වුවත් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ගොඩනැගිලි කුලිය පමණක් මසකට රුපියල් එක් කෝටි හතලිස් ලක්ෂ පනස් දහස් හතලිස් අටක් දක්වා ඉහළ නැග ඇත.

ආර්ථික හා සමාජීය වශයෙන් අර්බුද ගණනාවක ගිලී ඇති සමාජයක් තුළ අපට සුභදායී අවුරුද්දක් බලාපොරොත්තු විය නොහැකිය. එවැනි සමාජයක් වෙනස් කිරීමට කාන්තාවන් ලෙස අපි මැදිහත් නොවන තාක්, අවසන අපට ඉතිරිවන්නේ මානසික අසහනය පමණි.

## එක හඬින් ගීතයක් සුගැයෙනු සත්තමයි ළග දිනකදී...

ආදරය හදවතේ ගැඹුරේම සඟවාන
මිහිරිවට එළිමහනෙ ගී ගැයූ කොවුලාන
ගිනි බිඳුණු හදවතින් ගැලූ ලේ අපමාන
ඒ නිසයි එරබඳුත් මේ තරම් රතුපාට

හදවතේ රිද්මයයි උස් හඬින් සුගැයුනේ
ලෙයින් යකඩින් සිදුරු කළ හැකිද හදවතේ
පරපුරක අරමුණයි මිය නොයා පිබිදුනේ
කොවුලනේ නුඹයි මග කියා සමුගෙන ගියේ

යම රජුන් මිහිපිටම වැජඹෙනා කාලයේ
නර කැළම නිහඬවම නිදියනා යාමයේ
අධම යුගයක පවුරු බිඳහෙළන මේ යුගේ
වසත් ස්වරයයි, තනුව නොමියෙනා-නුඹ ලයේ

බොර දියේ බැස කුඩ මසුන් සොයන
කන කොකුන් ඇත අනේ සිල් රකින
බක් මහට තව උරුමකම් කියනු රිසින
කෑරලුන් ඇත කොවුල් ගී වරද්දා ගයන

ගල් බොරළු කැට මතින් මිණි මුතුයි සුදිලුනේ
රටේ විපතටද මේ ගොම රිටිම මතු වුනේ
වනේ වන සපුන්ටත් වින කරන මිනිසුනේ
ධනේ බල බිඳින දින - බොහෝ ඈතක නොවේ

නිදාහුන් බිහිරන් අවදිකර
දණින් වැටෙන්නට නොදී
ගොළුවනුත් හඬ නගා හිනැහෙන
සිහිනයක් අප තුළ ඇතී
බක් මහේ වෙන තතේ හැඬවුන
මිහිර ස්වරයට පණ දිදී
එක හඬින් ගීතයක් සුගැයෙනු
සත්තමයි ළඟ දිනකදී



## සිව්දෙසින්

### මව්කිරි විකිණීම තහනම් කරයි!



කාම්බෝජයේ සමහර මව්වරුන් විසින් එක්සත් ජනපදයේ මව්වරුන්ට මව්කිරි විකිණීම කාම්බෝජ රජය විසින් තහනම් කරනු ලැබ තිබේ.

මෙම ව්‍යාපාරය විසින් දුප්පත් කාන්තාවන් වාණිජ අරමුණක් ඇතිව හා ලාභය පරමාර්ථ කරගෙන සූරාකෑමකට ලක්කර ඇති බවත් මව්කිරිවලට මිලක් නියම නොකළ යුතු බවත් යුනිසෙෆ් ආයතනය පවසයි.

පසුගිය වසර දෙකක කාලයක් තිස්සේ කාම්බෝජයේ ඇතැම් කාන්තාවන් ඔවුන්ගේ අතිරේක මව්කිරි 'ඇම්බ්‍රෝෂියා ලැබ්ස්' නම් සමාගමකට සපයා ඇත. මව්කිරි අවුන්සයක් සඳහා ඩොලර් ශත 50ක් මව්වරුන්ට ගෙවා ඇති අතර එම වටිනාකමට වඩා අට ගුණයකට වැඩි මුදලකට සමාගම විසින් මව්කිරි එක්සත් ජනපදයට විකුණා ඇත. මාර්තු 28 වන දින කාම්බෝජයේ රජය විසින් මව්කිරි අපනයනය කිරීම වහා තහනම් කරනු ලැබ තිබෙන්නේ මෙම තත්වය තුළය.

### හිංසනයට එරෙහිව වීදියට...




කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහි හිංසනය නිමා කරන්නැයි ඉල්ලා දහස් ගණනක කාන්තාවෝ මධ්‍යම ලන්ඩනයට මාර්තු 11 දින එක්රැස් වී විරෝධතාවක යෙදුණි. 2007 වසරේ සිට 'කාන්තාවන්ට එරෙහි මෙම විශ්ව වසංගතයට' එරෙහිව වාර්ෂිකව විරෝධතා ව්‍යාපාරය පවත්වන බව එහි සංවිධායිකාවක් පැවසීය. එම විරෝධතාවට සහභාගි වූ තවත් කාන්තාවක් කියා සිටියේ, තමන් මේ වෙනුවෙන් යමක් කළ යුතු බවත් ඒ සඳහා සමාජයත්, හදවත් සහ අදහස්වල වෙනසක් කිරීමට සිදුවන බවත්ය.

> "නිදහස් චින්තකයෝ යනු පූර්ව විනිශ්චයන්ගෙන් සහ ස්වකීය සම්ප්‍රදායන්ද, වරප්‍රසාදයන්ද, ඇදහිලි හා විශ්වාසයන්ද හා ගැටෙන සියල්ල අවබෝධ කරගැනීමට බියෙන් තොරව ස්වකීය මනස මෙහෙයවීමේ කැමැත්තෙන් කටයුතු කරන්නෝය. මෙවැනි මනෝභාවයන් සුලබ නොවන නමුත් නිවැරදි චින්තනයක් සඳහා එය අත්‍යවශ්‍ය වේ"
>
> ලියෝ තෝල්ස්තෝයි



# දැනුම විකිණිය හැකිද?

දැනුම යනු සමස්ත මානව ඉතිහාසය පුරාම මිනිසාගේ ක්‍රියාකාරීත්වය තුළ එකතු කර ගත් අත්දැකීම්වල සමස්තය බවත් අපගේ දැනුම තුළ සත්‍යය පිළිබිඹු වීමට නම්, ලෝකය තේරුම් ගැනීමේ නිවැරදි ආකාරයන් අනුගමනය කළ යුතු බවත් අපි කතා කළෙමු.

මානව වර්ගය සිය ඉතිහාසය පුරා වෙහෙසවී, මහා කැපකිරීම් කොට සොයා ගත්, උගෙන ගත් ඒකරාශී කරගත් මහා දැනුම් සම්භාරයක් සමාජයට දායාද කොට තිබේ. නූතන සමාජයේ ජීවත් වන මිනිසා එම දැනුම් සම්භාරය විධිමත් ආකාරයෙන් මෙන්ම අවිධිමත් ආකාරයෙන්ද පරපුරෙන් පරපුරට දායාද කරමින් නව දැනුම් එකතු කර ගනිමින් ඉදිරියට යයි. අතීත දැනුම අනාගත පරපුර වෙත ක්‍රමවත්ව, විධිමත්ව, විද්‍යාත්මකව ලබා දෙන ආකාරය අප හඳුන්වන්නේ අධ්‍යාපනය නමිනි. අධ්‍යාපනය මගින් අප සමාජයට ලබා දෙන්නේ සමස්ත ඉතිහාසයක අප දන්නා හා නොදන්නා ගැහැනුන් හා මිනිසුන් විසින් එක්රැස් කළ අත්දැකීම් හා දැනුමය. එය නැතිව සමාජයට ඉදිරියට යා නොහැක.



"මිනිස් වර්ගයා එක්රැස්කළ ඥාන සමුදාය අවබෝධ කර නොගෙන කෙනෙකුට කොමියුනිස්ට්වාදියෙකු විය හැකි යැයි ඔබ නිගමනය කරතොත්, ඔබ කරන්නේ බරපතළ වරදකි. කොමියුනිස්ට්වාදය එම ඥාන සමස්තයේ ප්‍රතිඵලයයි. එනිසා එම ඥාන සමස්තය සාක්ෂාත් කරගන්නේ නැතිව කොමියුනිස්ට් සටන්පාඨ පමණක් හා කොමියුනිස්ට් විද්‍යාවේ නිගමනයන් පමණක් ඉගෙන ගැනීම සෑහේ යැයි සිතීම වරදකි"

**ලෙනින්,**
**තෝරාගත් කෘති,**
**11වැනි වෙළුම,**
**60-61 පිටු**

### වෙළඳපොළට ගෙනා දැනුම

මේ වනවිට අපේ රට තුළ දැවැන්ත සංවාදයක් හා විශාල උද්ඝෝෂණ රැල්ලක් මතුව තිබෙන කරුණක් තිබේ. ඒ, පෞද්ගලික වෛද්‍යවිද්‍යාලයට එරෙහිව හා පොදුවේ අධ්‍යාපනය පෞද්ගලීකරණයට එරෙහිවය. අධ්‍යාපනය පෞද්ගලීකරණය යනු නොමිලේ ලබා දෙන අධ්‍යාපනය මුදලට විකිණීමේ අවස්ථාවයි.

ධනවාදය තුළ ධනපතියාට, ධනපති ආණ්ඩුවලට සෑම දෙයක්ම වෙළඳ භාණ්ඩයකි. ධනවාදය පවතින්නේ ප්‍රාග්ධනය මූලික කරගෙනය. ප්‍රාග්ධනයේ පැවැත්ම සඳහා එය සෑම විටම අතිරික්ත වටිනාකම් එකතු කර ගනිමින් ප්‍රසාරණය විය යුතුය. එනම් 'ලාභ' ලැබිය යුතුය. ඒ අර්ථයෙන් ගත කළ ධනවාදය ලාභය මත පදනම් වූ සමාජයකි. ඒ නිසා එහි සෑම දෙයක්ම, මානව සබඳතා පවා විකිණීමට තබා තිබේ. ධනවාදය තුළ දැනුම වෙළඳ භාණ්ඩයක් වන්නේ ඒ නිසාය. ලංකාවේ වර්තමානයේ වෛද්‍ය අධ්‍යාපනය විකුණන සයිටම් මුදලාලිගේ කඩයේ වෛද්‍යවරයෙක් වීමට දෙන දැනුමේ වටිනාකම රුපියල් ලක්ෂ 125ක් ලෙස මිල කර තිබේ. මීට අමතරව නිතිපතා ටියුෂන් කඩවලද විවිධ මිල ගණන්වලට අධ්‍යාපනය විකිණේ. අධ්‍යාපනය ලබා දෙන තැනැත්තා ජීවත් විය යුතු නිසාත් ඔහු කරන සේවයට ගෙවීමක් කළ යුතුය. ඔහුගේ ශ්‍රමයට ගෙවිය යුතුය. ඒ ගැන විවාදයක් නැත. එහෙත් අතීත පරපුරක් විසින් නිපදවූ දැනුම තමන්ගේ දෙයක් සේ වෙළඳපොළේ විකිණීමට ඔහුට අයිතියක් නැත. එනම් අධ්‍යාපනයට මිලක් නියම කළ නොහැක.

### නරුමයින් හදන සමාජයක්

සමාජමය දැනුම සමාජයේ පැවැත්ම සඳහා බෙදා හදා ගැනීම, එය පරපුරෙන් පරපුරට සම්ප්‍රේෂණය කිරීම සමාජ කාර්යයක සිට වෙළඳාමක් දක්වා පටු වූ විට සිදු වන්නේ කුමක්ද? සියල්ල මුදලින් මැනීමට, සියල්ල ලාභය මත තීරණය කිරීමට පුරුදු කළ විට සිදු වන්නේ කුමක්ද? ඒ සමාජයක යහ පැවැත්මට අත්‍යාවශ්‍ය පොදු සාධක වන සාමූහිකත්වය, මනුෂ්‍යත්වය බිඳවැටී, නග්න ආත්මාර්ථකාමීත්වය මතු වීමත් ඒ තුළ මිනිසා නරුමයෙක් බවට පත්වීමත්ය. බටහිර චින්තකයෙක් හා දාර්ශනිකයෙක් වූ ඔස්කා වයිල්ඩ් වරක් නරුමයා කවුද යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් පවසා තිබුණේ "නරුමයා යනු හැම දේකම මිල දන්නා එහෙත් වටිනාකම නොදන්නා පුද්ගලයාය." යනුවෙනි. ධනවාදය, විශේෂයෙන් නව ලිබරල්වාදී ධනවාදය දැන් බිහි කරමින් සිටින්නේද එවැනි මිනිසුන්ය.

ධනවාදය බිහි වීමෙන් පසු ලෝකයේ එක් එක් නිර්මාණ බිහි කළ හෝ සොයාගත් අයට එහි අයිතිය තමන් වෙත තබා ගැනීමට නෛතික ක්‍රමයක් බිහි කර දී තිබේ. ඒ 'පේටන්ට්' අයිතියයි. එහෙත් දැනුම කිසිවෙකුගේ නමට 'පේටන්ට්' බලපත්‍රයකින් පැවරිය නොහැකිය. මන්ද දැනුම යනු සමාජමය ප්‍රපංචයක් වන නිසාය.

### දැනුම හා පේටන්ට්

ධනවාදය බිහි වීමෙන් පසු ලෝකයේ එක් එක් නිර්මාණ බිහි කළ හෝ සොයාගත් අයට එහි අයිතිය තමන් වෙත තබා ගැනීමට නෛතික ක්‍රමයක් බිහි කර දී තිබේ. ඒ 'පේටන්ට්' අයිතියයි. එහෙත් දැනුම කිසිවෙකුගේ නමට 'පේටන්ට්' බලපත්‍රයකින් පැවරිය නොහැකිය. මන්ද දැනුම යනු සමාජමය ප්‍රපංචයක් වන නිසාය. අපගේ දැනුම තුළ පවතින අත්දැකීම් හා පරිසරය පිළිබඳ අවබෝධය අපට ලබා දී ඇත්තේ විද්‍යාඥයින්, දාර්ශනිකයින්, අධ්‍යාපනඥයින් පමණක් නොවේ. ඔවුන්ට අවශ්‍ය වන මූලික දැනුමේ සිට බොහෝ දේ අපට දැනුම ලෙස ලබා දී ඇත්තේ ඉතිහාසය පුරා ජීවත් වූ අප නාඳුනන මිනිසුන්ය.

සහල් ආහාරයට ගත හැකි බව මුල්වරට සොයා ගත්තේ කවුද? එවැන්නෙක් ගැන අපි නොදනිමු. එහෙත් සොබාදහම තුළ කැලෑවල තිබූ විවිධ ධාන්‍ය වර්ග අතරින් අප කෑමට ගන්නා සහල් ඇතුළු ධාන්‍ය වර්ග කෑමට ගත හැකිය යන දැනුම සමාජයට ලබා දී ඇත්තේ, ආදි කාලයේ ජීවත් වූ මිනිසුන්ය. ඔවුන් ඒ සඳහා බොහෝ වෙහෙස වන්නට ඇත. ආහාරයට ගත නොහැකි දේ ආහාර ලෙස ගෙන මිය යන්නටද ඇත. විවිධ පැලෑටි වැඩෙන පරිසරයක් තුළ විෂ සහිත පැලෑටිවලින් විෂ නොවන පැලෑටි අපට හඳුන්වා දී තිබෙන්නේ, කෘෂි විද්‍යාඥයින් නොවේ. කිසිදු විද්‍යාවක් නොදැන සිටි ආදි කාලීන මිනිසාය. දැන් අපි විද්‍යාත්මකව සංවර්ධනය කර ගෙන තිබෙන්නේ එම මිනිසුන්ගේ දැනුමය. එබැවින් ආහාර පිළිබඳ අපේ දැනුමේ ආරම්භක හිමිකරුවන් ලංකාවේ නම් මෙයට අවුරුදු 12,000 කටත් පෙර ජීවත් වූ මිනිසුන්ය. ආචාර්ය රත්නසිරි ප්‍රේමතිලක මහතා විසින් කරන ලද පර්යේෂණයකදී මෙයට වසර 12,000කට පමණ පෙර හෝර්ටන් තැන්නේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික දඩයක්කරුවන් එම ප්‍රදේශවල ධාන්‍ය වගා කළ බවට සොයා ගෙන තිබේ යැයි පුරාවිද්‍යාඥයකු වන මහාචාර්ය රාජ් සෝමදේව මහතා සඳහන් කර තිබේ. මිනිසාගේ දැනුමේ ඉතිහාසය ඒ තරම්ම පැරණිය. එම පැරණි ඓතිහාසික දැනුම සංවර්ධනය වීමෙන් බිහි වූ වත්මන් දැනුම ධනවාදයේ ප්‍රාග්ධන හිමියන් කිහිපදෙනෙක් විසින් යළි ජනතාවටම වැඩි මිලට විකිණීම හා ඉන් ලාභ ලැබීම මානව වර්ගයාට කරන නිගරුවකි.

### සමාජමය විය යුතු දැනුම

මානව දැනුම සමාජයමය ප්‍රපංචයකි. ඒ නිසාම එහි අයිතිය පෞද්ගලික නොවිය යුතුය. එය සමාජයමය විය යුතුය. අතීත දැනුම ඇසුරින් නව දැනුම සොයන පර්යේෂකයන්ට ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම ඔවුන් නඩත්තු කිරීම සමාජයේ වගකීමක් විය යුතුය. එසේම එම දැනුම අනාගත පරපුරට බෙදා දෙන ගුරුවරුන්ට, ආචාර්යවරුන්ට ඒ සඳහා පහසුකම් ලබා දීමත් ඔවුන් නඩත්තු කිරීමත් සමාජ වගකීමක් විය යුතුය. එවිට අධ්‍යාපනය විකිණිය යුතු නොවන්නා සේම එහි නියැලෙන්නාට ජීවත් වීම සඳහා අධ්‍යාපනය විකිණීමට අවශ්‍ය වන්නේ නැත. මේ සඳහා ආණ්ඩුවක් මැදිහත් විය යුතුය. සමාජය උපයන සමාජමය ධනයෙන් ප්‍රමාණවත් කොටසක් සමාජයට දැනුම දීම සඳහා අධ්‍යාපනයට වෙන් විය යුතුය. පර්යේෂණවලට අවශ්‍ය පහසුකම් සැපයීමටත් පර්යේෂකයන්ට හා ගුරුවරුන්ට වැටුප් ලබා දීමටත් යෙදවිය යුත්තේ ඒ ධනයයි. එවිට ගැටලුව විසඳේ. එහෙත් ලාභය පදනම් කරගත් තනි තනි මිනිසාට හුදෙකලාව ජීවත් වීමට බල කළ, සියල්ල විකිණීම ප්‍රතිපත්තිය කරගත් ධනවාදය තුළ මෙය ඉටු නොවනු ඇත. සමාජමය දැනුම කිසිදු වෙනසකින් තොරව සාධාරණව සමාජය වෙතම ලැබීමට නම් එය ප්‍රතිපත්තිය කර ගත් එවැනි නව සමාජයක් බිහි වීම අත්‍යාවශ්‍ය වන්නේය.

# මහරැජිනට එරෙහිව අවි එසවූ 71 අරගලය

"1972 ජූලි මස 26 වන දින කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 225 දරන පරීක්ෂණ ශාලාවේදී අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවේ ප්‍රථම රැස්වීමේදී නීතිපති වික්ටර් තෙන්නකෝන් මහතා විසින් ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රය මෙසේය.

*දණ්ඩ නීති සංග්‍රහයේ අංක 115 දරන වගන්තියට අනුව පහත අංක 1 චෝදනා සැකකරුවන් 41 දෙනෙකුට විරුද්ධව ඉදිරිපත්කර නඩු පවරනු ලැබේ.*

***අංකඃ 01***

*1968 ජනවාරි 01 දින සිට 1971 දෙසැම්බර් 31 දින අතර කාලසීමාව තුළ මහරැජිනගේ ආණ්ඩුව සාපරාධී බිය ගැන්වීමට සහ පෙරළා දැමීම සඳහා කොළඹ, නුවර, මාතර සහ අම්පාර ඇතුළු අනෙකුත් ස්ථානවලදී කුමන්ත්‍රණය කිරීමෙන් නීති ප්‍රකාරව යුෂ්මතුන් වරදක් සිදුකර ඇත.*

***අංකඃ 02***

*එකී කාලය තුළ ලංකාණ්ඩුව බිය වැද්දීමට හා ලංකාණ්ඩුවට එරෙහිව යුද්ධ කිරීමට කුමන්ත්‍රණය කිරීමෙන් යුෂ්මතුන් නීති ප්‍රකාර වරදක් සිදුකර ඇත.*

***අංකඃ 03***

*දණ්ඩනීති සංග්‍රහයේ අංක 114 යටතේ 1971 අප්‍රේල් 04 දින සිට 1971 ජුනි 30 දක්වා අතර කාලය තුළ මහරැජිනට විරුද්ධව යුද්ධකිරීමට කුමන්ත්‍රණය කිරීමට සහ ඊට අනුබල දීමට විරුද්ධව සැකකරුවන් 27 දෙනෙකුට විරුද්ධව නඩු පවරනු ලැබේ.*

***අංකඃ 04***

*එකී කාල සීමාව තුළ මහරැජිනගේ ආණ්ඩුවට එරෙහිව යුද්ධ කිරීම හේතුවෙන් දණ්ඩ නීති සංග්‍රහය ප්‍රකාර වරදක් සිදුකර ඇති හෙයින් සැකකරුවන් 14 දෙනෙකුට විරුද්ධව නඩු පවරනු ලැබේ."*

**(උපුටා ගැනීමඃ උදේනි සමන් කුමාරගේ "71 නඩු විභාගය - විජේවීරගේ හෘදය සාක්ෂිය" කෘතියෙනි)**

ඉහත සඳහන් වන්නේ 1971 අරගලයෙන් පසුව 1972 අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව හමුවේ පැවති නඩු විභාගයේදී 'මහනඩුවේ' සැකකරුවන්ට එරෙහිව ආණ්ඩුවේ නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබූ චෝදනාය. එම චෝදනා 4න් 3ක්ම ඇත්තේ මහරැජිනගේ ආණ්ඩුව සාපරාධී ලෙස බියවැද්දීමට හා පෙරළා දැමීමට තැත් කිරීම, මහ රැජිණට එරෙහිව යුද්ධ කිරීමට කුමන්ත්‍රණය කිරීම හා ඊට අනුබල දීම සහ මහරැජිණගේ ආණ්ඩුවට එරෙහිව යුද්ධ කිරීම යන චෝදනාය.

1971 අරගලයෙන් පසු බොහෝ කලක් යනතුරු එවකට තිබූ සමගි පෙරමුණ ආණ්ඩුවට සම්බන්ධ හැමදෙනාම ප්‍රකාශ කළේ ජවිපෙ, 1970 පිහිටවූ ළදරු සමාජවාදී ආණ්ඩුවට එරෙහිව, කැරලි ගැසූ බවය. ප්‍රගතිශීලී ආණ්ඩුවකට එරෙහිව කැරලි ගැසූ බවය. එහෙත් එම ආණ්ඩුවේම නීතිපතිවරයා 71 අරගලයේ සැකකරුවන්ට එරෙහිව ඉදිරිපත් කළ චෝදනාවලියම එකී අවලාදය බිඳදමා තිබෙන අතර එවකට පැවතියේ මහරැජිනගේ ආණ්ඩුවක් බවද හෙළිකොට 71 අරගලය 'ප්‍රතිගාමී' එකක් ලෙස අර්ථකථනය කිරීමට තැත්කළවුන් නිරුවත් කරනු ලැබ තිබේ. ඒ අර්ථයෙන් ගත්විට 71 අරගලය ධනේශ්වර විරෝධී වූවක් මෙන්ම අධිරාජ්‍ය විරෝධී අරගලයක්ද විය.

1971 අරගලයට මෙම අප්‍රේල් 05 වැනිදාට වසර 46ක් පිරී තිබේ. 1971 අප්‍රේල් අරගලය යනු ලංකාවේ ධනවාදය තුළ ඊට එරෙහිව ඇතිවූ පළමු අවිගත් නැගිටීමය. 71 අරගලය ඉතිහාසගත වන්නේ ඒ නිසා පමණක්ම නොවේ. ධනේශ්වර ක්‍රමය තුළ වහල්භාවය සිය කැමැත්තෙන්ම තෝරාගෙන ධනපති වියගස මත ගෙල තබා පරාධීන මනසකින් සිටි ජනතාවක් වහල් බවට එරෙහිව අරගල කරන ජනතාවක් බවට පත් කිරීමේ අර්ථයෙන්ද ජනතාව සටන්කාමීත්වයෙන් පුබුදු කිරීමේ අර්ථයෙන්ද ජනතාව වෙනුවෙන් මහා කැපකිරීම් කළ හැකි මිනිසුන් ධනවාදය තුළම නිර්මාණය කළ හැකිය යන අර්ථයෙන්ද 71 අරගලය ඓතිහාසික වැදගත්කමක් ගනී. එපමණක් නොව 1972 ජනරජ ව්‍යවස්ථාව, ඒ මගින් බ්‍රිතාන්‍ය කිරීටයේ බැඳීම්වලින් ඉවත්වීම, 1975 ඉඩම් ප්‍රතිසංස්කරණ ආදී ධනේශ්වර ප්‍රතිසංස්කරණවලට බලපෑමේ අර්ථයෙන්ද කලාවට හා සමාජ විඥානයට සිදුකළ බලපෑමේ අර්ථයෙන්ද 71 අප්‍රේල් අරගලය සුවිශේෂීය.

1971 අප්‍රේල් අරගලය ලාංකේය සමාජයට කළ සාධනීය බලපෑම කොතරම්ද යත් සෑම වසරකම අප්‍රේල් 05වැනි දිනය ළංවත්ම රටේ හැම දෙනාටම ඒ පිළිබඳව කතාකිරීමට සිදුව තිබේ. එපමණක් නොවේ. 71 අරගලයෙන් පසු අරගලය පාවාදුන් හා සටන අතහැර පලාගිය අය පවා, 71 අරගලයෙන් පසු කිසිදා සමාජකාර්යයක දායක නොවී ධනවාදය තුළ එහි වහලුන් බවට පත්වූවන් පවා තම හිස් බොල් ජීවිතවලට වටිනාකමක් හා වීරත්වයක් ආරෝපණය කරගනු ලබන්නේ 71 අරගලයට තමන්ද සම්බන්ධයයි පවසමිනි. සමහරු සති අන්ත පුවත්පත්වල වීරයන් බවට පත්වන්නේ නැති දේවල් පවා තමන් කළ බවට පම්පෝරි ගසමිනි. 71 අරගලය වැරැද්දක් ලෙස දකින හා ජ.වි.පෙ.ට මුළුමනින්ම සතුරුකම් කරන අය පවා 71 අරගලයේ තමන්ගේ පංගුව වෙන්කර එය තම නමට ලියා ගැනීමට උත්සාහ කරන්නේ එම අරගලයට සමාජයේ තිබෙන විශාල ගරුත්වය නිසාමය.

'හොඳම ගුරුවරයා අත්දැකීම් වේ' යනුවෙන් සුප්‍රසිද්ධ කියමනක් තිබේ. 1971 අප්‍රේල් අරගලය වත්මන් පරපුරට වැදගත් වන්නේ ඒ අර්ථයෙනි. ලාංකේය ධනපති පංතිය බියෙන් සලිත කළ පීඩිත පංතියේ තරුණ තරුණියන්ගේ නව සමාජයක් සඳහා වූ අවශ්‍යතාවය, ඒ සඳහා වන විශ්වාසය හා ඒ වෙනුවෙන් වූ කැපවීමේ හා පරිත්‍යාගයේ මහා ආදර්ශය ලොවට හෙළිකළ, එමෙන්ම පක්ෂ දේශපාලනය වෙනුවට පංති දේශපාලනය තෝරාගත යුතු බව සමාජයට ඉගැන්වූ අරගලයක් ලෙස 71 අරගලය බොහෝ පාඩම් සමාජය වෙත උරුමකරදී තිබේ. එසේම සටනක වීරත්වය මෙන්ම ද්‍රෝහිත්වය පිළිබඳවද, කැපකිරීම හා පරිත්‍යාගය මෙන්ම පාවාදීම පිළිබඳවද මිනිසුන්ගේ දක්ෂතා මෙන්ම දුර්වලතා පිළිබඳවද දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය වන්නේ කෙසේද යන්න පිළිබඳවද මහා අත්දැකීම් රැසක් 71 අරගලය විසින් අපට ලබාදී තිබේ.



71 අරගලයේ සතුරන්වූ ධනපති පංතියත් 71 අරගලය පාවාදුන් ද්‍රෝහීනුත් පවසන ආකාරයට 71 අරගලය යනු අහම්බයක් හෝ පුද්ගල හිතුවක්කාරකමක් නොවේ. 71 අරගලය දෙස එවැනි පටු ධනේශ්වර දෘෂ්ටිකෝණයකින් බැලීම වැරදිය; නිර්මාක්ස්වාදීය. 71 අරගලය යනු පැවති විෂයමූල තත්වයන් තුළ විවිධ දේශපාලන සාධක විසින් නිර්මාණය කරන ලද්දකි. එය අවසාන විග්‍රහයේදී නිර්ධන පංති විප්ලවකාරී ව්‍යාපාරයක් ආරම්භයේදීම මුහුණ දුන් ධනේශ්වර මර්දනයත්, අභ්‍යන්තර මතභේදත් එවකට පැවති ලෝක දේශපාලනයේ අත්දැකීමුත් විසින් නිර්මාණය වූවකි. එසේ නැතිව එය කුමන්ත්‍රණයක් හෝ අහම්බයක් හෝ අත්වැරැද්දක් නොවේ. මේ පිළිබඳව රෝහණ විජේවීර සහෝදරයා සිය "අප මරා දැමුවද අප නගන හඬ සදා නොමියනු ඇත" කෘතියේ 85වැනි පිටුවේ මෙසේ සඳහන් කර තිබේ. "මිනිස් සමාජයේ සංවර්ධනය කෙරෙහි බලපාන්නාවූ වාස්තවික නීති රීති ගැන කිසිත් වැටහීමක් නැත්තාවූත්, සිය සූරාකෑමේ අභිලාෂයන්ට හා පංති අවශ්‍යතාවයනට අනුරූපී වන අයුරින් ඉතිහාසයේ ඉදිරි ගමන පිළිබඳව, ලෝකය පිළිබඳව, විකෘති මානසික චිත්‍රයක් ඇතිකරගෙන ඇත්තාවූත්, මිත්‍යා ඇදහීම්, නූගත්කම, මනෝමූලවාදය, උපයෝගීතාවාදය, ප්‍රයෝජ්‍යතාවාදය හා වෙනත් එබඳු මානසික විකෘතිවීම්වල මිශ්‍රණයක් වූ ප්‍රතිගාමී දෘෂ්ටියකට පුරුදු පුහුණු වී ඇති සූරාකන ධනේශ්වර පාලක පංතීන් විප්ලවයක් ඇති වන්නේ පුද්ගලයෙකුගේ හෝ කීප දෙනෙකුගේ කැමැත්ත අනුව යයි සිතතත්, එසේ සිතීමට ඉඩ ඇතත්, ජීවමාන සත්‍යය එසේ නොවේ." මින් තහවුරු කරන්නේද විප්ලව මෙන්ම ජනතා සටන්, අරගල ඕපපාතිකව, ඉබේ සිදුවන හෝ පුද්ගල කැමැත්තට සිදුවන දේ නොව නිශ්චිත විෂයමූල වටපිටාවන් තුළ සමාජීය හා දේශපාලන කොන්දේසි හා සමාජ අවශ්‍යතාවයන් මගින් බිහිකරන බවය. නූතන පරපුර 71 අරගලය දෙස බැලිය යුත්තේ, එවැනි පදනමක පිහිටාය.

> "මිනිස් සමාජයේ සංවර්ධනය කෙරෙහි බලපාන්නාවූ වාස්තවික නීති රීති ගැන කිසිත් වැටහීමක් නැත්තාවූත්, සිය සූරාකෑමේ අභිලාෂයන්ට හා පංති අවශ්‍යතාවයනට අනුරූපී වන අයුරින් ඉතිහාසයේ ඉදිරි ගමන පිළිබඳව, ලෝකය පිළිබඳව, විකෘති මානසික චිත්‍රයක් ඇතිකරගෙන ඇත්තාවූත්, මිත්‍යා ඇදහීම්, නූගත්කම, මනෝමූලවාදය, උපයෝගීතාවාදය, ප්‍රයෝජ්‍යතාවාදය හා වෙනත් එබඳු මානසික විකෘතිවීම්වල මිශ්‍රණයක් වූ ප්‍රතිගාමී දෘෂ්ටියකට පුරුදු පුහුණු වී ඇති සූරාකන ධනේශ්වර පාලක පංතීන් විප්ලවයක් ඇති වන්නේ පුද්ගලයෙකුගේ හෝ කීප දෙනෙකුගේ කැමැත්ත අනුව යයි සිතතත්, එසේ සිතීමට ඉඩ ඇතත්, ජීවමාන සත්‍යය එසේ නොවේ."

71 අරගලය යනු ලාංකේය පන්ති සටන් ඉතිහාසය තුළ ධනපති පංතිය හා නිර්ධන පංතිය අතර වන පංති සටන දේශපාලන සටනක් ලෙස, අවිගත් සටනක් ලෙස මතුවූ අවස්ථාවකි. ලංකාවේ පමණක් නොව ලෝකය පුරාම පීඩිත පංතිය පාලක පීඩක පංතිවලට එරෙහිව කළ අරගල තුළ අවිගත් නැගිටීම් දැකිය හැක. කියුබාවේ ඒකාධිපති බැටිස්ටාට එරෙහිව ෆිදෙල් ප්‍රමුඛ විප්ලවාදීන්ගේ 1953 අවිගත් නැගිටීම පරාජය වූ අතර, 1956 ආරම්භ කළ සන්නද්ධ අරගලය 1959 දී ජයග්‍රහණය කළේය. කියුබානු විප්ලවයට මඟ පෑදුනේ එයිනි.

රුසියාවේද සාර් පාලනයට එරෙහිව 1905 අවිගත් නැගිටීම පරාජය වූ අතර 1917 ඔක්තෝබර් අවිගත් නැගිටීම ජයග්‍රහණය කළේය. රුසියානු විප්ලවය, රුසියාවේ සමාජවාදයට මඟ තැනුවේ එසේය. රෝමයේ වහල් යුගයේ ස්පාටකස් ප්‍රමුඛ වහලුන්ගේ නැගිටීමද වහල් හිමියන්ට එරෙහි අවිගත් නැගිටීමකි. එය ස්පාටකස්ගේ කුමන්ත්‍රණයක් හෝ පුද්ගල ආශාවක ප්‍රතිඵලය නොවීය. ස්පාටකස්ගේ

15වැනි පිටුවට

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2017 මාර්තු 08

# “සංවර්ධන ප්‍රමුඛතාව හිමිවිය යුත්තේ එහි බලපෑමට ලක් වන මිනිසුන්ටයි”



## පාර්ලිමේන්තු මන්ත්‍රී
## බිමල් රත්නායක සහෝදරයා

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් ආරම්භ කිරීම සඳහා අද දින ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පැවැත්වෙන මේ විවිදයේ දී ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් කරුණු කීපයක් සඳහන් කරන්න මා කැමැතියි. විශේෂයෙන්ම මේ පනත් කෙටුපම්පතට ප්‍රතිපත්තිමය වශයෙන් අපේ විරුද්ධතාවක් නැහැ. නමුත් අපි කියන්න ඕනෑ දෙයක් තිබෙනවා. තිරසර සංවර්ධන ඉලක්ක 17ක් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් සම්මත කරලා ලෝකයට හඳුන්වා දී තිබෙනවා. 2000 වර්ෂයේ ඉඳලා 2015 වර්ෂය දක්වා Millennium Development Goals කියලා MDGs එකක් ක්‍රියාත්මක වුණා. Millennium එක ආවට පසුව හැදුවා MDGs කියලා එකක්. ඒක 2015 වර්ෂයේදී අවසන් වුණා. එය අවසන් වුණාට පසුව දැන් තිරසාර සංවර්ධන ගෝලීය ඉලක්ක - MDGs - කියලා එකක් හදලා තිබෙනවා.

**ක්‍රමය වෙනස් නොකර goals වෙනස් කිරීම**

මේ අරමුණ වෙනුවෙන් දශමයක හෝ දෙයක් කරනවා නම් ඒ වෙනුවෙන් සහයෝගය දෙන්න පුළුවන් කියන කාරණය මම ඉතාම වගකීමෙන් කියනවා. එසේ කියන ගමන්, අප ධනපති ක්‍රමය කියලා කියන මේ දේශපාලන, ආර්ථික ක්‍රමය තුළ මේවා අකුරු විතරමයි කියලා මා කියන්න කැමැතියි. මේවායෙන් කිසිම දෙයක් වෙන්නේ නැහැ. ඇත්තටම ගත්තොත්, මේ හදන සභාවටත් රාජ්‍ය මුදල් වියදම් කිරීම විතරයි සිදු වන්නේ. මා කියන්නේ මුදල් නාස්තියක් කියන අදහසම නොවෙයි. ඉලක්කවලට එන්න බැහැ කියලයි මම කියන්නේ. මොකද, ලෝකයේ අනෙක් රටවල්වත් මේ ඉලක්කවලට ඇවිල්ලා නැහැ. කාබන්ඩයොක්සයිඩ් විමෝචනය අඩු කරන්න කියලා, හරිතාගාර වායු ප්‍රශ්නය පිළිබඳව, ලෝකයේ පරිසර සමුළු දහස් ගණනක් පවත්වා ඇති. නමුත්, ඒක එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා කියන එකත් අපි දන්නවා. ලෝකයේ වනාන්තර විනාශය මේ ඔක්කෝම goals අස්සේ වැඩිවෙලා තිබෙනවා. ලෝකයේ ජාන මංකොල්ලය එන්න එන්නම වැඩිවෙලා තිබෙනවා. ලෝකයේ ඇතිනැති පරතරය එන්න එන්නම වැඩිවෙලා තිබෙනවා. ඒකට හේතුව, අපි වෙන කිසිවක් වෙනස් කරන්නේ නැතිව, - අපි මේ ලෝකය පාලනය කරන සහ ලංකාව පාලනය කරන දේශපාලනඥයන් වෙනස් කරන්නෙත් නැහැ; සල්ලිම හොයාගෙන යන, ලාභයම හොයාගෙන යන ඒ ආර්ථික රටාව වෙනස් කරන්නෙත් නැහැ: ඒවා කිසිවක් වෙනස් නොකර - අපි goals විතරක් වෙනස් කරනවා. තමන් වෙනස් නොවී මොනවාද වෙනස් කරන්න පුළුවන්? කෑදර විදියට ලාභයම හොයාගෙන යන ලෝකයේ සමාගම් තන්ත්‍රයක් එක්ක කවුද පරසරය වෙනුවෙන් කටයුතු කරන්නේ?

Biodiversity පිළිබඳ පැවැත්වුණු සමුළුවට, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් එන විද්‍යාඥයන් ප්‍රමාණයට වඩා, එයට විරුද්ධව තෙල් සමාගම්වලින් එන විද්‍යාඥයින් ප්‍රමාණය වැඩියි කියලා ඔබතුමා දන්නවා. එම නිසා මම මේ ගැන කථා කරන්න ලොකු වෙලාවක් ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ නිසා අපේ රටේත් ඔය මොන තර්ක දැම්මත් අවසානයේදී සිදුවෙලා තිබෙන දේ තමයි දේශපාලන අනුග්‍රහයෙනුත්, නිලධාරි අනුග්‍රහයෙනුත් පරිසර විනාශය සිදු කෙරෙන එක. ඒවා කරන්නේ මේ රටේ තිබෙන ආර්ථික ක්‍රමය ඇතුළේයි. ඒ නිසා මම පක්ෂයක් වශයෙන් ඒ බොරුවට, මිත්‍යාවට -illusion එකට- සහභාගි වෙන්න පොඩ්ඩක්වත් කැමැති නැහැ. පසුගිය තිස් අවුරුද්දේම "Lost Development Goals" මොනවාද කියලා ඔබතුමන්ලා 2030 දී "LDGs" කියලා එකක් හදන්න යනවා. 2030 දී මේ පාර්ලිමේන්තුවට එන තරුණ මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා, මේක බලන්න කියලා. මේ ඔක්කෝම ඒවා අසාර්ථක වෙනවා. ඒ නිසා මම ඒ ගැන වාද කරන්න යන්නේ නැහැ.

> අද ලංකාවේත්, ලෝකයේත් තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි දරුවන්ගේ වගකීම කාන්තාවන්ට භාර දී තිබීම නිසා කාන්තාවන්ට වෘත්තීයෙන් ඉහළට යන්නට නොහැකි වීම. ඒක තාත්තලාට කරන්නටත් බැහැ. අම්මායි, තාත්තායි සම සමව මේ කටයුතු කරන්න ඕනෑය කියන පිළිගැනීම තිබුණාත්, තාත්තා ඉන්නේත් ආර්ථික යුද්ධයක. එම නිසා අපි කියන්නේ ලොකු දේවල් කරන්න කලින්, කාන්තාවන් සියයකට වැඩියෙන් වැඩකරන සෑම රාජ්‍ය ආයතනයකම, සෑම පෞද්ගලික ආයතනයකම අනිවාර්යයෙන්ම රජයෙන් - රජයේ යම් කිසි දායකත්වයක් ඇතිව, පෞද්ගලිකව වුණාත් ප්‍රශ්නයක් නැහැ- දිවා සුරැකුම් මධ්‍යස්ථාන පද්ධතියක් හරියාකාරව හදන්න ආණ්ඩුවෙන් නීතියක් ගේන්න.

**අනිවාර්ය නොවූ ජනතා කැමැත්ත**

දැන් මේ පනත් කෙටුපතට අනුව ඕනෑම ව්‍යාපෘතියක පාරිසරික තිරසාර සමාජ පැත්තයි, ආර්ථිකය පැත්තයි, පරිසරය පැත්තයි තුනම ගැන බලන්න කියලා තිබෙනවා. හැබැයි, දැන් මොනවා හෝ කර්මාන්තයක්, සංවර්ධන ව්‍යාපෘතියක්, ඉදිකිරීම් ව්‍යාපෘතියක් අපි ගනිමු. ඒවා ආරම්භ කිරීමට පෙර ඔබතුමා අවුරුද්දක කාලයක් දීලා තිබෙනවා. ආයතනවලට ඒ සම්බන්ධ උපාය මාර්ග හදන්න. අපි පිළිගන්නවා, එයට යම් කාලයක් අවශ්‍යයි කියලා. නමුත්, ඒවා පටන් ගැනීමට පෙර මෙම තිරසාර සංවර්දනය පිළිබඳ ජාතික හෝ පළාත් හෝ ප්‍රාදේශීය කමිටුවේ අනිවාර්ය අනුමැතිය අවශ්‍යයි කියන එක මම නම් මේ පනත් කෙටුම්පතේ තිබෙනවා දැක්කේ නැහැ. ඒකේ නීතිමය අවශ්‍යතාවක් මෙතැන නැහැ.

අපි පාරක් හදනවා නම්, ඒ පාර නිසා තමන් ඉන්න තැන්වලින් අයින්වන මිනිස්සු දිහා බලන්න; ජලාශයක් හදනවා නම්, තමන් ජීවත් වන භූමිය යටවන මිනිස්සුන්ගේ පැත්ත බලන්න කියලා පනතේ තිබෙනවා. 15වැනි පිටුවට

2017 මාර්තු 09

# “වංචා දූෂණ පිළිබඳ ජනාධිපති කොමිසමේ කටයුතු මන්දගාමී ඇයි?”



## පාර්ලිමේන්තු මන්ත්‍රී
## අනුර දිසානායක සහෝදරයා

බරපතළ වංචා දූෂණ පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසමේ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ මහජනතාව තුළ පවතින ගැටලුකාරී තත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරමි.

**පසුගිය පාලනය අවසන් කළ ජනාධිපතිවරණයට පූර්වයෙන් මැතිවරණ සමයේ රට තුළ වඩාත්ම කතාබහට ලක්වූ මාතෘකා කිහිපයක් තිබුණා. ඒ මාතෘකා අතර, පැවති පාලන සමය තුළ සිදු වූ බරපතළ වංචා දූෂණ, රාජ්‍ය සම්පත් අවභාවිතය, බලය අනිසි ලෙස යෙදවීමේ සිදුවීම්ද, ඒවායේ චූදිතයින්ට තරාතිරම නොබලා දඬුවම් පැමිණවීමද, සොරකම් කරන ලද මහජන ධනය හා දේපළ නැවත පවරා ගැනීමද පැවතියා. අදාළ සිදුවීම්වල වරදකරුවන්ට රටින් බැහැරවීමට ඉඩ නොලැබෙන පරිදි, ගුවන්තොටුපළ වසා දැමිය යුතු බවටද ඇතැම් අවස්ථාවක කරුණු දක්වනු ලැබීමෙන් මෙම තත්වය පිළිබඳව කෙතරම් සමාජ අවධානයක් පැවතුණේද යන්න තහවුරු වනවා.**

ජනතා විරෝධයේ තීව්‍රවීම 2015 ජනාධිපතිවරණයෙන් පැවති පාලනය පරාජයට පත්වීමෙන් ප්‍රකට වුණා. ඒ සමගම ජනතාව අභිනවයෙන් බලයට පත් පාලනය තමන්ගේ මැතිවරණ පොරොන්දු කඩිනමින් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කිරීම අතිශය සාධාරණ තත්වයක්.

නව ජනාධිපතිවරයා විසින් 2015 මුල බරපතළ මූල්‍ය වංචා දූෂණ පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිසමක් ස්ථාපිත කරනු ලැබුවා. එම කොමිසම විසින් බරපතළ වංචා, දූෂණ, අක්‍රමිකතා, රාජ්‍ය සම්පත් අවභාවිතය, බලය අනිසි ලෙස යෙදවීමේ සිදුවීම් පිළිබඳව පරීක්ෂණ සිදුකරමින් තිබෙන අතර දේශපාලකයින්, නිලධාරීන්, සංගීත ක්ෂේත්‍රයේ සමහර අය, ඒ වාගේම රංගන ශිල්පීන් විශාල ප්‍රමාණයක් දනපතා මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත කැඳවනු ලැබුවා. මේ අයගෙන් විවිධ අවස්ථාවලවිවිධ විධියට සටහන් කරගනු ලැබුවා. මහජනතාවගෙන් පැමිණිලි ලැබී ඇති බවද, ඇතැම් පරීක්ෂණ සම්බන්ධයෙන් අවසන් වාර්තා සකස් කොට ඇති බවද කියැවුණා. කෙසේ වුවද මේ වන විට කොමිසම පිහිටුවා වසර දෙකක් අවසන් වී තිබුණද, සිදු කරන ලද පරීක්ෂණවලට අදාළ වගකිවයුත්තන්ට එරෙහිව අපේක්ෂා කළ අයුරින් නීතිමය කටයුතු ඇරඹා නැති බවත් මහජනතාව දන්නවා.

මෙම කොමිෂන් සභාව සඳහා වෙන් කරනු ලැබුවේ, මහජනයාගේ ධනය. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ විශේෂ කාර්යාලයක් ඉදි කරලා, ඒ සඳහා විශේෂ නිලධාරි මණ්ඩලයක් පත් කරලා, කාලය හා ධනය විශාල ප්‍රමාණයක් නාස්ති කරලා තමයි මෙම කොමිෂන් සභාව පිහිටුවනු ලැබුවේ. මෙම කොමිෂන් සභාවේ වාර්තා කිහිපයක් ජනාධිපතිතුමාට ලබා දුන් බව බොහෝ අවස්ථාවලදී වාර්තා වී තිබෙනවා.

මේ තත්වය හමුවේ පැන නගින පහත ගැටලුවලට පිළිතුරු අග්‍රාමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. බරපතළ වංචා දූෂණ පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම ස්ථාපිත කරන ලද්දේ කවදාද?

02. එය විසින් මේ දක්වා පැමිණිලි කොපමණ සංඛ්‍යාවක් සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර තිබේද?

03. පරීක්ෂණ සම්බන්ධ අවසන් වාර්තා කොපමණ සංඛ්‍යාවක් සකස් කරනු ලැබ තිබේද?

04. සාක්ෂි විමසමින් ඇති, සාක්ෂි විමසීම් අවසන් කළ, අවසන් වාර්තා සකස් කළ සහ නීතිමය කටයුතු ඇරඹී ඇති ආදී වශයෙන් පරීක්ෂණවල ප්‍රගතියක් ලබාදිය හැකිද?

05. අවසන් පරීක්ෂණ වාර්තා ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලැබ තිබේද? එම වාර්තා සම්බන්ධයෙන් ගනු ලැබ ඇති පියවර කවරේද?

06. දැනට පරීක්ෂණ කොපමණ සංඛ්‍යාවක නීතිමය කටයුතු ආරම්භ වී තිබේද? එම පරීක්ෂණ මොනවාද?

07. මෙම කොමිසමේ කටයුතු සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ඉදිරියට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

කියා මම දැන ගන්න කැමතියි.

> පසුගිය පාලනය අවසන් කළ ජනාධිපතිවරණයට පූර්වයෙන් මැතිවරණ සමයේ රට තුළ වඩාත්ම කතාබහට ලක්වූ මාතෘකා කිහිපයක් තිබුණා. ඒ මාතෘකා අතර, පැවති පාලන සමය තුළ සිදු වූ බරපතළ වංචා දූෂණ, රාජ්‍ය සම්පත් අවභාවිතය, බලය අනිසි ලෙස යෙදවීමේ සිදුවීම්ද, ඒවායේ චූදිතයින්ට තරාතිරම නොබලා දඬුවම් පැමිණවීමද, සොරකම් කරන ලද මහජන ධනය හා දේපළ නැවත පවරා ගැනීමද පැවතියා. අදාළ සිදුවීම්වල වරදකරුවන්ට රටින් බැහැරවීමට ඉඩ නොලැබෙන පරිදි, ගුවන්තොටුපළ වසා දැමිය යුතු බවටද ඇතැම් අවස්ථාවක කරුණු දක්වනු ලැබීමෙන් මෙම තත්වය පිළිබඳව කෙතරම් සමාජ අවධානයක් පැවතුණේද යන්න තහවුරු වනවා.

## කවුළුව හැරි තබමි

# ඔක්තෝබර් විප්ලවය හා 'වමේ පතුරු'

"රනිල් සහ මෛත්‍රී ප්‍රධාන ආරාධිතයින් ලෙස සහභාගි වූ ඔක්තෝම්බර් විප්ලවයේ සියවසක සැමරුම වෙනුවෙන් සැමරුම් උත්සවයක් පසුගියදා පවත්වන ලදී"

- සිදුවූ පුවතක්

"රනිල් වික්‍රමසිංහයන් විසින් ගෝල්ෆේස් පිට්ටනියේ තිබෙන බණ්ඩාරනායක පිළිරුව අසලම ලෙනින්ගේ පිළිරුවක් පසුගියදා විවෘත කරන ලදී.''

- සිදුවිය හැකි පුවතක්

තමා මහා මාක්ස් - ලෙනින්වාදියකු වූ බව රනිල් වික්‍රමසිංහ විසින් පසුගියදා ප්‍රකාශයට පත්කළේය.

- සිදුවිය හැකි දෙයක්

පළමු පුවත ඇත්තටම සිදුවූ එකකි. පසු කී සිදුවීම් දෙක ඇත්තටම සිදුවිය නොහැකි වුවත් එසේ වුවද පුදුම විය යුතු නැත.

රුසියාවේ වත්මන් ධනේශ්වර පාලකයින් ඔක්තෝම්බර් විප්ලවය සමරන්නේ නැත. ඔවුහු අද එහි පරම සතුරෝය. එහෙව් එකේ මෛත්‍රීලා, රනිල්ලා ලොවටම දී ඇත්තේ අපූර්ව ආදර්ශයකි.

ඔක්තෝම්බර් විප්ලවයේ ආදර්ශය සහ උරුමය ලාංකේය භූමිය තුළ යථාර්ථයක් කිරීමට වෙර දැරූ මිනිසුන් ලේ සාගරයක ගිල්වා දැමූ රනිල්ලා 'රතු බාහුලා' සමග ක්‍රියාවට නගන විකාරරූපී රංගනයන් පිළිබඳව අපටනම් පුදුමයක් නැත. සැබැවින්ම ඔවුන් විසින් සැමරිය යුත්තේ සහ ඔවුන්ගේ ඇත්ත උරුමය නම් 1985 න් නිලවශයෙන් ඇරඹී 1991 දෙසැම්බර් 08වැනිදා අවසන් වූ සෝවියට් දේශය 'බිඳවැට්ටවීමේ ප්‍රතිවිප්ලවීය ක්‍රියාදාමය'යි.



මේ ඔවුන් සිදුකිරීමට සැරසෙන්නේ, අන්කිසිවක් නොව ශ්‍රේෂ්ඨ ඔක්තෝම්බර් විප්ලවයද මැයි දිනය මෙන්ම මස්තබාල්දු කර එය ඉතිහාසයේ සමච්චලයක් කිරීමටය. මැයි දිනය ධනපති පාලකයන්ට කොල්ලකෑමට පැරණි වම උදව්වූවා සේම අද ඔක්තෝම්බර් විප්ලවය කොල්ලකෑම සඳහා 'වමේ පතුරු' උපරිමයෙන් ඔවුන්ට සහය දෙමින් සිටී.

එක අතකින් මේ පෙන්වන්නේ මේ සමස්ත ප්‍රතිගාමිත්වයේම අර්බුදය නොවේද?

තම පැවැත්ම වෙනුවෙන් ඕනෑම කුපාඩිකමක් කිරීම තමන් තුළ ඇති නිර්ලජ්ජිතභාවය නොවේද? කාන්තාවන්ගේ යට ඇඳුමේ බුදුන්ගේ රුව ගසා විකුණන, මේ බුදුන්ගේ දේශයයි කියා ගන්නා රටේ රනිල්ලා - බාහුලා තම විලි වසා ගැනීමට ලෙනින්ව පාවිච්චි කිරීම පුදුමයට නම් කරුණක් නොවේ. පුදුමය එවැනි දෑ නොසිදුවන්නේ නම්ය. කෙසේ වෙතත් රනිල්ලාද බාහුලා වැනි හොර වම්මුන්ද දේශපාලනිකව නිරුවත්වීම නම් රටටම හොඳය.

# මරණයෙන් ලොව එළිය කළ මිනිස්සු



තනි තනි පුද්ගලයන් යනු එන් අතකින් පවත්නා සමාජයේම සංකීර්ණතාවයන්ගේ ප්‍රකාශනයකි. සරල දිවිපෙවතක් ගෙවා ස්වභාවික මරණයකට ලක්වන පුද්ගලයන් තනි තනිව තේරුම් ගැනීම සරල කටයුත්තකි. එය එසේ වන්නේ ඔහු ජීවත් වූ සමාජ භාවිතයේ කවය ඉතා පටු බැවිනි. ඔවුන්ගේ උපත, පැවැත්ම සහ විපත දක්වා ඇත්තේ අඩි පාරක් වැනි පටු පාරකි. ඔවුන්ගේ පැවැත්ම විසින් සමාජයට ලැබෙන්නේ කුමක්ද යන්න ගැනවත් කතාකිරීමට දෙයක් නොමැති තරම්ය. මිනීපෙට්ටියේ පියන වසා වළට දමා පස් ගොඩකළ පසු ඔවුන්ගේ ජීවිත කෙළවර වේ.

සමාජභාවිතයේ කවය ඉතා විශාල වන පුද්ගලයන් ගැන විග්‍රහයක යෙදීම ඉහතින් කළා වැනි පහසු සහ සරල කටයුත්තක් නොවේ.

පොළොව මතට ගහකින් කොළයක් පතිත වීමත් මහා කන්දක් පොළවට පාත් වීමත් අතර විශාල වෙනසක් තිබේ. මහා කන්දක් පතිතවීම මහපොළව දෙදරුම්කවන සුළුය.

අප වසන මේ සමාජයේද පරඬැල් කොළ වැනි මිනිසුන් මෙන්ම මහාකඳු වැනි මිනිසුන්ද අපට හමුවේ. පසුව කී මිනිසුන් විරලය. මුලින් කී වර්ගයා සුලභය.

අප මේ කථාකරන්නේ අර මහ කඳුවැනි විරල මිනිසුන්ගේ සැමරුමක් ගැනය. ඔවුන් නම් අප්‍රේල් විරුවන්ය. ඔවුන් ලද අවලාද ඔවුන් ලද ප්‍රශංසාවන්ට වඩා අතිවිශාලය. එහෙත් මේ කුණු වූ සමාජයේ ජීවත් වීම නොඉවසන, අලුත් ලොවක් ගැන හිතන ඒ වෙනුවෙන් වෙහෙසෙන, සටන් වදින, හිතන මතන, මිනිසුන්ට ඔවුන් මහා පර්වතය. ලොවට මඟ කියනා මහා පහන්ටැඹවල්ය.

ලොවට කිසිවක් නොකොට ගෞරවය, කීර්තිය හා ප්‍රශංසාව පමණක් ඉල්ලා සිටින බහුතරයක් වෙසෙන නරුම සමාජයක ඒ කිසිවක් නොඉල්ලා ඒවා අළුයම ලූ කෙළ පිඬක් සේ ඉවත දමා, මුළු මහත් මිනිස් වර්ගයාගේ යහපත සඳහාම සටන් වැද දිවි පිදූ මිනිසුන් හුදු 'විරුවන්' නම් අකුරු හතරට සීමාකළ නොහැක. මන්ද ඔවුන් මුළු ඉතිහාසය පුරාවටම සැබෑ මිනිසුන්ගේ හදවත් තුළ ජීවමාන මිනිසුන් වන නිසාය.

ඔවුන් පුළුස්සා හෝ වළ දමා ඉතිහාසයෙන් මකා දැමිය නොහැකි මිනිසුන්ය; මරණය පැරදවූ මිනිසුන්ය; භීතියට පත් මිනිසුන් අවදි කළ මිනිසුන්ය; අඳුර වෙනුවට මරණයෙන් එළිය දුන් මිනිසුන්ය. සදා සමරනු ලබන අප්‍රේල් විරුවන් එබඳු මිනිසුන්ය.

# අවුරුද්ද සුබ වනු ඇත්ද?

මිනිසුන් විනෝද විය යුතුය. සතුටු විය යුතුය. සැණකෙළි පැවැත්විය යුතුය. එහෙත් අයෙක් එසේ කරන්නේ පිපිරීමට ආසන්න ගිනිකන්දක් උඩ සිටනම්? අද ධනවාදය අපට ඉරණම් කොට දී ඇත්තේ එවැනි තත්වයකි. ධනවාදය තුළ වෙළඳපොළ ග්‍රහණයට හසු නොවූ කිසිවක් නොමැත. ඒ තුළ රැවටීම සහ රැවටීමට ලක්වීම වේගවත් වී ඇත. ඇන්දවීම සහ අන්දා ගැනීම වේගවත් වී ඇත. මිනිසා අන්ධයකු පමණක් නොව ගොළුවෙක්ද සහ බිහිරෙක්ද කරනු ලැබ ඇත. තම දෙපා යට ගිනිමැලය දල්වද්දී ඒ මත සැණකෙළි කිරීමට ධනවාදය බල කරයි.

මේ ටික අපට කීමට සිදුවූයේ ළඟ එන අලුත් අවුරුද්දට පූර්වයෙන් සුපුරුදු පරිදි රටේ ජනයා ඇන්දීම සඳහා එෆ්එම් චැනල් සහ ටීවී චැනල් නියැලී සිටින මාරාන්තික තරඟය දකින විටය.

ආර්ථික වශයෙන් ගෙල මිරිකා දමා ඇති සමාජීය වශයෙන් වල්මත් කරනු ලැබ ඇති සමාජයක වෙසන මිනිසුන්ට ඇත්තටම සැණකෙළි සුවයෙන් දිවි ගෙවිය හැකිද? එහෙත් දැන් නිර්මාණය කර තිබෙන්නේ, අපේ ප්‍රශ්න අප විසින්ම ජෝලි කරන සමාජයකි.



ලිප ගිනි මොලවා, කිරි උතුරවා, කිරිබත් කා අවසන් වන විට දස අතේ ණය වීද අවසන්ය. ඊට පසු ගතවන්නේ හූල්ලමින් ගතවන කාලයයි. අවුරුදු දිනයේ මුණගැසෙන අයට සුභපතා ඊළඟ දිනයේ සිට දත්මිටි කන කාලයයි. මිනිසුන්ට තම තමන්වම අන්දවා ගැනීමට සලස්වන තරමට ධනවාදය සූක්ෂම වී තිබේ. එය ස්වයං ඇඳ ගැනීමකි. ඊළඟ නිමේශයේ පිවිසෙන්නේ මනෝ ලෝකයටය. ඒ ක්ෂණයෙන් නැවත යථා ලෝකයටය. අවසානයේ අප අලුත් අවුරුද්ද වෙනුවෙන් කිරි උතුරවා තිබෙන්නේ කොම්පැනිකාරයන්ටය; පාලකයන්ටය; චැනල් මුදලාලිලාටය. ආකල්ප අලුත් කරගැනීමට අසමත් වන තාක් සුපුරුදු පරිදි අවුරුද්ද ගෙවී යනු ඇත්තේ එලෙසටමය. ඉදින් ඊළඟ අවුරුද්දට පෙර මෙම විෂම චක්‍රයෙන් ගැලවීමේ මඟට පිවිසීමට සිතන මිනිසුන්ට සුබ නව වසරක් වේවා!

## පොලිටිකල් පංතිය

විභාගෙ කට උඩ තියෙද්දිත් පොලිටික්ක දවස් ගාණක් පංතියට ආවෙ නැහැ. කට්ටිය මලෙන් හිටියෙ. ඉඳලා ඉඳලා පොලිටික්ක උදේක පංතියට ආවා, හොරකමක් කරලා එනව වගේ.

"හා...නේ මෙන්න සර් ඇවිත්... ගුඩ් මෝනිං සර්..." වසන්තිය බොරුවට මැරෙන්න හැදුව.

"ගුඩ් මෝනිං සර්... සර්නම් මැරෙන්නෙ නෑ මේ මතක් කළා විතරයි" අනුරුද්දියත් ගල් පැලෙන බොරුවක් අතෑරියා.

"ඔය ළමයි මං නැතුව සාංකාවෙන්ද හිටියෙ." පොලිටික්ක කම්පාවෙන්.

"බම්බු සාංකාව. සිලබස් කවර් කරලත් නෑ." මංජුව ඇහෙන නෑහෙන ගාණට කනියගෙ කණට මැතිරුව. "මං හිතුවෙ අදත් පොල්ල කියල."

"මොනවද මංජු කියන්නෙ" පොලිටික්ක හාරන්න බැලුව.

"නෑ... සර් ඇදිලා ගිහිල්ල වගේ කියලා කිවුවෙ. සර් පහුගිය දවස්වල නිදි මැරුවද?" මංජුව ඇට නැති දිවෙන් වැඩ ගත්ත.

"දැන් අහන්න ලැබෙන දේවල්වල හැටියට නින්ද යනවද ළමයිනේ?" පොලිටික්ක වමට කැපුව.

"දැන් බලන්න එහෙන් විමල් ළමය හිරේ දාල. මහින්ද මහත්තය බරපතළ අපරාධ කොමිසමට කැඳෝනව. රණවිරුවො අත්අඩංගුවට ගන්නව." පොලිටික්ක දුක් ගැනවිල්ලක් කියනව වගේ.

"ඉතින් සර් මොන එහෙකට නිදි මරනවද? එගොල්ල නෙළන්නෙ වපුරපු දේනෙ..." කනිය වැඩිහිටියෙක් වගේ. "...ගණන් ගන්න එපා සර්"

"රණ විරුවො ඇතුළෙ. බෝම්බ ගොනාපු කොටි එළියෙ" පොලිටික්ක හිරිකිත නැතුව මහින්දව උපුටනව.

"සර් ඔය රණවිරුවො කියන්නෙ රතුපස්වල වෙඩි තිබ්බ අයටද? කීර් නොයර්ට ගහපු අයටද? එක්නැලිගොඩ, ලසන්ත මරපු අයටද?" සමන හරියටම තහවුරු කරන්න හැදුව.

"රණවිරුවො කියන්නෙ යුද්දෙ ඉවර කරපු මිනිස්සු... ඒ මිනිස්සුන්ට මඩ..." පොලිටික්ක මොකද්ද කියන්න ගිහින් ඇකිළුව.

"එතකොට යුද්දෙ ඉවර නැතුව තිබුණෙ මාධ්‍යවේදීන් මරණකම්ද? යුද්දෙට මුවා වෙලා මිනී මරපු අය හමුදාවෙ හිටියෙ නැද්ද? කොළඹ ළමයි පැහැරගෙන ගිහින් කප්පම් ගත්ත අය හිටියෙ නැද්ද? කප්පම් ගන්න බැරිවුණාම මරලා දැම්මෙ නැද්ද? අනිත් අය යුද්දෙ කරන අතරෙ මේ අය සුද්දෙ දුන්න. ඉතින් මඩ කියන්නෙ කොහොමද ඔප්පු වෙච්ච දේවල්වලට." මංජුවට මල පැනල.

"හැබැයි මේ අය හිරේ යන්න ඕනෙ නැහැ මං කියන්නෙ." සමන කිවුවෙ කට්ටිය මූණෙන් මූණ බලා ගන්න අතරෙ.

"සමන් මේක ගැන දන්නවනෙ." පොලිටික්ක යන්තම් හුස්මක් ඇද්ද.

"මොකද්ද සමන් ඒ කුණුහරුපෙ." මංජුවත් අන්දොස් වෙලා.

"නැහැ මං කියන්න හැදුවෙ මෙයාලා කියන්නෙ අණ පිළිපැදපු අය. අණ දුන්න අය තම එළියෙ. රතුපස්වල ගමේ මිනිස්සුත් එක්ක දැන් රිමන්ඩ් වෙලා ඉන්න අයට ගේමක් තිබුණෙ නෑනෙ. එක්නැලිගොඩයි, ලසන්තයි එක්කලා ඉඩම් නඩු තිබුණෙ නෑනෙ. ඇත්තම කතන්දරේ මේවා රාජපක්ෂ ආණ්ඩුවෙ කුණු කොන්ත්‍රාත්නෙ. උන්නත් දාහයි මලත් දාහයි කියල දැන් තියෙන්නෙ ඇත්තම කියල දාන එක, වෙඩි තියන්න කිවුවෙ කවුද කියලා." සමන බොක්ක අදින්න ගත්තෙ පොලිටික්ක රිවස් ගියර් එකට මාරු වෙන අතරෙ. "මහින්ද මහත්තයටත් ඇඩ්වලට පෙනී ඉන්න තරම් ලේසි නෑ කියල තේරෙන්න ඇති, දාපු ඇඩ්වලට ගෙවන විදිහ අහනකොට..." සමනගෙ කතාවෙ අන්තිම හරිය අහන්න පොලිටික්කට වාසනාව තිබුණෙ නෑ.

## සංවර්ධන ප්‍රමුඛතාව...

13 පිටුවෙන්



හැබැයි, ඒක අනිවාර්ය නැහැ. අනිවාර්ය නැත්නම් කරන්න බැහැ. එක තමයි පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය තමයි, සංවර්ධනයේ නාමයෙන් සාමාන්‍ය ජනතාවට තමන් ඉන්න ස්ථානවලින් අකමැත්තෙන් ඉවත් වෙන්න සිදු වන එක. සමහර ඉදිකිරීම් සංවර්ධනයේ නාමයෙන් කෙරෙනවා. සමහර ඉදිකිරීම් හොරකමේ නාමයෙන් කෙරෙනවා. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හොරකමේ නාමයෙන් කරපු ඉදිකිරීමක් නේ. ඒ නිසා සමාජයීය පැත්තෙන් බලනවා නම්, ප්‍රමුඛතාව දෙන්න ඕනෑ ඒකෙන් බලපෑමට ලක් වෙන මිනිස්සුන්ටයි. උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය දෙස බලන්න. ඒ ප්‍රදේශයේ තිබෙන ලිඳේ තිබෙන වතුර ටික බොන්න බැරි නම්, ඉන්න ගෙදර ගිලා බැහැලා නම්, මොකක්ද ඒ සංවර්ධනය? අද උමා ඔය සංවර්ධන ව්‍යාපෘතියට වෙලා තිබෙන්නේ ඒක නේ. ඒ නිසා මේ පනත් කෙටුම්පතට අංක එක විධියට ඇතුළත් කරන්න ඕනෑ, සංවර්ධන ව්‍යාපෘතියකදී එයින් පීඩාවට පත් වන ප්‍රජාවට ලැබෙන බලයයි.

### කාන්තාවන් ශක්තිමත් කිරීම

තිරසාර සංවර්ධනයේ ප්‍රධාන තැනක් ගන්නේ කාන්තාවයි. අද කාන්තා දිනය නිසා ඒ ගැනත් කරුණු දෙක තුනක් කිව යුතුයයි මා සිතුවා. මේ තිරසාර සංවර්ධනයේ පැතිකඩ අනුව ගත්තාම අපේ රටේ කාන්තාවන් ශක්තිමත් කරන්නේ නැතිව, ඔවුන්ට සාධාරණ අවස්ථාවක් දෙන්නේ නැතිව මේ පනතේ කිසිවක් සාර්ථක කරන්නට බැහැ. ඒ කියන්නේ ඔවුන් මෙහි ඉතාම මූලිකයි. සමාජයීය සංවර්ධනය ගත්තොත් මා කියන්නම්, ලංකාවේ නොමිලයේ සෞඛ්‍යයයි, නොමිලයේ අධ්‍යාපනයයි පණ ඇද ඇද හෝ තවමත් තිබෙනවානේ. සෞඛ්‍ය පැත්තෙන් ගත්තාම අපේ රටේ ප්‍රතිශක්තිකරණය නොමිලයේ දෙන නිසායි, උගත් අම්මලා ඉන්න නිසායි ප්‍රතිශක්තිකරණ මට්ටම ඉතාම ඉහළයි. ළදරු මරණ අනුපාතය අඩු රටවල් ගත්තොත් ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර අපේ රට උඩින්ම ඉන්නේ. හැබැයි මාතෘ මරණවලින් අපේ රටේ එහෙමම නැහැ. මාතෘ මරණ සංඛ්‍යාව ලක්ෂයකට තිස්තුනක් වෙනවා. දරුවන් ලක්ෂයක් උපදිනකොට අම්මලා තිස්තුනක් මැරෙනවා. අපේ රටේ යම් විධියකට සෞඛ්‍ය පැත්තෙන් ළදරු මරණ සංඛ්‍යාව අඩු වී තිබෙන්නේ උගත් අම්මලා ඉන්න නිසයි. කොච්චර දේවල් නොමිලයේ දුන්නත් උගත්කම නැත්නම් - කාන්තා උගත්කම නැතිනම්- අපට ප්‍රතිශක්තිකරණ පැත්තෙන්වත් ඉහළට එන්න බැහැ. හොඳම උදාහරණය වතුකරයයි. වතුකරය හුඟක් දුප්පත්. අධ්‍යාපන පහසුකම් අඩුයි. එම නිසා ඒ අම්මලා ඉගෙන ගෙන ඉහළට එන්නේ නැහැ. එම නිසා වතුකරයේ සෞඛ්‍ය නිර්ණායක ගත්තොත් ඔක්කොම පහළින් තිබෙන්නේ. එම නිසා කාන්තාවන්ගේ උගත්කමයි රටේ සෞඛ්‍යයයි සියයට සියයක් සමානයි, එය සියයට සියයක්ම අදාළයි කියා මට කියන්න පුළුවන්.

### දිවා සුරැකුම් පද්ධතියක්

මේ සම්බන්ධයෙන් යෝජනා දෙක තුනක් දක්වන්නට කැමතියි. අපේ රටේ සරසවිවල සියයට 73ක් ඉන්නේ ගැහැනු ළමයින්. ඒක හොඳයි. වයස අවුරුදු තිහ තිස්පහ වෙනකොට අපිට පේනවා රාජ්‍ය අංශයේ වෙන්න පුළුවන්, පෞද්ගලික අංශයේ වෙන්න පුළුවන් කාන්තා සහභාගිත්වය හුඟක් වැඩියි. ඔබතුමා බලන්න වයස අවුරුදු තිස් පහෙන් පස්සේ මොකද වෙන්නේ කියා. මේ පාර්ලිමේන්තුවේ පවා, අවුරුදු තිස්පහෙන් පස්සෙ මොකද වෙන්නේ? වයස තිස්පහෙන් පස්සේ ඒ කාන්තාවට තනිකරම දරුවන් හදා වඩා ගැනීමේ කාර්යය පැවරෙනවා. එම නිසා ඔවුන්ගේ වෘත්තීය අනාගතය ඒ සඳහා කැප කරන්න වෙනවා. අද ලංකාවේත්, ලෝකයේත් තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි දරුවන්ගේ වගකීම කාන්තාවන්ට භාර දී තිබීම නිසා කාන්තාවන්ට වෘත්තීයෙන් ඉහළට යන්නට නොහැකි වීම. ඒක තාත්තලාට කරන්නටත් බැහැ. අම්මායි, තාත්තායි සම සමව මේ කටයුතු කරන්න ඕනෑය කියන පිළිගැනීම තිබුණත්, තාත්තා ඉන්නේත් ආර්ථික යුද්ධයක. එම නිසා අපි කියන්නේ ලොකු දේවල් කරන්න කලින්, කාන්තාවන් සියයකට වැඩියෙන් වැඩකරන සෑම රාජ්‍ය ආයතනයකම, සෑම පෞද්ගලික ආයතනයකම අනිවාර්යයෙන්ම රජයෙන් -රජයේ යම් කිසි දායකත්වයක් ඇතිව, පෞද්ගලිකව වුණත් ප්‍රශ්නයක් නැහැ- දිවා සුරැකුම් මධ්‍යස්ථාන පද්ධතියක් හරියාකාරව හදන්න ආණ්ඩුවෙන් නීතියක් ගේන්න.

North Korea සම්බන්ධව විවිධ මත තිබෙනවා. නමුත් ලෝකයේ හොඳම Day care system එක තිබෙන්නේ North Koreaවලයි. ලෝකයේ North Korea වාගේ රටක් ගත්තත්, යුරෝපය ගත්තත් ඉතාම ඉහළ මට්ටමේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පද්ධතියකින් තමයි ඒ තත්වය අවම කරගෙන තිබෙන්නේ. එතකොට දරුවාගේ ආරක්ෂාව සහ අනෙකුත් දේවල් සම්බන්ධයෙන් අම්මාට ප්‍රශ්නයක් නැහැ. මේක නිකම් බොහොම සරල දෙයක් වාගේ පෙනුණාට මේ ප්‍රශ්නයට මුහුණ දෙන සාමාන්‍යයෙන් මධ්‍යම පන්තික, පහළ මධ්‍යම පන්තික, අම්මයි තාත්තයි දරුවොයි ඉන්න ගෙදරකින් අහලා බලන්න; එවැනි ගෙදරකින් සොයලා බලන්න. මේ ප්‍රශ්නය නිසා ඒ කාන්තාවන් සුවිශාල පීඩනයක් විඳිනවා. ඔවුන්ගේ වෘත්තීය අනාගතය, අධ්‍යාපනය ආදී හැම දෙයක්ම දරුවන් වෙනුවෙන් කැප කරනවා.

අපේ රටේ වැඩ කරන කාන්තාවෝ ගත්තොත් රැකියා තුනක් කරන බව දන්නවා ඇති. උදේ 4.00 ඉඳලා 6.30වන තෙක් එක රක්ෂාවක් කරනවා. උයනවා. පිහනවා. ගෙදර ඔක්කොම වැඩ කරනවා. ඊට පස්සේ ආර්ථිකයට දායක වෙන්න රක්ෂාවට -job එකට- යනවා. ඒක ඉවර කරලා රෑ හතට, අටට ගෙදර යනවා. ඊට පස්සේ නැවතත් ගෘහමය කටයුතුත්, දරුවන්ගේ අධ්‍යාපන කටයුතුත් ඔක්කොම කරනවා. ඈය jobs තුනක් කරනවා. ලෝකයේ පළමුවැනි වහලිය බිරිඳ. ඒ නිසා අපි කියන්නේ මේක industry එකක් බවට පත් කරන්න කියලායි. ඒකට රජයෙන් උදවු කරන්න. Private sector එකටත් කථා කරලා day care centres පටන් ගන්නා ආයතනවලට යම් කිසි මිලක් සහ ප්‍රමිතියක් හඳුන්වා දීලා ඔබතුමන්ලා ඒ අයට සහනයක් දෙන්න. day care centres industry එකට යනවා නම් අපි මේ විධියට උදවු කරනවා කියන්න. රජයෙනුත් කිහිපයක් කරන්න.

දෙවැනි කරුණත් ඒකටම අදාළයි. ගබ්සා නීතිය සම්බන්ධ කාරණාව දැන් අපේ රට තුළ යම් කිසි දුරකට සාකච්ඡාවට ලක් වෙලා තිබෙනවා. මේ සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශයත් යම් දෙයක් කර ගෙන යනවා. අපේ දැනීමේ හැටියට ගබ්සා නීතිය ආරම්භ කර තිබෙන්නේ 1883 දීයි. ලංකාවේ එක එක ගණන් ඉලක්කම් කියනවා; 3000, 4000 ගබ්සා කරනවා කියලා ගොඩක් අය දන්නවා.

### කාන්තාවට ඇඟෙහි අයිතිය

අපේ රටේ ගබ්සා නීතිය ගොඩක් පරණයි. ඒ නිසා ඒක වෙනස් කරන්න ඕනෑ. අද තිබෙන නීතිය අනුව අපි දකින දේ තමයි, දැරිවියක් දූෂණයට ලක් වෙලා දරුවෙක් හැදුණත් ඒ දැරිවියට ඒ කලලය අයින් කරන්න අයිතිය නැහැ. එහෙම නැත්නම් ලෙඩ රෝගයක් තිබුණත් ඒක කරන්න බැහැ. මේක ඉතාම වැරදි අදහසක්. ඒක කරන්න බැහැයි කියලා තමයි මේ රට හිතාගෙන ඉන්නේ. කාන්තාව කියන්නේත් මනුස්සයෙක්. එයාගේ ඇඟ කුලියට දෙන තැනක් නොවෙයි. අකමැත්තෙන් ඇගේ පච්චයක් කොටනවාට කෙනෙක් කැමැතිද? අකමැත්තෙන් ඇගේ පච්චයක් කොටනවාට මම කැමැති නැහැ. අපි අකමැති විධියට කොණ්ඩය කපනවාටවත් අපි කමැති නැහැ. හැබැයි, කාන්තාවන්ට කියනවා තමන් අකමැති සිද්ධියකින් ලැබුණ දරුවෙක් දරා ගෙන හිටපන් කියලා. ඇඟ කියන්නේ මනුස්සයිනට අයිති දෙයක්. ඇඟ තීන්දු කරන්න ඕනෑ, ඒ ඇඟ අයිති මනුස්සයායි. අපි කියන්නේ මාස නවයක් ගත වුණු කලල විනාශ කරන්න කියලා නොවෙයි. අපි ඉල්ලා සිටිනවා කාන්තාවන්ට ඒ අයිතිය ලබා දෙන්න කියලා. කාන්තාව ඉපදිලා තිබෙන්නේ දරුවෝ වදන්න හදන්න පමණක් නොවෙයි. ඈයට වෘත්තීය ජීවිතයක් තිබෙනවා. ඈයට සමාජ ජීවිතයක් තිබෙනවා.

## යහපත් සමාජයක් වෙනුවෙන්...

03 පිටුවෙන්



ලෝකෙ වටේ යමින් කියනවා ඩොලර් අරන් මෙහෙට ඇවිත් කර්මාන්ත, ගොවිපොලවල්, සේවා ආයතන පටන් අරන් කොල්ලන්ට කෙල්ලන්ට රස්සා දීලා ඩොලර් අපිට දෙන්නලු.

මේ හැම ප්‍රකාශයකින්ම හැම දේකින්ම ඉතාම පැහැදිලියි රට බංකොලොත් කරගෙන ඉවරවෙලා දැන් විදෙස් කොම්පැනිවලට රට බාරදෙමින් තිබෙන බව. මේ බංකොලොත්කම කෙළවර වෙන්නෙ එක එක රටවල කොම්පැනි අපේ රටේ ජනතාවගෙ ශ්‍රමය සූරාකෑමෙනුත් රටේ සම්පත් කොල්ලකෑමෙනුත්. එදා සුද්දා තුවක්කුවෙන් රට යටත්කරගෙන සුද්දන්ගේ කොම්පැනි මගින් කරගත්ත දේ අද කළු සුද්දන් මගින් කරගන්නවා. අවසානයේ දේශපාලන වශයෙනුත් ආර්ථික වශයෙනුත් සංස්කෘතික හා සමාජමය වශයෙනුත් අපි යටත් ජාතියක් බවට පත්වෙනවා.

***නියමුවා:- 2020 ඉලක්ක කරගත් පක්ෂයේ වැඩපිළිවෙළට අදාළව වෘත්තීය සමිති ව්‍යාපාරයේ මැදිහත්වීම කෙබඳුද?***

***ලාල්කාන්ත සහෝදරයා:-*** මේ ආණ්ඩුව ජනතාවගේ අතේ තියෙන මුදල් ඇදලා ගන්නවා. එතකොට ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව අඩුවෙනවා. පරිප්පු කිලෝ එකක් ගන්න කෙනා පරිප්පු පන්සීයක් ගන්න කෙනෙක් වුණාම පරිප්පු ගෙන්නන්න ගිය ඩොලර්වලින් දෙකෙන් පංගුවක් ඉතිරිවෙනවා. එතකොට ජනතාවයි ආණ්ඩුවයි එකිනෙකට විරුද්ධව සටන් කරනවා. ඒ වගේම රුපියල බාල්දු කරලා ඩොලර් එකක් වෙනුවෙන් වැඩි රුපියල් ගාණක් ගෙවන්න වෙනකොට ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව අඩුවෙනවා. එතකොටත් ඩොලර් ඉතිරි වෙනවා. නමුත් ජනතාවට බඩු මිල ඉහළ යනවා.

ස්ථිර ආදායම්ලාභීන් වන වැටුපෙන් පමණක් ජීවත්වෙන වැඩකරන ජනතාවට සිද්ධ වෙනවා ආණ්ඩුවට විරුද්ධව සටන් කරන්න. අපි ඒ සටනට වෘත්තීය සමිති ව්‍යාපාරයක් හැටියට නායකත්වය දෙමින් ඉන්නවා. වැඩකරන ජනතාවගේ ද්‍රෝහීන්ට විරුද්ධව සටන් කිරීමත් එම සටනේ නායකත්වය අරගෙන 2020දී පොදුජන ආණ්ඩුවක් හදන්න පක්ෂයටත් ඒ වටා පෙළගැහෙන බලවේගවලටත් දැවැන්ත ශක්තියක්වීම අරමුණු කරගෙනයි අපි වැඩකරගෙන යන්නෙ.

මෑත කාලෙ අපි වැඩ ගොඩක් කළා. විදුලිබල මණ්ඩලයේ මෑන් පවර් සේවකයින් 7000ක් ස්ථිර කරවා ගත්තා. කොළඹ වරායෙ නැගෙනහිර ජැටිය විකිණීම සටන් මගින් තාමත් නවත්වාගෙන ඉන්නවා. වෘත්තීය සමිති ව්‍යාපාරයේ සටන් නිසා අඩු වැටුපට ඉන්දියාවෙන් ශ්‍රමිකයො ගෙන්වන්න ආණ්ඩුවට තාම බැරිවුණා. පක්ෂයේ වැඩපිළිවෙළත් සමග මේ සටන් අපි සම්බන්ධ කරලා තියෙන්නේ. වැඩකරන ජනතාව අද වෙනකොට වෙනසක් වෙනුවෙන් අප වටා එකතුවෙමින් ඉන්නවා.

***නියමුවා :- එළඹෙන ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීමට බොහෝ දේශපාලන පක්ෂ සූදානම් වනවා. මේ පිළිබඳව ඔබ දකින්නේ කෙසේද?***

***ලාල්කාන්ත සහෝදරයා:-*** පළමුවෙන්ම මේ පක්ෂවලට අපි කියන්න ඕනැ, අපේ කම්කරු දිනය ඔහෙලා ගාව තිබුණා ඇති, දැන්වත් වැඩකරන ජනතාවගේ දිනය වැඩකරන ජනතාවට දීපල්ලා කියලා. ජාත්‍යන්තර කම්කරු දිනයට පාටක් තියෙනවා. ඒ තමයි රතු පාට. වෙන කිසිම පාටක් කම්කරු දින සැමරුමට පාවිච්චි නොකළ යුතුයි. කම්කරු පංතියට කොඩියක් තියෙනවා. ඒ තමයි රතුපාට පසුබිමේ දෑකැත්තයි මිටියයි සහිත කොඩිය. කොළ පාට කොඩියෙ අලිය නෙමෙයි ලකුණ. නිල් පාට කොඩියේ අත නෙමෙයි ලකුණ. රතු පාට කොඩියේ සීනුවත් නෙමෙයි ලකුණ.

විශේෂයෙන් අපි එ.ජා.ප.යේ, ශ්‍රීල.නි.ප.යේ නායකයින්ට කියනවා, එයාලගෙ ධන තණ්හාව වෙනුවෙන් බල තණ්හාව වෙනුවෙන් මැයි දිනය විනාශ කරන්න එපා කියලා. වැඩකරන ජනතාවගෙන් ඉල්ලනවා, දෑකැත්ත මිටිය සහිත අපේ රතු කොඩිය එක්ක එකතු වෙන්න කියලා. වෙසක් දිනය සමරන්නෙ නිල් කොඩි, කොළ කොඩිය දාලා නෙමෙයි. බෞද්ධ කොඩිය දාලා. ඒ වගේම කම්කරු දිනයටත් අදාළ දේවල් තියෙනවා. දිනපතාම වැඩකරන ජනතාව තලා පෙලන අයට කොහොමත්ම මැයි දිනයේ අයිතියක් නැහැ. වැඩකරන ජනතාවට දිනාගන්න ලෝකයක් තියෙනවා. මේ ලෝකෙ දැන් ධනපතියන්ගේ ලෝකයක්. ලෝකය වැඩකරන ජනතාවගේ කරගන්න. එන්න අපිත් එක්ක එකතුවෙලා සටන් කරන්න.

## මහරැජිනට...

12 පිටුවෙන්

අරගලය පරාජය වුවද පසු කලෙක වහල් ක්‍රමය බිඳවැටීමට එකී අරගලය දායක විය. ඉතිහාසය ගමන් කරන්නේ එසේය. 1971 අරගලය දෙස බැලිය යුත්තේද එසේය.

සිය කොමියුනිස්ට් ප්‍රකාශනයේ ආරම්භයේදීම මාක්ස් - එංගල්ස් මෙසේ පවසා තිබේ. "**මෙතෙක් පැවති සියලු සමාජවල ඉතිහාසය පංති අරගලවල ඉතිහාසය වේ.**

**නිදහස් මිනිසා සහ වහලාද, රෝම කුලීනයා සහ රෝම පොදු ජනයාද, රදලයා සහ ප්‍රවේණිදාසයාද, ශ්‍රේණි හිමියා සහ ජ්‍යෙෂ්ඨ ආධුනිකයාද, වචනයකින් පැහැදිලි කළහොත් පීඩකයා සහ පීඩිතයා එකිනෙකාට විරුද්ධව නියත ලෙස නැගී සිට, වරෙක සැඟවුණාවූද, වරෙක විවෘතවූද සටනක්, එක්කෝ මුළුමහත් සමාජයම විප්ලවාදී ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙන් අවසන් වූ, නැතිනම් සටන්කරන පංතීන්ගේ පොදු විනාශයෙන් අවසන්වූ සටනක් නොකඩවාම කරගෙන ගියහ.**" ඒ අනුව ලොව ලිඛිත ඉතිහාසය යනු, ලොව තුළ පංති බිහිවීමෙන් පසු ඇරඹි ඉතිහාසය යනු පංති සටන්වල ඉතිහාසය වේ. 71 අරගලයද එකී පංති සටන් ඉතිහාසයේ ලාංකේය පංති සටන් ඉතිහාසය තුළ නොමැකෙන සටහන් තැබූ සටනක් විය.

ලංකාවේ නව යටත්විජිතවාදී, බ්‍රිතාන්‍ය මහ රැජිනට ගැටගසා තිබූ පසුගාමී සංවර්ධනයක් සහිත බෙලහීන ධනපති ක්‍රමය වෙනස්කර සැබෑ නිදහස, සමාජ සාධාරණය, ගෙන ආ හැකි නව සමාජවාදී සමාජයක් ගොඩ නැගීම අරමුණු කර ගනිමින් 1965 දී බිහිවූ ජනතා විමුක්ති පෙරමුණ ධනපති පංතියේ මර්දනය හමුවේ දේශපාලනය කිරීමේ තම අයිතිය වෙනුවෙන් දැක්වූ ප්‍රතිචාරය 1971 අරගලය ලෙස ප්‍රකාශයට පත් වූ බව පැහැදිලිය. 71 අරගලය දෙස සතුරු ආකල්පයකින් බලන අයට මෙන්ම, හාන්සිපුටුවල සිට විප්ලවයට උපදෙස් දෙන අයටද අරගලයේ අඩුපාඩු ගැන බොහෝ දේ කිව හැකිය. එහෙත් ඒ කිසිවකින් 71 අරගලයේ ශ්‍රේෂ්ඨත්වය අඩු වන්නේ නැත. පීඩාව ඉවසා සිටිනවා වෙනුවට ඊට එරෙහිවත් පැරණි බංකොලොත් සමාජය තුළ ජීවත් වනවා වෙනුවට, එය වෙනස් කර නව සමාජයක් බිහිකිරීම සඳහාත් යම් කිසි පරපුරක් සටන් මඟ තෝරා ගන්නේ නම්, පෞද්ගලික අරමුණු වෙනුවට පොදු අරමුණකින් සටන් කරන්නේ නම්, එම සටනේදී නිර්භීතව දිවි පුදන්නේ නම්, එවන් මිනිසුන් සැබෑ වීරයන් වන අතර, එවන් දේශපාලන ව්‍යාපාරයක් සැබෑ දේශපාලන ව්‍යාපාරයක්, සැබෑ ජනතා ව්‍යාපාරයක්ද වේ. 1971 පරපුර එම වීරත්වය පෙන්වූ පරපුරක් විය. ඊට මඟ පෙන්වූ ජ.වි.පෙ. සැබෑ ජනතාවාදී දේශපාලන ව්‍යාපාරයක්ද විය. අරගලයේදී සතුරා ඉදිරියේ දණින් නොවැටී වීරත්වයෙන් මරණයට මුහුණදුන් නමින් අප දන්නා හා නොදන්නා බොහෝ දෙනා සනාථ කළේ එම සත්‍යයය.

කවුරු කෙසේ මොනවා කීවද මෙම අරගලයේත් එයට දායක වූවන් සාතිශය බහුතරයකගේත් අරමුණ වූයේ, අභිප්‍රාය වූයේ පෞද්ගලික අරමුණු නොව ලාංකේය සමාජවාදී විප්ලවයයි. ඔවුන් සටන් වැදුනේත් දිවිපිදුවේත් එම උතුම් පරමාදර්ශය වෙනුවෙනි. වර්තමානයේ අප 71 අරගලය දෙස බැලිය යුත්තේ, ඉන් අත්දැකීම්, ධෛර්යය, කැපවීමේ හා පරිත්‍යාගයේ ආදර්ශය උකහාගත යුත්තේත් ලාංකේය සමාජවාදී පරිවර්තනය සඳහා ඒවා උපයෝගී කර ගැනීමේ අර්ථයෙනි. මන්ද 71 පොදු සමාජය අරමුණක් වෙනුවෙන් සටන්වැද දිවි පිදූවන්ට කළ හැකි එකම උපහාරය ඔවුන් පැතූ එම සමාජය බිහිකිරීම වන නිසාය.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com





ජාත්‍යන්තර කාන්තා දිනය සමරා...




තරුණ ප්‍රශ්න විසඳන ලෙස බලකරමින්...




කැනඩාවේ ශ්‍රීලාංකිකයන් හමුවී...




යුරෝපා නායක හමුවට එරෙහිව ඉතාලියේදී...



"එතර අපි" වෙනුවෙන් කැනඩාවේදී...




ජෝන් ද සිල්වා සමරු රඟහල විකිණීමට එරෙහිව...

# ඇමරිකානු ආරක්ෂක ගිවිසුම නැවත දීර්ඝ කිරීමට ඉඩ දිය යුතු නැහැ

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**

වසර 10කට පෙර රාජපක්ෂ ආණ්ඩුව විසින් අත්සන් තබන ලද ඇමරිකා එක්සත් ජනපද - ශ්‍රී ලංකා ආරක්ෂක ගිවිසුම නැවත දීර්ඝ කිරීමට වත්මන් ආණ්ඩුව සූදානම් වන බවට අනතුරු ඇඟවූ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, රටට ආදරය කරන සියලු බලවේගවල අවධානය මෙම ආරක්ෂක ගිවිසුම සම්බන්ධව යොමු විය යුතු බවත් රටට අහිතකර එම ගිවිසුම නැවත දීර්ඝ කිරීමට ඉඩ ලබා නොදිය යුතු බවත් අවධාරණය කළේය.

ටිල්වින් සහෝදරයා මෙම අදහස් පළ කළේ, පසුගිය 05වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවක් අමතමිනි.

"ආණ්ඩුවත් ආරක්ෂක අමාත්‍යාංශයත් මේ ගිවිසුම පිළිබඳව ස්ථාවරය රටට කිව යුතුයි. මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් මතුවෙලා තිබෙන බව අපිට වාර්තා වෙලා තිබෙනවා. ආණ්ඩුව මෙය නොසලකා හරිනවා නම් ඊට එරෙහිව ප්‍රබල ජනමතයක් ඇති කිරීමට ජනතා විමුක්ති පෙරමුණ සියලු ක්‍රියාමාර්ග ගන්නවා. මෙම ආරක්ෂක ගිවිසුම පිළිබඳව සාකච්ඡාවක් ඇති වෙලා නැහැ. නමුත් අපේ රටට මෙම ගිවිසුමෙන් හානියක් තිබෙනවා. මේ ආණ්ඩුව ඒ වැරැද්ද නැවතත් කළ යුතු නැහැ. අපි රටක් විදිහට තවත් රටකට යටත් විය යුතු නැහැ. ඒ වගේම අනෙකුත් රටවල් තරහ කරගත යුතු නැහැ. එනිසා මෙවැනි ගිවිසුම් අත්සන්



කිරීමෙන් අපේ රටට අහිතකර තත්වයක් ඇති කරනවා." ටිල්වින් සිල්වා සහෝදරයා වැඩිදුරටත් පැවසීය.

මේ අවස්ථාවට ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික පළාත් සභා මන්ත්‍රී ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයාද සහභාගි විය.

# විදෙස් ගත වන ශ්‍රමිකයින් රන් බඩු උගස් කර ගෙවූ සල්ලි ඇමතිවරු පිල්ලි ඇරලා

**එතෙර අපි සංවිධානයේ සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**



විගණකාධිපති වාර්තාවක් මගින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ රු. ලක්ෂ 1597කට වැඩි මුදල් අක්‍රමිකතා ප්‍රමාණයක් හෙළිදරව් කර තිබෙන නමුත් ආණ්ඩුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව පෙන්වා දුන් එතෙර අපි සංවිධානයේ සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, අදාළ ඇමතිවරයා වත්මන් ආණ්ඩුවේද ඇමතිවරයෙක් බැවින් දූෂණයන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවට ආණ්ඩුවට චෝදනා කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 16වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද එතෙර අපි සංවිධානයේ මාධ්‍ය හමුවකදීය.

"මෙතරම් මුදලක් පාඩු කළ ඇමතිවරයා එෆ්.සී.අයි.ඩීයට හෝ සී.අයි.ඩී.යට කැඳවලා නැහැ. ඔහු විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණානම් ඔහුට එරෙහිව පරීක්ෂණ කරනවා. විදේශිකයන්ගේ සුභසාධනය වෙනුවෙන් විදේශගත ශ්‍රමිකයන් විසින් ලබාදුන් අරමුදල් තමයි මේ විදිහට නාස්ති කරලා තිබෙන්නේ. මේ සමස්ත වියදම්වල එකතුව රු.ලක්ෂ 1597කට වැඩියි.

ඒ වගේම මතභේදයට තුඩුදුන් තවත් වියදම් ප්‍රමාණයක් විගණන වාර්තාවේ සඳහන් වෙනවා. 2014.04.27 සහ 29 දිනවලදී ගම්පහ සහ කොළඹදී පැවැත්වුණු පා ගමනක් යැයි සඳහන් කරමින් ආහාර පාන සැපයීම සඳහා රු. 2,854,000ක්ද ටීෂර්ට් හා තොප්පි මිලදී ගැනීම වෙනුවෙන් 3627,000ක්ද සහ තවත් වියදම් වෙනුවෙන් රු. ලක්ෂ 7,406,304ක් රට විරු සුභසාධන අරමුදලින් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබෙනවා. ආහාර සැපයුම් ආයතනයේ සැපයුම් ආයතනයේ ප්‍රකාශයට අනුව පැහැදිලි වෙනවා පා ගමනක් පැවැත්විලා නැහැ කියලා. ඉන්වොයිස් එකක් ඉදිරිපත් කරලා මුදල් ලබාගෙන තිබෙනවා.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුදල් මුළුමනින්ම දේශපාලනික කටයුතුවලට යොදවලා තිබෙනවා. විදේශගතවන ශ්‍රී ලාංකිකයින් තමන්ගේ ගේ උගස් කරලා, මාල වළලු උගස් කරලා කාර්යාංශයට ගෙවපු සල්ලි තමයි මේ විදිහට නාස්ති කරන්නේ. මැදපෙරදිග යන සියලු දෙනාගෙන් රු. 17,000 බැගින් කාර්යාංශයෙන් අයකර ගන්නවා. කොරියාවේ සේවය කරලා නිවාඩුවකට ලංකාවට ඇවිත් කොරියාවේම වෙන රැකියාවකට යන ශ්‍රී ලාංකිකයින්ගෙන් අමතරව රු. 10,000ක ගාස්තුවක් අයකර ගන්නවා. ඒ විතරක් නෙවෙයි, විදේශ රැකියාවකට යන සෑම පුද්ගලයෙක්ම ගුවන්ගත වීමේ ගාස්තු වශයෙන් ඩොලර් 50ක් අය කරන්න ආණ්ඩුව තීරණය කරලා තිබෙනවා. මේ විදිහට අය කර ගන්න මුදල් තමයි මේ විෂය භාර ඇමතිවරු අවභාවිත කොට තිබෙන්නේ. ඒ නිසා ආණ්ඩුවට අපි අවධාරණය කරනවා මුදල් ගසා කාපු වංචාකාරයින් හංගන්න උත්සාහ කරන්නේ නැතිව හොරුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කළ යුතුයි කියලා."

# තරුණ ප්‍රශ්නවලට විසඳුම් ගන්න අරගලයකට සූදානම් වෙන්න

**සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා**

ආණ්ඩුවේ මැති ඇමතිවරුන් බිහිරි හා අන්ධ අලි මෙන් වී ඇති බවට චෝදනා කළ සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, බිහිරි අලින්ට ඇසීමට විශාල හඬක් අවශ්‍ය වන බැවින් තරුණ තරුණියන්ගේ දැවෙන ප්‍රශ්නවලට විසඳුම් ලබාදෙන ලෙසට බල කරමින් උද්ඝෝෂණ ක්‍රියාමාර්ග ගැනීමට සමාජවාදී තරුණ සංගමය තීරණය කොට ඇති බව ප්‍රකාශ කළේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 01වැනි දින සමාජවාදී තරුණ සංගමය විසින් ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ එරංග සහෝදරයා මෙසේද කීය.

"තරුණ සංගමයේ උද්ඝෝෂණ මාලාව මාර්තු 05වැනිදා තංගල්ලෙන් පටන් ගන්නවා. විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබාදෙන ලෙසත් විරැකියාවෙන් සිටින තරුණ තරුණියන්ට දීමනාවක් ලබාදෙන ලෙසත් බාහිර උපාධිය අහෝසි නොකරන ලෙසත් රාජ්‍ය විශ්වවිද්‍යාල ස්ථාපිත කොට අධ්‍යාපනය පුළුල් කරන ලෙසත් ෆුල්ෆේස් හෙල්මට් තහනම ඉවත් කරන ලෙසත් සයිටම් උපාධි කඩය වහා අහෝසි කරන ලෙසත් මේ ආණ්ඩුවට බලපෑම් කරමින් මෙම උද්ඝෝෂණ මාලාව දියත් කරනවා.

සමාජවාදී තරුණ සංගමය ලෙස අපි රටේ සියලුම තරුණ තරුණියන්ටත් බහුජන සංවිධානවලටත් විවෘත ආරාධනයක් කරනවා, රටේ තරුණ තරුණියන්ගේ ප්‍රශ්න වෙනුවෙන් විසඳුම් ලබාගැනීම සඳහා අරගලයකට සූදානම් වෙන්න කියලා."

මෙම මාධ්‍ය සාකච්ඡාවට සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික



සංජය විශ්වනාත් සහ නදීකා හේමමාලි යන සහෝදර සහෝදරියෝද එක්ව සිටියහ.










බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.